# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## *WESTERN PROVINCE PROVINCIAL COUNCIL*

**2018** පෙබරවාරි **20** වන අඟහරුවාදා
2018 மாசி 20 செவ்வாய்க் கிழமை
Tuesday 20th February 2018

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஶ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09. 40 ට පළාත් සභාව රැස් විය.**
*மு.ப. 09.40 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.40 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# සභාපතිවරයාගේ නිවේදන
## ANNOUNCEMENTS OF CHAIRMAN

*i*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"මංජුල ප්‍රසන්න සම්පත් ගරු මන්ත්‍රීතුමා පළාත් සභා මන්ත්‍රී ධූරයෙන් ඉල්ලා අස්වීම හේතුකොට ගෙන ඇති වූ මන්ත්‍රී ධූර පුරප්පාඩුව සඳහා ගරු උතුවන්පතිරන්නැහැලාගේ චන්ද්‍රසෝම සරණලාල් මැතිතුමාද, රොයිස් විජිත ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමා පළාත් සභා මන්ත්‍රී ධූරයෙන් ඉල්ලා අස්වීම හේතු කොට ගෙන ඇති වූ මන්ත්‍රී ධූර පුරප්පාඩුව සඳහා ගරු කිත්සිරි මංචනායක මැතිතුමාද ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා පළාත් සභා මන්ත්‍රීවරුන් ලෙස තේරී පත් වී ඇති බව පිළිවෙළින් අංක 2055/33 හා 2018.01.24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් හා අංක 2058/27 හා 2018.02.14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් මැතිවරණ කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කර තිබෙනවා.*

*ඒ අනුව, චන්ද්‍රසෝම සරණලාල් ගරු මන්ත්‍රීතුමා 2018.01.25 දින ද, කිත්සිරි මංචනායක ගරු මන්ත්‍රීතුමා 2018.02.16 දින ද මා ඉදිරිපිටදී බස්නාහිර පළාතේ පළාත් සභාවේ මන්ත්‍රීවරුන් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව නිල ප්‍රතිඥාව දීම සිදු කර තිබෙනවා."*

*අභිනවයෙන් තේරී පත් වූ ගරු චන්ද්‍රසෝම සරණලාල් මන්ත්‍රීතුමාට මම ගෞරවයෙන් ආරාධනා කරනවා, මෙම සභාවට පැමිණ අසුන් ගන්නා ලෙසට.*

***අනතුරුව, අභිනව ගරු මන්ත්‍රීතුමා [චන්ද්‍රසෝම සරණලාල් මහතා] සභා ගර්භයේ අසුන් ගන්නා ලදී.***
*Subsequently, the newly appointed Member [Mr. Chandrasoma Saranalal] took his seat in the Council Chamber.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම අවස්ථාවේ චන්ද්‍රසෝම සරණලාල් ගරු මන්ත්‍රීතුමා සභාවේ අසුන් ගත්තා. කිත්සිරි මංචනායක ගරු මන්ත්‍රීතුමා තව ටික වෙලාවකින් සභාවට පැමිණෙන බව මට දැනුම් දී තිබෙනවා. ඒ නිසා මේ අවස්ථාවේදී අභිනවයෙන් තේරී පත් වූ චන්ද්‍රසෝම සරණලාල් ගරු මන්ත්‍රීතුමා පළාත් සභාව නියෝජනය කරපු ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක්. ඒ නිසා මම මේ අවස්ථාවේදී එතුමාට සුභ පතනවා. මගේත්, බස්නාහිර පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලයේත්, ගරු විපක්ෂ නායකතුමා ඇතුළු සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගේත් සුභපැතුම් මම මේ අවස්ථාවේදී ඔබතුමාට පිරිනමනවා.

*ii*

*"උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමාට ඇති වූ පාදයක ආබාධයක් හේතු කොට ගෙන වූ අපහසුතාවයන් නිසා, පළාත් සභා රැස්වීමට රෝද පුටුවක් උපයෝගී කර ගෙන පැමිණීමටත්, ආසනය සුදුසු පරිදි සකසා දෙන මෙන් ද ලිඛිතව ඉල්ලීමක් කර තිබෙනවා. ඒ අනුව එතුමාට ඊට අවසරය ලබා දෙනවා. එතුමාට අවශ්‍ය සහයෝගය කාර්ය මණ්ඩලය මගින් මෙන්ම එතුමාගේ ආසන්නයේම සිටින ගරු මන්ත්‍රීවරුන්ගෙන් ද ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරනවා."*

*iii*

*උපදේශක කාරක සභා සඳහා පත් කිරීම් :*

*"මංජුල ප්‍රසන්න සම්පත් ගරු මන්ත්‍රීතුමා සහ රොයිස් විජිත ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමා පළාත් සභා මන්ත්‍රීධුරයෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සාමාජික ධූර දෙකක ඇති වූ පුරප්පාඩු සඳහා 2018.02.16 දින සිට ක්‍රියාත්මක වන පරිදි යූ.පී. චන්ද්‍රසෝම සරණලාල් ගරු මන්ත්‍රීතුමාවත්, 2018.02.20 දින සිට ක්‍රියාත්මක වන පරිදි කිත්සිරි මංචනායක ගරු මන්ත්‍රීතුමාවත් ම' විසින් නම් කරන ලද බව දැනුම් දෙනවා.*

ඒ වාගේම මේ අවස්ථාවේදී කිත්සිරි මංචනායක ගරු මන්ත්‍රීතුමා බලාපොරොත්තු වෙනවා සභා ගර්භයට පිවිසීමට. ඒ අනුව මම එතුමාට ඉතාමත්ම ගෞරවයෙන් ආරාධනා කරනවා, සභා ගර්භයට පැමිණෙන ලෙසට.

***අනතුරුව, අභිනව ගරු මන්ත්‍රීතුමා [කිත්සිරි මංචනායක මහතා] සභා ගර්භයේ අසුන් ගන්නා ලදී.***

*Subsequently, the newly appointed Member [Mr. Kithsiri Manchanayake] took his seat in the Council Chamber.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී කිත්සිරි මංචනායක ගරු මන්ත්‍රීතුමා සභා ගර්භයේ අසුන් ගත්තා. මම එතුමාටත් ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලයේත්, ගරු විපක්ෂ නායකතුමා ඇතුළු සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගේත් සුභපැතුම් එක් කරනවා. එතුමාගේ දේශපාලන ජීවිතය ඉතාමත් සාර්ථක වෙන්නය කියලා මම ප්‍රාර්ථනා කරනවා.

*iv*

*අයවැය නිල [හැන්සාඩ්] වාර්තා :*

*"2018 වර්ෂය වෙනුවෙන් පැවති අයවැය විවාදයේ 2017 දෙසැම්බර් මස 05, 06 හා 07 යන දිනයන්හි නිල [හැන්සාඩ්] වාර්තා අද දින සභාගත කර ඇති බව ගරු ඔබතුමන්ලාට දැනුම් දෙනවා.*

# ලිපි ලේඛන පිළිගැන්වීම
# PAPERS PRESENTED

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Government and Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

ගරු සභාපතිතුමනි, *"බස්නාහිර පළාතේ ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය හා ඒ පිළිබඳ විගණකාධිපති වාර්තාවත්"* සහ, *"බස්නාහිර පළාතේ සංචාරක මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාවත්"* මම පිළිගන්වනවා.

***එකී විගණකාධිපති වාර්තාවන් පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවට යොමු කරන මෙන් ගරු සභාපතිතුමා විසින් ලේකම්වරයාට නියෝග කරන ලදී.***

*The Secretary was ordered by the Hon. Chairman to refer the aforesaid Auditor General's Reports to the Provincial Public Accounts Committee.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට ගරු අධ්‍යාපන අමාත්‍යතුමාට අවස්ථාව. එතුමා මේ අවස්ථාවේ සභා ගර්භයේ නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, *"බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශයන් පිළිබඳ විගණකාධිපති වාර්තාවන්"* සභාවට පිළිගන්වනවා.

***එකී විගණකාධිපති වාර්තාව පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවට යොමු කරන මෙන් ගරු සභාපතිතුමා විසින් ලේකම්වරයාට නියෝග කරන ලදී.***

*The Secretary was ordered by the Hon. Chairman to refer the aforesaid Auditor General's Report to the Provincial Public Accounts Committee.*

# කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ (විශේෂ විමර්ශණ) විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් වූ පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවේ වාර්තාව මම මෙම සභාවට පිළිගන්වනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පහත සඳහන් කාරක සභා රැස්වීම් වාර්තා මම ගරු ඔබතුමන්ලා වෙත පිළිගන්වනවා.

i. 2018.01.15 දින පැවති ප්‍රධාන පෙත්සම් කාරක සභා රැස්වීම් වාර්තාව සහ,

ii. 2018.01.24 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා වාර්තාව.

***අදාළ වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*The Hon. Chairman declared that the copies of the relevant reports are placed on the tables of the Hon. Members.*

# පෙත්සම්
## PETITIONS

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, හංවැල්ල, ඉහළ හංවැල්ල අංක 292/1 හි පදිංචි ජේ.ඒ.ඩී. නිමල් යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මීරිගම, විජයරජදහන, අංක 220 හි පදිංචි ඩබ්ලිව්.ඩබ්ලිව්.ජේ.ජී.එස්. චන්ද්‍රසේන යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම ඉදිරිපත් කරනවා.

i. අඟුරුවාතොට, අම්පිටිගල අංක 206 හි පදිංචි යූ.ඒ. දිවාකර සහ,

ii. උතුරු කළුතර, විලේගොඩ, ඉකිලියාදෙනිය වත්ත, 'චමරි' හි පදිංචි එම්.ඒ. මංජුල යන අයගේ පෙත්සම

**[සභා මේසය මත තබන ලද පෙත්සම]*
*[Tabled petition]*

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

පයාගල, ගබඩාගොඩ, අංක 138/A හි පදිංචි ඩී.එන්.කේ. විජේසූරිය යන අයගේ පෙත්සම.

***සියලු පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*All Petitions, ordered to refer to the Petitions committee.*

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. පසුගිය පළාත් පාලන මැතිවරණ කාල සීමාව තුළ ප්‍රාදේශීය සභා නගර සභා ගණනාවකටම ගරු ප්‍රධාන අමාත්‍යවරයාගේ ලිපි යටතේ ව්‍යාපෘති අනුමත කරලා, අපේක්ෂකයන්, පළාත් සභා මන්ත්‍රීවරුන් සහ එක් එක් අයගේ යටතේ යෝජනා ඇරලා තිබෙනවා. ගිය අවුරුද්දේ දින දාලා තමයි මේවා ඇරලා තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, මෙතැන ප්‍රධාන ලේකම්තුමා ඉන්නවා. ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්තුමිය ඉන්නවා. මේ ව්‍යාපෘති නවත්වන්න කියන්න. මේවා ප්‍රාදේශීය සභාවේ මුදල්. බස්නාහිර පළාතේ හැම ප්‍රාදේශීය සභාවකටම, නගර සභාවකටම, හැම එකකටම ලිපි යවලා තිබෙනවා. ලක්ෂ 20, ලක්ෂ 50, ලක්ෂ 60, ලක්ෂ 100 වශයෙන් හැම එකකටම. නැහැයි කියනවා නම්, ඒවා ඔක්කොම ඔප්පු කරන්න පුළුවන්. ඒ නිසා ගරු සභාපතිතුමනි, කරුණාකරලා කියන්න. මේක මැතිවරණය ඉලක්ක කර ගෙන, මැතිවරණය ජයග්‍රහණය කරන්න කරපු වැඩක්.

ඒක හොඳාකාරවම පේනවා. ඒ වාගේම අමාත්‍යාංශයේ ලේකම්තුමියන්ලාට, ලේකම්තුමන්ලාට මේ ලිපි ඇරලා, මේ ප්‍රාදේශීය සභා නගර සභා මුදල් ටික වියදම් කරලා කරන්න හදපු වැඩ ටික වහාම නවත්වන්නය කියන්න. මේක සෙල්ලමක් නොවෙයි. මොකද, මේ සභාවේ මුදල්. මේකේ පැහැදිලිව දාලා තිබෙනවා,

*"මහජන දිනවලදී මහජන නියෝජිතයින් සහ විවිධ සමිති සංවිධාන සහ මහජනතාව විසින් මා වෙත ඉදිරිපත් කර ඇති පහත සඳහන් පොදු මාර්ග සංවර්ධනය සඳහා ප්‍රාදේශීය සභාවේ පොදු අරමුදල් යොදවා සංවර්ධනය කර දීමට කටයුතු කර දෙන්න කියලා."*

කිසිම මහජන දිනයක කවුරුවත් ඇවිල්ලා නැහැ. අපි හොඳාකාරවම දන්නවා. පළාත් සභා මන්ත්‍රීවරු හැටියට මේකේ මන්ත්‍රීවරු 104 ක් ඉන්නවා. මේ 104 ම නියෝජනය කරන්නේ, බස්නාහිර පළාතේ ඉන්න සියලුම ප්‍රාදේශීය සභා නියෝජනය කරන ප්‍රදේශ. ඒ ප්‍රදේශවල මහජනතාව යම්කිසි ඉල්ලීමක් කරනවා නම්, ප්‍රාදේශීය සභා නැති අවස්ථාවක ඒ ඉල්ලීම ඇවිල්ලා තිබෙන්නේ අපට. පළාත් සභා මන්ත්‍රීවරු හැටියට. මේක අපේ හරහා එන්න ඕනෑ. මහජන නියෝජිතයෝ නැතිව කිසිම කෙනෙකු ඇවිල්ලා එහෙම ඉල්ලීම් කරලා දීලා නැහැ. පුළුවන් නම් ඔප්පු කරලා පෙන්වන්න කියන්න. මේ මැතිවරණය ඉලක්ක කර ගෙන කරපු වැඩ සටහන් ටික. අපි ඔබතුමාගෙන් වහාම ඉල්ලීමක් කරනවා. ප්‍රධාන ලේකම්තුමාත්, අමාත්‍යාංශ ලේකම්තුමියත් හරහා මේවා නවත්වන්න. මේ වියදම් කරන්නේ මහජන මුදල්. අයවැයක් ඉදිරිපත් කරන කොට ප්‍රාදේශීය සභාවකට, නගර සභාවකට අයවැයට මුදල් වෙන් කරන කොට වෙන් කරන ව්‍යාපෘති ඉදිරිපත් කරන්න මුදල් ඕනෑ. ඒ ව්‍යාපෘති සම්පූර්ණ පැත්තක දාලා, මේ අවුරුදු ගණනාවක් තිස්සේ තම තමුන්ට ඕනෑ ඒවා කර ගත්තා. හැබැයි, මහජන නියෝජිතයන්ගේ ඉල්ලීමට ඇහුම්කන් දුන්නාට කමක් නැහැ. මේ පළාත් සභාවේ මහජන නියෝජිතයින් ඉන්නවා. ඒ නිසා මේවා වහාම නවත්වන්න කියන්න. මොකද, මේවා දිගින් දිගට කරන්න ගියොත් එහෙම ලොකු ප්‍රශ්න ගණනාවක් ඇති වෙනවා. එහෙම වුණොත් මම ලබන පාර සභාවේදී සභාගත කරනවා, හැම ප්‍රාදේශීය සභාවකටම ගිය මුදල් ප්‍රමාණය. පළාත් සභාවෙන් මුදල් වෙන් කරලා තිබෙන්නේ කොහේටද? මොන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයටද? මොන ප්‍රාදේශීය සභාවටද? මොන ආයතන හරහාද වියදම් කරලා තිබෙන්නේ කියලා පෙන්වන්න ඉස්සෙල්ලා මේවා වහාම නවත්වන්න ඕනෑ. මොකද, අද මේ මුදල් ඇරියා කියලා දිනන්න බැරිව ගියා නේ? ඒක පැහැදිලියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය පැහැදිලියි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒ නිසා මේක මන්ත්‍රීවරුන්ට පොදුවේ කරන ලොකු අසාධාරණයක්. ප්‍රාදේශීය සභා නැති වෙලාවේ කරන ලොකු අසාධාරණයක්. ඒ නිසා මේක නවත්වන්න කියන්න.

**ගරු සුනිල් ජයමිණි**
Hon. Sunil Jayamini

ගරු සභාපතිතුමනි,මටත් වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, අභිනවයෙන් පත් වුණු මන්ත්‍රීවරු ඉන්නවා. චන්ද්‍රසෝම සරණලාල් ගරු මන්ත්‍රීතුමාට, ගරු පංචරත්නම් රාම් මන්ත්‍රීතුමාට සහ කිත්සිරි මංචනායක ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙන ලෙස මම ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම අවස්ථාව ලබා දෙනවා.

**ගරු සුනිල් ජයමිණි**
Hon. Sunil Jayamini

ගරු සභාපතිතුමනි, කැස්බෑව නගර සභාව සතු කෝටි 8 ක මුදලක් මහ ඇමතිතුමාගේ නියමය පරිදි සංවර්ධන කටයුතු සඳහා යොදවලා තිබෙනවා. කෝටි 8 ක්. ඊයෙත් පාරවල් හදනවා. ඊයේ පාර හදලා මුදල් ගන්නත් ඊයේම වවුචරය දානවා. මිනිස්සු ඡන්දය දීලා නගර සභාවට පත් වෙන

කොට නගර සභා ඔක්කොම හිඟන්නෝ වෙලා අවසානයි. මේක තනිකර දේශපාලන බලය පාවිච්චි කරලා, තමන්ගේ පළාත් සභා සල්ලි එහෙන් දැම්මා. කැස්බෑව නගර සභාවේ කෝටි 8 අරගෙන තිබෙන්නේ, උකසට. උකසට අරන් තිබෙන්නේ. නිකම් නොවෙයි. මුද්දර සල්ලියි, බදු මුදලුයි උකස් තියලා තමයි අරගෙන තිබෙන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, පළාත් පාලන ආයතනවල එක එක පුද්ගලයන්ට ඕනෑ විධියට කටයුතු කරන්න දෙනවා නම්, ඒක බරපතළ වරදක්. කෝටි 8 ක් පොදු අරමුදලින් අරගෙන තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හැබැයි, මම දැනුවත්ව මහ ඇමතිතුමා හැමෝටම වාගේ සල්ලි දුන්නා.

**ගරු සුනිල් ජයමිණි**
Hon. Sunil Jayamini

එකපාරට කෝටි 100 යි. ටෙන්ඩර් කිරීමක් නැහැ. කිසිම ටෙන්ඩරයක් නැහැ. ටෙන්ඩරය තුනට කඩලා දෙනවා. මේවා බලවත් අසාධාරණ වැඩ. ඒ නිසා වහාම මේ සම්බන්ධව තමුන්නාන්සේගේ අවධානය යොමු කරන්න. නැත්නම් අපට තීන්දුවක් ගන්න සිද්ධ වෙනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ජා - ඇළ නම් තිබෙන්නේ, ඔක්කොම මෙරිල් හදපුවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මෙරිල් මන්ත්‍රීතුමා -

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ගරු සභාපතිතුමනි, මීරිගම ප්‍රාදේශීය සභාවේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පැහැදිලියි. හැම ප්‍රාදේශීය සභාවකම -

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ගරු සභාපතිතුමනි, පාරවල් ගැන නොවෙයි. මේ වන කොට මීරිගම ප්‍රාදේශීය සභාවට බඳවා ගැනීම සඳහා Interview වගයක් කර ගෙන යනවා. මම ගරු මහ ඇමතිතුමාගෙන් ඉල්ලනවා. මම හිතන්නේ, එතුමාත් සමහර විට දන්නේ නැතිව ඇති. මැතිවරණය තියන කාල සීමාවේ හදිසියේම කැඳවීම් කළා සම්මුඛ පරීක්ෂණවලට. දැන් දෙවැනි වර කැඳවලා තිබෙනවා. ගිය සිකුරාදා. ඒ නිසා මේවා සම්බන්ධයෙනුත් ක්‍රියාමාර්ග ගන්න කියලා අදාළ නිලධාරීන්ට කියන්න. මොකද, දැන් සභාවක් පත් වෙනවා. ඒ සභා පත් වුණාට පස්සේ ඒවා ඉදිරියට ගෙනියන්න කටයුතු කරන්න කියන්න. දැනට කරලා තිබෙන ඒවා නතර කරන්නය කියන ඉල්ලීම ගරු ඔබතුමාගෙන් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඒ කාරණය විෂය භාර ගරු ඇමතිතුමාට යොමු කරනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මමත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලීම් ගණනාවක් කළා. ඒ ඉල්ලීම්වලට එතුමාගේ අමාත්‍යාංශයෙන්, ප්‍රාදේශීය සභාවලින් මුදල් වෙන් කරලා දුන්නා. ඒ වැඩ මගේ ඉල්ලීමට අනුව කෙරෙනවා. එතුමා එහෙම මතයක් ප්‍රකාශ කරනවා නම්, මගේ ටික නිදහස් කර ගෙන ඕනෑ එකක් කථා කරන්න. මම ඒවාට වගකියනවා. ඒ නිසා අපේ සමහර මන්ත්‍රීවරුන්ට කථා කළාම ඇත්තෙන්ම අපට ගන්න පුළුවන්කම ඇති වුණා. මම නම් කියන්නේ, මේක මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේත්, හිටපු ප්‍රසන්න රණතුංග ඇමතිතුමාගේත් වැඩ පිළිවෙළම තමයි. ආයිත් ඒකේ දෙකක් නැහැ. ඒ නිසා මම කියන්නේ, එතුමා කරලා තිබෙන වෙන දෙයක් තිබෙනවා නම්, මම ඒවා දන්නේ නැහැ. මට, අපේ මන්ත්‍රීවරු ගණනාවකට මේ මුදල් වෙන් කරලා දීලා තිබෙනවාය කියන එක තමයි මම ඔබතුමාට මතක් කරන්නේ.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, ඉතාම ගෞරවයෙන් කියන්නේ. හෝමාගම ප්‍රාදේශීය සභාවේ තිබෙන සල්ලි නම්,

මේ අවස්ථාවේදී සත පහක්වත් යොදවන්න එපා. මොකද, පළාත් පාලන මැතිවරණයේදී හොඳ උත්තරයක් දීලා තිබෙනවා, ඔය සල්ලි දාලා, මෙහේ තිබුණු සල්ලි අපටත් නොදී UNP එකටත් දීලා හොඳ උත්තරයක් ජනතාව දීලා තිබෙනවා. හැබැයි, පත් වුණු මන්ත්‍රීවරුන්ට ජනතාවට වැඩ කරන්න ඒ මුදල් ටික ඉතිරි කරන්න. මොකද, කොට්ඨාශ 28 යි. 28 ටම උත්තරය දුන්නා ගානට. ඒ වාගේම 50,000 ක ඡන්ද පරතරයක් දුන්නා. 80,000 ක් ඡන්දය දෙන කොට. ඒ නිසා ඒවාට අත තියන්න එපා. එහෙම කළොත් අපි ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සියල්ලක්ම කරනවා. මොකද, ඡන්දය වෙලාවේ වැඩ කරපු ඒවායේ ඡායාරූප අපි ළඟ තිබෙනවා. ඒ නිසා ඡන්දය වෙලාවේ සල්ලි දාලා කරපු සියලු දේවල් අපි ඡායාරූප ගත කරලා තිබෙනවා. එතකොට මැතිවරණ කොමසාරිස්තුමා අපට කිව්වා, රාජ්‍ය මුදල් යොදවලා තිබෙනවා නම්, ඒවා ඡායාරූප ගත කරලා ඉදිරිපත් කරන්න කියලා. හැබැයි, ඒවා ඉදිරිපත් කළොත් අවසානයේ අමාරුවේ වැටෙන්නේ මහ ඇමතිතුමා හෝ මුදල් යොදවන අය නොවෙයි. අර ඇතුළේ ඉන්න අහිංසක නිලධාරීන්. ඒ නිසා ඒ තත්ත්වයට අපිව පත් කරන්න එපා. මේ වන කොට හෝමාගම ප්‍රාදේශීය සභාවේ සියලු කටයුතු නතර වෙලා තිබෙනවා. ඒක ඒ විධියට නවත්වලා තියන්න. හැබැයි, එතැනින් එහාට කටයුතු කළොත් අපට සිද්ධ වෙනවා නිලධාරීන්ට විරුද්ධව කටයුතු කරන්න. අපි වෙන කාටවත් විරුද්ධව කටයුතු කරන්නේ නැහැ. නිලධාරීන්ට විරුද්ධවයි කටයුතු කරන්නේ. ඒ දේ කරවා ගන්න එපා. අහිංසක මිනිස්සුන්ව ගෙවල්වලට යවන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විවාදයකට යන්න එපා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon**.** Meril Perera

විවාදයකට නොවෙයි. ගරු විපක්ෂ නායකතුමා කියනවා, එතුමාගේ ඉල්ලීමට සල්ලි දුන්නාය කියලා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේ විශේෂ ප්‍රකාශද? මොනවාද මේ න්‍යාය පත්‍රයේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි. මට -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමිය ඉන්න. සභාපති නොවෙයි නේ? කට වහගෙන ඉන්න. ඔයා සභාපතිතුමාද? ගරු සභාපතිතුමනි, ගරු විපක්ෂ නායකතුමා කියනවා, එතුමාගේ ඉල්ලීමට සල්ලි දුන්නාය කියලා. එහෙම දෙන්න බැහැ. එහෙම දෙන්නේ කොහොමද ප්‍රාදේශීය සභාවේ සල්ලි. එහෙම නම් අපිටත් ඕනෑ නේ? එක්සත් ජාතික පක්ෂයත් එක්ක මහ ඇමතිතුමා -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ජා-ඇළ ප්‍රාදේශීය සභාවේ ඔක්කොම ඔයාට දුන්නා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රධාන අමාත්‍යතුමා කලින් හැමෝටම සල්ලි දුන්නා. එතුමාගෙන් කවුරු හරි ඉල්ලීමක් කළා නම්, හැමෝටම දුන්නා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, මේක අහ ගහන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එහෙම නම් කාගෙන්ද මෙපමණ කාලයක් වැඩ කළේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කවුරු හරි මන්ත්‍රීවරයෙක් ගියොත් එහෙම එතුමා Minute කරලා දෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමා අහගන්න. අපි කථා කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම අහගෙන ඉන්නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේත්. ප්‍රසන්න රණතුංග මහ ඇමතිතුමාගේ කාලයේත් එහෙම දුන්නේ මධ්‍යම ආණ්ඩුවේ සල්ලි. පළාත් සභාවේ සල්ලි. ප්‍රාදේශීය සභා සල්ලි දුන්නේ නැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මම ගෙනැත් දුන්නේ, මිනිස්සුන්ගේ යෝජනා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු විපක්ෂ නායකතුමා අහගන්න. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේවත්, ප්‍රසන්න රණතුංග මහ ඇමතිතුමාගේ කාලයේවත් ප්‍රාදේශීය සභා මුදල් දුන්නේ නැහැ. ඒවා දුන්නේ සභාපතිවරයාට. පළාත් සභාවේ මුදල් දුන්නේ. මේ දෙන්නේ ප්‍රාදේශීය සභාවේ මුදල්. එහෙම දෙන්න බැහැ. ඒකට ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු පත් වෙලා තිබෙනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

එහෙම නම් මේ පිළිබඳව පරීක්ෂණයක් කරන්න. කියන කථාව ඇත්ත. ජා-ඇළට ඇතුළු වුණාම මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාගේ ඇරෙන්න වෙන කිසි කෙනෙකුගේ ඒවා නැහැ. ඔක්කොම තිබෙන්නේ එතුමාගේ -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒවා පරික්ෂා කරන්න ඕනෑ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

තමුන්නාන්සේ පරීක්ෂණයක් කරන්න. මෙතුමාගේ ඉල්ලීමට අපිත් එකඟයි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

වෙනම මන්ත්‍රීවරුන්ට සල්ලි දුන්නා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

අපිත් එතුමාගේ ඉල්ලීමට එකඟයි. 2017 අවුරුද්දේ ජා - ඇළ ප්‍රාදේශීය සභාවේ සල්ලි කාගේ වුවමනාවටද ගියේ කියලා පරීක්ෂණයක් කරන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, වගකීමෙන් කියනවා. පළාත් සභා අරමුදල්.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

පරීක්ෂණයක් කරන්න. හොඳයි. ඉතා හොඳයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ටිකක් කට වහගෙන ඉන්න කෝ? පැරදිලා ලැජ්ජා නැතිව කට වහ ගෙන ඉන්න.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon. Neel Sunethra Lal Fernando

ගරු මන්ත්‍රීතුමා, ඔය විධියට පරාද වුණේ ඇයි කියලා පරීක්ෂණයක් කළොත් නරකද?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මහ ඇමතිතුමාට කඩේ යන අයට කඩේ යන්න කියන්න. අපි කඩේ යන්නේ නැහැ. අපි කියන්නේ, මේවා මහජන මුදල්. ප්‍රාදේශීය සභා අරමුදල්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම අදහසක් ඉදිරිපත් කරන්න යන්නේ නැහැ. මොකද, හැමෝම මහ ඇමතිතුමාගෙන් උදව් ගත්තා. ඒක අමතක කරන්න එපා. අපි දැන් න්‍යාය පත්‍රයට යමු.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, කෝටි 1200 ක්. මහරගම පාරවල් 780 ක් කාපට් කළා. අහල් දෙකට. ඡන්දයට Nomination දෙන කොටත් කාපට් කළා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ගරු මන්ත්‍රීතුමා, -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ කාපට් කිරීම නීති විරෝධී නිසා ඉදිරියේදී මේ පිළිබඳව පරීක්ෂණයක් කරලා, (බාධා කිරීම් ) දඬුවම් කරන්න කටයුතු කරනවාය කියන එක මේ අවස්ථාවේදී මම මේ සභාවට මතක් කරනවා.

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
ORAL ANSWERS TO QUESTIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයේ අංක 01 යටතේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ නමින් ඇති ප්‍රශ්නය යොමු කිරීමට අවස්ථාව.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය යොමු කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා සභා ගර්භයේ නැහැ. ගරු මහ ඇමතිතුමා, අධ්‍යාපන ඇමතිතුමා තවම සභාවට ඇවිල්ලා නැහැ. පළමු වන ප්‍රශ්නය එතුමාට තිබෙන්නේ.

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) [ගරු අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Fisheries Animal Production and Health and Agrarian Development.) [On Behalf of Minister of Education]

ගරු සභාපතිතුමනි, ඒ සඳහා පිළිතුරු ලබා දීමට සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට න්‍යාය පත්‍රයේ අංක 02 යටතේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමාගේ නමින් ඇති ප්‍රශ්නය යොමු කිරීමට අවස්ථාව.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ප්‍රශ්නය යොමු කරනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, ඒ සඳහා පිළිතුරු ලබා දීමට සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

## නොපැමිණ සිටීමේ අවසරය
LEAVE OF ABSENCE

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, *"රවීන්ද්‍ර යසස් ගරු මන්ත්‍රීතුමාට මාසයක කාලයක් රැස්වීම්වලට නොපැමිණ සිටීමට අවසර දිය යුතු යැයි"* යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

## පෞද්ගලික පැහැදිලි කිරීම්
PERSONAL EXPLANATIONS

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අවුරුදු 2 ½ ක් විතර අරාජිකව තිබුණු පළාත් පාලන ආයතන නැවත මහජන නියෝජිතයින්ගෙන් පත් කර ගන්නට පවත්වපු පළාත් පාලන මැතිවරණයේදී ඒ සඳහා ඉතාම විනිවිදභාවයකින් සහ සාධාරණව ඒ මැතිවරණය පවත්වන්න කටයුතු කරපු මැතිවරණ කොමිෂන් සභාවටත්, ඒ සඳහා අවස්ථාව ලබා දුන්න අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු අග්‍රාමාත්‍යතුමාටත් අපි මේ වෙලාවේ ස්තුතිය පුද කරනවා. විශේෂයෙන්ම

පසුගිය කාලවල අපි දැකලා තිබෙනවා, පළාත් පාලන මැතිවරණ පවත්වන කොට කොහොමද මේ රටේ ජනමතය හැසිරුණු ආකාරය. හැබැයි, ඒ සියලු වැරදි නිවැරදි කර ගෙන මේ පළාත් පාලන මැතිවරණය වැරදි ඉතාමත්ම අඩුවෙන්ම, පොලීසිවලට පැමිණිලි සංඛ්‍යාව ඉතාමත්ම අඩුවෙන්ම ලැබුණු පළාත් පාලන මැතිවරණය හැටියට මේක ඉතිහාසගත වෙනවා.

විශේෂයෙන්ම මම මේ වෙලාවේ කියන්න ඕනෑ. මේ බස්නාහිර පළාත් සභාව ඇතුළේත් පසුගිය පළාත් පාලන මැතිවරණයේදී කොළඹ මහ නගර සභාව විතරයි එක්සත් ජාතික පක්ෂයට ජයග්‍රහණය කර ගන්න පුළුවන්කම ලැබුණේ. හැබැයි, මේ පවත්වපු මැතිවරණයේදී මහජන නියෝජිතයින්ට වැඩි අවස්ථාවක් ලබා දෙන්න කොට්ඨාශ ක්‍රමය සකස් කරලා, විශේෂයෙන්ම ගම්පහ දිස්ත්‍රික්කයේ බැලුවොත් වත්තල මාබෝල නගර සභාවත්, මීගමුව මහ නගර සභාවත් එක්සත් ජාතික පක්ෂයට පැහැදිලි ජයග්‍රහණයක් කර ගන්න පුළුවන්කම ලැබුණා. මෙතැන ඉන්න ජානක සූරියබණ්ඩාර ගරු මන්ත්‍රීතුමාත් සාක්ෂි දරයි. ගියවර පළාත් පාලන මැතිවරණයේදී ඉතාමත්ම අමිහිරි සිද්ධියක් වුණා. මේවා මන්ත්‍රීවරු හොඳට අහගන්න ඕනෑ. අවුරුදු 54 ක් එක දිගට ජයග්‍රහණය කරපු වත්තල මා බෝල නගර සභාව පසුගිය පළාත් පාලන මැතිවරණයේදී ඒ කියන්නේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ පවත්වපු පළාත් පාලන මැතිවරණයේදී මර්වින් සිල්වා ඇමතිවරයා ඇවිල්ලා, උඩට වෙඩි තියලා, මිනිස්සුන්ට ගහලා, ඔලු පළලා, ඡන්ද 23,000 ක් තිබෙන වත්තල මාබෝල නගර සභාවේ ඡන්ද 10,000 යි පාවිච්චි කරන්න පුළුවන්කම ලැබුණේ. ඡන්දය දාන්න යන්න දුන්නේ නැහැ. එහෙම කරලත්, ඡන්ද 200 කින් තමයි ඒ ජයග්‍රහණය අපෙන් උදුරා ගත්තේ. එහෙම අමිහිරි අතීතයක් තිබුණු ඒ වාගේ කාලකන්ණි මිනිස්සු මේ රටේ දේශපාලනය කරපු, ඒ මැතිවරණ ක්‍රමයට තිත තියලා. වත්තල මිනිස්සු බොහොම පැහැදිලි තීන්දුවක් දුන්නා. කොට්ඨාශ හයයි. හයම එක්සත් ජාතික පක්ෂය දිනුවා. එක සත පහක් කාටවත් බෙදන්නේ නැතිව. පසුගිය කාලයේ අපි දැක්කා. මේ නම් කියන්න ඕනෑ. නිමල් ලාන්සා ගරු ඇමතිතුමා වත්තල සංවිධායකවරයා වෙලා ඉන්න කොට ඌරු පැටියාගේ, කුකුල් පැටියාගේ, ෆ්‍රිජ් එකේ, ගෑස් ලිපේ, ගෑනුන්ට මිනිස්සු, මිනිස්සුන්ට ගෑණු, කෙල්ලන්ට කොල්ලෝ, කොල්ලන්ට කෙල්ලෝ ඔක්කොම දුන්නා. දුන්නේ නැත්තේ - (බාධා කිරීම්)

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කොල්ලන්ට කොල්ලෝ.

[සභාවේ සෝෂා]

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

දුන්නේ නැත්තේ අම්මා තාත්තා විතරයි. හැබැයි, මේ රටේ මාධ්‍යවලින් ජෝන් අමරතුංග කියන පරිණත දේශපාලඥයාව පසුගිය කාලයේ මොන විධියට සවුත්තු කෙරුවාද කියලා තමුන්නාන්සේලා දන්නවා ඇති. නමුත්, කැබිනට් ඇමතිවරයෙකු විධියට මොන තරම් පීඩනයක් එල්ල වුණත් එතුමා විතරයි වත්තල මැතිවරණ කොට්ඨාශය එක්සත් ජාතික පක්ෂයට ජයග්‍රහණය කරලා දුන්නේ. එහෙම නම් තීරණය කර ගන්න ඕනෑ. ඔය පැටව් බෙදුවාට මිනිස්සු මොන විධියට සැලකුවාද කියලා හිතන්න ඕනෑ. ඒ නිසා මේ වෙලාවේ අපි ඉතාමත්ම ගෞරවයෙන් සිහිපත් කරනවා. එතුමාගේ නායකත්වයෙන් ඒ වත්තල ලබා දුන් ජයග්‍රහණය, බොහොම පැහැදිලි ජයග්‍රහණයක්. කාගෙන්වත් පස්සේ එල්ලිලා යන්න ඕනෑ නැහැ. කොට්ඨාශ ටික ඔක්කොම අපි දිනා ගත්තා. අපට මන්ත්‍රීවරු ඉන්නවා. අපි නගර සභාව පිහිටුවනවා. අපෙන් උදුරා ගත්ත ජයග්‍රහණය තමයි. ඒ නිසා ඔය කථා කරන, කෑ ගහන අය ගිහිල්ලා කියන්න ඕනෑ, මහින්ද රාජපක්ෂට. මර්වින් සිල්වලාට. නිමල් ලාන්සලාට. කොහොමද? ඒ කාලේ ඡන්දය කෙරුවේ කියලා. අද මම බොහොම සන්තෝෂයි. මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා නැගිටලා වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කළා. මමත් එතුමාගේ පැත්තේ තමයි ඉන්නේ. මම ඉන්නෙත් එතුමාගේ පැත්තේ තමයි. මම කියනවා, එතුමාගේ ප්‍රකාශය පිළිබඳව තමුන්නාන්සේ පැහැදිලි ප්‍රකාශයක් කරලා, පැහැදිලි විමර්ශනයක් කරන්න. මොකද, අපටත් දැන ගන්න ඕනෑ. පසුගිය කාලයේ ප්‍රාදේශීය සභාවල සල්ලි කාගේ කාගේ උවමනාවට, කොයි කොයි විධියටද වැඩ කළේ කියලා. ඒක බොහොම පැහැදිලිව අපට දැන ගන්න ඕනෑ. මොකද, මම ජීවත් වෙන්නේ ජා - ඇළ ආසනයේ. ඒකේ ඉන්නවා එක්සත්

[ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ]

ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු දෙන්නෙක්. ශිරන්ත අමරසේකර ගරු මන්ත්‍රීතුමා සහ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ඉන්නවා අපේ ඩිල්ෂාන් ජයවර්ධන ගරු මන්ත්‍රීතුමා. එළියට බැහැලා බලපුවාම මේ කිසි කෙනෙකුගේ ඒවා නැහැ. මෙතැන ඉන්න ඕනෑ කෙනෙකුට මම ආරාධනා කරනවා. එන්න යන්න. වත්තලින් එහා පැත්තේ තිබෙන්නේ ජා - ඇළ. ඇතුළු වුණු තැන ඉඳලා ඉන්නේ මෙරිල් පෙරේරා විතරයි. එතුමා දක්ෂ වැඩකාරයෙක්.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ඉතින් මොකක්ද ප්‍රශ්නය?

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

එතුමා දක්ෂ වැඩ කාරයෙක්. කොහොමද මේ සල්ලි යෙදුවේ? මහ ඇමතිතුමාගේ අනුමැතියකින් තොරව කොහොමද කෙරුවේ කියන එක පිළිබඳව ඒ පළාත් පාලන ආයතනවල නිලධාරීන්ට විරුද්ධව කටයුතු කරන්න ඕනෑ. ඒ පිළිබඳව එතුමාගේ ඉල්ලීමට මගේ එකඟතාවය පළ කරමින් මේ ලබා දීපු විශිෂ්ට ජයග්‍රහණය බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන හතක් අටක් අපි දිනුවා. මේ ප්‍රතිඵලය පෙන්වලා ආණ්ඩු පෙරලන්න හදනවා නම්, ඒ සුභ සිහිනය දැක දැක ඉන්නය කියන කාරුණික ඉල්ලීම කරමින්, තමුන්නාන්සේට මේ වෙලාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. මෙතුමා මගේ නම කියපු නිසා. මම වැඩ කරලා තිබෙන්නේ, මට ලැබුණු මුදල්වලින්. දැන් මෙහෙම නේ? ජෝන් අමරතුංග ඇමතිතුමා ඉන්නේ මගේ ආසනයේ. කාවින්ද ජයවර්ධන ගරු මන්ත්‍රීතුමා ඉන්නේ මගේ ආසනයේ. ජොසප් මයිකල් පෙරේරා මැතිතුමා ඉන්නේ මගේ ආසනයේ. ෆීලික්ස් පෙරේරා මැතිතුමා ඉන්නේ මගේ ආසනයේ. පළාත් සභාවේ ශිරන්ත අමරසේකර ගරු මන්ත්‍රීතුමා ඉන්නේ මගේ ආසනයේ. සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා ඉන්නේ මගේ ගෙට එහා පැත්තේ. වෙලෙන් එහා පැත්තේ ජීවත් වෙන්නේ. නිරෝෂා අතුකෝරළ ගරු මන්ත්‍රීතුමියත් ඉන්නේ මගේ ආසනයේ. ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඉන්නේ මගේ ආසනයේ. අට දෙනාම ආසනයේ ඉන්න කොට වැඩ කරලා තමයි, 17,000 කින් පරාජය කළේ කියන එක පැහැදිලිව කියන්න ඕනෑ. අපි වැඩ කරපු මන්ත්‍රීවරු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඒක වරප්‍රසාද ප්‍රශ්නයකට අදාළ වෙන්නේ නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පළාත් සභා මුදල් අරගෙන ගිහිල්ලා වැඩ කෙරුවේ. එහෙම තමයි පරාජය කරලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි. ඔබතුමා මේ වෙන එකක් කියන්නේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මම කිව්වේ, වැඩ කරපු විධිය ගැන සොයන්න කියලයි.

[සභාවේ ඝෝෂා]

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, 36(1). මේ මැතිවරණයේදී වැඩ කළාට කවුරුවත් දිනුවේ නැහැ. එහෙම දිනනවා නම් දින්න තිබුණේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා. මේක මහින්ද සුළඟ. මහින්ද මහත්තයාට දුන්න ඡන්දය. මිනිස්සු ඇවිල්ලා කථා කළේ, ඉස්සර ගම් සභා මැතිවරණයකට ඇවිල්ලා කිව්වේ, අහවල් පුද්ගලයාට ඡන්දය දෙන්න කියලා. එහෙම ක්‍රමයක් මේ සැරේ තිබුණේ නැහැ. මිනිස්සුන්ට කිව්වේ, මහින්දට ඡන්දය දෙන්න කියලා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේක විකෘතියක්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

හෝමාගම පැරදුනාට කරන්න දෙයක් නැහැ. ආණ්ඩු විරෝධය.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මුළු රටම ආණ්ඩුවට විරෝධය ප්‍රකාශ කළේ. ඒකයි.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වෙන්න. පෞද්ගලික ප්‍රකාශ යටතේ, මීළඟට ගරු අසෝක රන්වල ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, ඔබතුමා මාර්ගයෙන් අධ්‍යාපන අමාත්‍යතුමාගේ අවධානය පිණිසයි මේ ප්‍රකාශය කරන්නේ. මීගමුව අධ්‍යාපන කලාපය තුළ නව පාසලක් බිහි වෙනවා, මීට අවුරුදු හතකට කලින්. ඒ පාසලේ නම තමයි, ගම්/මිනු/රෙජී රණතුංග ප්‍රාථමික විද්‍යාලය. මේ පාසල බිහි වෙන්න අදාළ මූලික කාරණා ටික තමයි මේ ප්‍රදේශය තුළ ඉන්න තදබදය සහිත පාසල්වලට ඇතුළත් කර ගන්න බැරි ළමයින්ට යම් සාධාරණයක් ඉෂ්ට කර ගන්න. පාසලක් බිහි වීම ඉතාමත් හොඳ මට්ටමක්. මොකද, පාසල් බිහි වෙන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් ගැටළුවක් නැහැ. මේ පාසල බිහි වෙන භූමිය තිබුණේ, මධ්‍යම පරිසර අධිකාරිය සතුව. ඒක පවරා ගෙන, ඒ නව පාසල බිහි වුණා. ආදර්ශ පාසලක් විධියට. ප්‍රදේශයේ ඉන්න දරුවන්ට අවස්ථාව ලැබුණා ඒ පාසලට යන්න. රජයේ ප්‍රතිපාදනවලින් පමණක් නොවෙයි. ප්‍රදේශයේ ඉන්න පුරවැසියන්ගේත් දායකත්වය මතයි මේ පාසල බිහි වෙන්නේ. මේ පාසල බිහි වුණාට පස්සේ ඒ දරුවන්ගේ අධ්‍යාපනයට යම් තැනක් ලැබෙනවා. හැබැයි ගරු සභාපතිතුමනි, පහ වසර ශිෂ්‍යත්ව විභාගයෙන් පස්සේ මේ දරුවන්ට ඊළඟ පාසලට ඇතුළත් වීම සඳහා, බොහොම තදබදයක් සහිත ප්‍රදේශයක් බැවින් පාසලක් තිබුණේ නැහැ. මේකට පිළිතුරක් විධියට ඒ පාඨශාලාවේ ද්විතියික පාඨශාලාව විධියට ගම්/මිනු/රෙජී රණතුංග විද්‍යා විද්‍යාලය වශයෙන් නව පාසලක් බිහි වෙනවා. මේ විද්‍යාලයේ ප්‍රධාන අරමුණ බවට පත් වෙලා තිබෙන්නේ, රෙජී රණතුංග ප්‍රාථමික විද්‍යාලයේ දරුවන්ට ශිෂ්‍යත්ව විභාගයෙන් පස්සේ ඒ පාසලට ඇතුළත් වීමේ අවශ්‍යතාවය. මේක පදනම්ව තමයි දෙවැනි නව පාසල ඉදිකිරීම සඳහා ප්‍රාථමික විද්‍යාලයේ හිටපු දෙමව්පියන්ගේ සම්පූර්ණ දායකත්වය ලැබෙනවා. වැලි ටික, ගඩොල් ටික, ඒ වාගේම ඒ සම්බන්ධව මේසන් බාස් උන්නැහැලා විධියටත් ප්‍රාථමික විද්‍යාලයේ ඒ දෙමව්පියන් මැදිහත් වෙලා රජයේ ප්‍රතිපාදනවලින් තමයි මේ පාසල ඉදි වෙන්නේ. ඔවුන්ට විශාල බලාපොරොත්තුවක් තිබුණා. අර තදබදයක් සහිත පාසල්වලට තමන්ගේ දරුවන් යවන්න බැරි නිසා ප්‍රාථමික විද්‍යාලයේ දරුවන් ඒ පාසලට යවන්න. මේ බලාපොරොත්තු එලෙස තිබුණත් ඉතාමත් අවාසනාවන්ත විධියට මේ රට තුළ ක්‍රියාත්මක වෙන්නේ නැති, බස්නාහිර පළාත් සභාව තුළ ක්‍රියාත්මක වෙන්නේ නැති අමුතු නීතියකින් ශිෂ්‍යත්ව විභාගයෙන් දරුවන්ව ඇතුළත් කරන්න කටයුතු කරනවා. ලකුණු සීමාවක් එනවා. 125 කට වැඩිය ලකුණු තිබෙන දරුවන් විතරයි ඒ පාසලට ඇතුළත් කරන්නේ කියලා.

ගරු සභාපතිතුමනි, ඒ ද්විතියික පාසලට, එහෙම නැත්නම් රෙජී රණතුංග විද්‍යා විද්‍යාලයට ඇතුළත් වීම සඳහා සුදුසුකම් සපුරන්න නිර්ණායකයක් එනවා. ලකුණු 125 ට වැඩි ළමයින් පමණයි ඒ විද්‍යාලයට ගන්නේ කියලා. මෙහෙම ගත්තාට පස්සේ ප්‍රශ්නයක් ඇති වෙනවා. ඒ පාසල නිර්මාණය කිරීමේ ප්‍රධාන අවශ්‍යතාවය බවට පත් වෙලා තිබුණු රෙජී රණතුංග ප්‍රාථමික විද්‍යාලය තුළ ශිෂ්‍යත්ව විභාගය අසමත් වුණු, එහෙම නැත්නම් ලකුණු 125 ට අඩුවෙන් ගත්ත අයට යන්න තැනක් නැති වෙනවා. බුරුළුපිටිය කනිෂ්ට විද්‍යාලය නැත්නම් මහා විද්‍යාලය තමයි ඊට දුරින් තිබෙන්නේ. දැන් ඒකේ විදුහල්පතිවරු ප්‍රකාශ කරනවා, අපි ළඟට පොල් කුඩු එවන්න එපා. පොල් ගෙඩි එවන්න. කිරි ටික අරගෙන, ඒ කිරි ටිකෙන් පස්සේ රොඩු ටික දාන මට්ටමට ඒ ළමයින් වැටිලා තිබෙනවා. ළමයින් 30 දෙනෙකු විතර ඉතාම බරපතළ අපහසු තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ ළමයින්ට ශිෂ්‍යත්ව විභාගයෙන් පස්සේ ඇතුළත් වෙන්න විද්‍යාලයක් නැති වෙලා තිබෙනවා. අල්ලපු වැටේ, ජනාධිපති විද්‍යාලයේ. නව පාසලේ ආදර්ශ

[ගරු අසෝක සපුමල් රන්වල ]

විද්‍යාලය වුයේ රෙජී රණතුංග ප්‍රාථමික විද්‍යාලයයි. ඒකට අල්ලපු විද්‍යාලය විධියට තමයි නිර්මාණය වෙන්නේ, රෙජී රණතුංග විද්‍යා විද්‍යාලය. මේ විද්‍යාල තුනම මැද්දේ ඉන්න ළමයින් ටිකට යන්න පාසලක් නැතිව අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මාස කිහිපයක් තිස්සේ ළමයින් 30 දෙනෙකුට එහෙම අවස්ථාවක් ලැබිලා නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමා මඟින් ගරු අධ්‍යාපන ඇමතිතුමා වෙත යොමු කරනවා. මේ සම්බන්ධව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ නිර්දේශය මම කෙටියෙන් සඳහන් කරන්නම්.

*"නමුත් මෙවරද පසුගිය වසරේ මෙන් දෙමව්පියන් දැනුවත් කර තිබියදීත් දේශපාලන අධිකාරියේ හා දෙමව්පියන්ගේ ඉල්ලීම් හා විරෝධතාවය මැද නැවත වරක් 125 න් ඉහළ ළමුන් ඇතුළත් කිරීමට එකඟතාවය ලබා දී ඇත. ඒ අනුව මා බලාපොරොත්තු වූ ගුණාත්මක තත්ත්වය පවත්වා ගැනීමේ අවධානමට ලක්ව ඇත."*

දෙවැනි කාරණයත් ඒ වාගේම වැදගත්.

*"එබැවින්, මෙම පාසල සම්බන්ධයෙන් මා ලබා දුන් සියලුම නිර්දේශ ඉටු වී නොමැති අතර, මීනු/රෙජී රණතුංග ප්‍රාථමික විද්‍යාලයේ ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 125 ට වැඩි සිසුන් ඇතුළත් කරන්නේ නම්, එම විද්‍යාලයේ අනෙක් සිසුන්ට කරන බරපතළ අසාධාරණයක් බැවින් මීනු/රෙජී රණතුංග ප්‍රාථමික විද්‍යාලය හා මීනු/රෙජී රණතුංග විද්‍යා විද්‍යාලය ඒකාබද්ධ කර, පන්තියට සිසුන් 45 බැගින් ඇතුළත් කර, සමාන්තර පන්ති 04 ක් දක්වා වැඩි කර, සියලුම සිසුන් ඇතුළත් කිරීමට සාධාරණය ඉෂ්ට කරන්න"* කියලා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමා විසින් නිර්දේශ ගණනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒකේ 125 සීමාව සම්බන්ධව එතුමාගේ නිර්ණායකය අලුත් කරලා නැහැ. නමුත් ඒ සම්බන්ධව ධනාත්මක කාරණා දෙකක් ඉදිරිපත් කරලා තිබෙනවා. පළමු වැනි කාරණය, වෙනත් පාසලකින් රෙජී රණතුංග විද්‍යා විද්‍යාලයේ හය වන ශ්‍රේණියට ඇතුළත් කිරීමට බලාපොරොත්තු වන ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා ශිෂ්‍යත්ව විභාගය සමත් වන කඩඉම් ලකුණු අනුව ප්‍රමුඛත්වය ලබා දිය යුතුයි කියලා. දෙවැනි කාරණය තමයි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කාලය අවසන්. කථාව අවසන් කරන්න.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, තව විනාඩියක් දෙන්න. මේ ආකාරයට සිසුන් බඳවා ගැනීම ක්‍රියාත්මක කිරීමේදී රෙජී රණතුංග විද්‍යාලයේ සිසුන් බඳවා ගැනීමෙන් පසුව පිටතින් සිසුන් බඳවා ගැනීමට නිර්දේශ කරමි. මේ එතුමාගේ අත්සනින් නිකුත් කරලා තිබෙන්නේ. හැබැයි, ගරු සභාපතිතුමනි, ඔබතුමා මඟින් ගරු ඇමතිතුමාට කියනවා. අද වන කොටත් දරුවෝ 30 කට, 32 කට ආසන්න ප්‍රමාණයක් එළියේ ඉන්නවා. ඒ නිසා මේක ඇමතිවරු, එහෙම නැත්නම් සහෝදරයෝ දෙදෙනෙකුගේ දේශපාලන අර්බුදයක ප්‍රතිඵලයක් විධියට දිගින් දිගටම අසාධාරණයක් සිද්ධ වෙනවා. එහෙම වෙන්න දෙන්න එපා. පාසලක් නිර්මාණය කිරීම හොඳයි. කවුරු අතින් රජයේ මුදල් වියදම් කරලා කෙරුණත්. පාසල් දෙකක්ම නිර්මාණය වීම වඩාත් හොඳයි. මේ පාසල් දෙක ඒකාබද්ධ කරලා, ඒ දරුවන් 30 දෙනාටවත් අඩුම තරමේ මේ ගමන සාධාරණය කරන්න. ඉදිරියේදී මේ ලකුණු 125 සීමාව අයින් කරලා දීලා, මේ පාසල් දෙක ඒකාබද්ධ කරලා, අවශ්‍ය නම් එළියෙන් ළමයින් ගන්න කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු සභාපතිතුමනි, අවුරුදු දෙකහාමාරකට වඩා වැඩි කාලයක් පළාත් පාලන ආයතනවල ඡන්දයක් තැබීමෙන් තොරව පසුව බිහි වුණු ඡන්දයේදී මහරගම ජනතාව විශාල වශයෙන් බලාපොරොත්තුවක් තියාගෙන හිටියා මේ සැරේ පළාත් පාලන ආයතනය කිසියම් නිශ්චිත ස්වරූපයකින් ඔවුන්ට ලබා ගන්න පුළුවන් වෙයි කියලා. නමුත් ගරු සභාපතිතුමනි, සමහර වෙලාවට මහරගම කියලා කිව්වාම මෝඩයින්ගේ පාරාදීසයක් කියලා වෙබ් සයිට්වල සඳහන් වෙනවා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

මහ ඇමතිතුමාව -

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

නැහැ. ඒක මහ ඇමතිතුමාව ආදේශ කර ගෙන නොවෙයි මම මේ කථා කරන්නේ. ඒකට හේතුව තමයි, -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

බයිසිකල් කේස් එක.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු සභාපතිතුමනි, අපට අයිති විෂයයක් හැටියට මේ මහරගම බල ප්‍රදේශයේ හිටපු සහ ඉන්නා වූ සහ ඡන්දය පාවිච්චි කරපු අයට දැඩි අසාධාරණයක් සිද්ධ වෙලා තිබෙනවා, මැතිවරණ කොමසාරිස්තුමා හරහා. ඒකට හේතුව තමයි ගරු සභාපතිතුමනි, ජනතා විමුක්ති පෙරමුණේ මහරගම නගර සභාව නියෝජනය කරපු මන්ත්‍රීතුමෙකු වන සුරවීර මන්ත්‍රීතුමා. එතුමා තේරීම්භාර නිලධාරීවරයාට ඉදිරිපත් කරලා තිබෙනවා, මේ ස්වාධීන කණ්ඩායම් දෙකේ ලැයිස්තුව නිවැරදි නැහැ. මේ වැරදි ලැයිස්තුවක් දීලා තිබෙන්නේ. මේකේ ඇතුළත් වෙලා තිබෙන බහුතරයක්ම ඉන්නේ බඩල්ගම. ඒ වාගේම වැල්ලවත්ත. ඒ වාගේ 19 ක් ඉන්නවා. ගරු සභාපතිතුමනි, මේ සමහර අය ඉපදිලා තිබෙන්නේ, 1932 දී. අවුරුදු 86 යි. ඒ වාගේම කොට්ටාව නැගෙනහිර ප්‍රදේශය භාර වෙලා ඉන්න කෙනාගේ වයස අවුරුදු 83 යි. ඒ වාගේම තව කෙනෙක් ඉන්නවා. දේවගේ විමලාවතී -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මේක අදාළ නැහැ. මැතිවරණය තියලා ඉවරයි. නොමිනේෂන් භාරඅරගෙන තිබෙනවා මැතිවරණ කොමසාරිස්. මේක නීති විරෝධීයි.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මාමයිට් ජනපදය. අකරංගහ, බඩල්ගම. වයස අවුරුදු 85 යි. ගරු සභාපතිතුමනි, මෙය ඉතාමත්ම වැරදි සහගත දෙයක්. මේක ඉදිරිපත් කරන කොට (බාධා කිරීම්) ගරු සභාපතිතුමනි, මැතිවරණ කොමසාරිස්තුමා මේක දැක්කා. ඇයි මේ වාගේ එකක් ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දුන්නේ. දැන් මහරගම ජනතාවගේ ඡන්ද අයිතිය උල්ලංඝනය කිරීමක් කරලා තිබෙනවා. බයිසිකලෙන් - (බාධා කිරීම්) අපි එක අතකින් බලාපොරොත්තු වෙනවා, මහින්ද රාජපක්ෂව බයිසිකලෙන් යැව්වේ අපි. ප්ලේන්වලිනුයි, හෙලිකොප්ටර්වලිනුයි ගිය ජනාධිපතිතුමාව බයිසිකලයෙන් යැව්වේ මහරගම අපි. හැබැයි, මහරගම ජනතාවට බොරු ප්‍රලාප කියලා ඉවර වෙලා - ඔබතුමා ඉන්න තත්ත්වයම තේරෙනවා නේ? මහරගම ජනතාවට විශාල වශයෙන් අකටයුත්තක් සිද්ධ වෙලා තිබෙනවා. මේ බයිසිකලය කියලා කියන්නේ, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ -

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon. Neel Sunethra Lal Fernando

ඇයි ඔබතුමන්ලාගේ අලියාට මොකද වුණේ?

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මේ උපාලි කොඩිකාර - එතුමාගේ වැරදි මතයක් ඇති කරලා, මහරගම නගර සභාවක් පිහිටුවන්න බැරි තත්ත්වයක් කරලා තිබෙනවා. (බාධා කිරීම්) මේ පිළිබඳව සොයා බැලීමක් කරලා, මහරගමට නිසි අවධානයක් යොමු කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. එහෙම නොවුණොත් අපට මහරගම නගර සභාව පිහිටුවන්න හම්බ වෙන්නේ නැහැ. බයිසිකලය පිටිපස්සේ ඉන්නේ මෙතුමන්ලායි කිව්වා. (බාධා කිරීම්)

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අපි වැඩේ කරන්නම්.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඔබතුමාගේ අවධානය යොමු කරන්නය කියලා ඉල්ලීමක් කරනවා ගරු සභාපතිතුමනි. මේක ප්‍රධාන වශයෙන්ම මැතිවරණ කොමසාරිස්තුමාගේ තිබෙන වැරැද්ද.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ලැජ්ජයි. 25 යි. 23 යි.

**ගරු රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මේ හරක් ටික ගිහිල්ලා කිව්වා, -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

තමුන්නාන්සේගේ කොට්ඨාශයේ -

[සභාවේ ඝෝෂා]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

තමුන්නාන්සේලාගේ හොරකමට විරුද්ධව ඡන්දය දුන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මහරගම නගර සභාව පිහිටුවන්න බැරි තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මේ මෝඩයින් ගිහිල්ලා නොකිව්වා නම්, මහරගම නගර සභාවක් තිබෙනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මෙතුමාගේ කොට්ඨාශයේ ඡන්ද 64 යි එක්සත් ජාතික පක්ෂයට තිබෙන්නේ. මුළු සභාවම බලා ගන්න. මේ කයිවාරු ගහනවා. ඔය මන්ත්‍රී සූට් එක ගලවන්න. මෙයාගේ අපේක්ෂකයා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකර වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

මීළඟට ජනක වැලිවත්ත ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව මුලින්ම ස්තුතිවන්ත වෙනවා. පසුගියදා පැවැත්වුණු පළාත් පාලන මැතිවරණය සම්බන්ධයෙනුත්, ඒ සම්බන්ධව ඇති වුණු ගැටළු සාකච්ඡා කිරීමට තමයි මම අවස්ථාව ඉල්ලුවේ. මුලින්ම රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා කරපු ප්‍රකාශය ගැන මම කනගාටු වෙනවා. මොකද, එතුමා මහරගම මෝඩයින්ගේ පාරාදීසයක් කිව්වා. ඇත්ත වශයෙන්ම අපේ ගරු මහ ඇමතිතුමාත් ඉන්නේ මහරගම. ඔබතුමාත් ඉන්නේ මහරගම. මම කනගාටු වෙනවා. ඔබතුමා වාගේ ජ්‍යෙෂ්ට, උගත් පුද්ගලයෙකු මහරගම ජනතාව -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

බන්දුල කිව්වේ, පොල් ලෙලි කියලා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මොකද, ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණේ අපේ ලැයිස්තුව ප්‍රතික්ෂේප වුණු එක අපි පිළිගන්නවා. අපේ ලැයිස්තුව ප්‍රතික්ෂේප වුණාට මහරගම ජනතාව සූදානම් වුණේ නැහැ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටවත්, එක්සත් ජාතික පක්ෂයටවත් ඡන්දයක් දෙන්න. මොකද, ඒ තරම් අප්‍රසන්න වෙලා තිබෙන්නේ. පාරවල් ටික ඔක්කොම කාපට් කළා. පාරවල් හත්සිය ගණනක්. එහෙම කරලා බෙදන්න පුළුවන් සියල්ල බෙදුවා. එක්සත් ජාතික පක්ෂය බලය යෙදුවා. නායකයෝ සියලු දෙනාම ආවා. ජනාධිපතිතුමා ආවා. ඒ සියලු දෙනාත් ඇවිල්ලා මහරගම ජනතාව නිවැරදි ප්‍රතිඵලය දුන්නා. මේ ආණ්ඩුව මේ ගෙනියන වැඩ පිළිවෙළට එරෙහිව බයිසිකලයට, ස්වාධීන කණ්ඩායම් දෙකට - මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා කිව්වේ, එක දවසයි. ඒ තැන විශ්වාසය තියලා මහරගම ජනතාව ඡන්දය පාවිච්චි කළා. ජනතා විමුක්ති පෙරමුණයි, ස්වාධීන කණ්ඩායම් සියල්ල එකතු කරලා. වැඩි ඡන්ද 20,000 ක් කොට්ඨාශ 25 ම ජයග්‍රහණය කළා. මම රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමාගෙන් අහනවා, එතකොට මහරගම ජනතාව මෝඩයෝද කියලා. මම හිතන්නේ, ඔබතුමන්ලා තමයි මෝඩයෝ. ඔබතුමන්ලාට හරි උත්තරය මහරගම ජනතාව දුන්නා. (බාධා කිරීම්) ඔබතුමන්ලා දුක් වෙන්න එපා. සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා කිව්වා, ජා - ඇළ නගර සභාව දිනුවයි කියලා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මම කිව්වේ වත්තල.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මේ මැතිවරණයෙන් පළාත් පාලන ආයතන 239 ක් දින්නා ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

දිනුවාට හැබැයි, පිහිටුවන්න බැහැ.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ගන්න පුළුවන් වුණේ පළාත් පාලන ආයතන 02 යි. තමිල් අරුසුකච්චි අරන් තිබෙනවා 46 ක්. කුකුලා 05 ක් අරන් තිබෙනවා. එතකොට මේ රටේ ජනතාවගේ ප්‍රතිඵලය මොකක්ද කියලා ඔබතුමන්ලා හිතන්න. දුක් වෙන්න එපා. ආණ්ඩුවක් අරගෙන ජනාධිපතිතුමා ශ්‍රී ලංකා එකෙන් දා ගෙන, අගමැතිතුමාව UNP එකෙන් දාගෙන හවුලක් ගෙන ගියා. ජනතා විමුක්ති පෙරමුණත් එහෙන් මෙහෙන් මුක්කු දීලා සහයෝගය දුන්නා. මේ රටේ ජනතාව ඒ බොරුව සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කළා. ජනතාවට අපේක්ෂකයෝ නොවෙයි, මේ වැඩ පිළිවෙළක් ගෙනියන්න පුළුවන් කවුද කියලා තේරුම් අරගෙන තමයි, මහින්ද රාජපක්ෂ මහත්තයාව සොය සොයා ගිහිල්ලා ඡන්දය ගැහුවේ. එතැනට ලකුණ අවශ්‍ය වුණේ නැහැ. මහින්ද රාජපක්ෂ නම තිබුණා නම් සොයා ගෙන ගිහිල්ලා ඡන්දය ගැහුවා. ඒ නිසා තමයි මහරගමට මේ ප්‍රතිඵලය හම්බ වුණේ. ඒ නිසා ඔබතුමන්ලා කනගාටු වෙන්න. ලැජ්ජා වෙන්න. මොකද, මේ රටේ ඉතා කෙටි කාලයකින් පක්ෂයක් පිහිටුවලා අවුරුද්දකට වඩා වැඩි කාලයකින් මේ රටේ ජනතාව සියලු දෙනා එකතු වෙලා මේ ප්‍රතිඵලය ලබා දුන්නේ - අපේ ඡන්දවලින් ගත්තොත් මේ රටේ 49,68,762 ක් පොදු ජන පෙරමුණට දීලා තිබෙනවා. ඡන්ද 50,000 කට වැඩියි. එක්සත් ජාතික පක්ෂයට ගන්න පුළුවන් වුණේ 36 ලක්ෂයයි. එක්සත් ජනතා සන්ධානයට 1,497,234 යි. ජනතා විමුක්ති පෙරමුණට 710,932 යි පුළුවන් වුණේ. ඒ නිසා මේ රට නැවත ගෙනියන්න මේ මැතිවරණය පිළිබඳව හිතන්න. හැබැයි, මේ මැතිවරණය විහිළුවට ගන්න එපා. මේක තමයි රටේ ජනතාවගේ ප්‍රශ්නය. මේ ප්‍රශ්නයට විසඳුම දෙන්න. හැකි ඉක්මණින් මැතිවරණයක් පවත්වන්න ඕනෑ. මේ ආණ්ඩුවේ ප්‍රතිඵලය බලලා, මේ ආණ්ඩුව විසුරුවලා හැරලා වහාම මැතිවරණයක් තියන්න. අපි කියනවා, ඔබතුමන්ලා භය නැත්නම් බස්නාහිර පළාත් සභාව විසුරුවන්න. අපි සූදානම් මැතිවරණයකට යන්න. පළාත් සභා මැතිවරණය තියන්න. අපි සූදානම් මැතිවරණයකට යන්න. හැකි නම් විසුරුවලා මැතිවරණය තියන්න.

ඒ වාගේම මම හෝමාගම ආසනයේ ජනතාවට විශේෂ ස්තුතියක් කරනවා. හෝමාගම ආසනයේ ඡන්ද 82,000 ක් දුන්නා. ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට. වැඩි ඡන්ද 50,000 කට වැඩියි. ලංකා ඉතිහාසයේ වාර්තාගත මැතිවරණයක් දුන්නා හෝමාගම ජනතාව. කොට්ඨාශ 28 ම දිනුම්. හැබැයි, මේ මැතිවරණ ක්‍රමයේ තිබෙන අඩුපාඩුවත් එක්කලා බහුතරය තිබෙන්නේ ආසන 07 යි. 50,000 ක් දිනපු ආසනය. ඒ නිසා මේ ක්‍රමයේ අඩුපාඩුවක් තිබෙනවා. මේක නිවැරදි විය යුතුයි. පළාත් සභා සඳහාත් 50% ක්‍රමය වෙනස් කරලා, නැවත ඒ පිළිබඳව සලකා බලලා කොට්ඨාශ ක්‍රමයත් එක්ක මැතිවරණය ගේන්න කියන එකත් මම මේ අවස්ථාවේදී යෝජනා කරමින් කථාව අවසාන කරනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මම ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව. අද රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා මහරගම මැතිවරණය ගැන ප්‍රකාශ කළා. අපේ මහ ඇමතිතුමාගේ ආසනය. මහරගම මැතිවරණ කොට්ඨාශය. මෙයා ගිහිල්ලා, ඉන්දියාවට ගිහිල්ලා, තිරුපති ගිහිල්ලා, දෙවියෝ බලලා, පූජා තියලා, අපේ නාම යෝජනා ප්‍රතික්ෂේප වුණාම හිතුවා, එක්සත් ජනතා නිදහස් සන්ධානය උඩින්ම දිනනවා කියලා. එක්සත් ජාතික පක්ෂය හිතුවා, මහරගම ආසනය එක්සත් ජාතික පක්ෂය උඩින්ම දිනනවා කියලා. අපේ නාම යෝජනා ප්‍රතික්ෂේප වුණත්, මහරගම බුද්ධිමත් ජනතාව මැතිවරණයේදී අපි බයිසිකලය කණ්ඩායම අංක 02 න් මහරගම ජනතාවගෙන් ඉල්ලීමක් කළා, තමුන්නාන්සේලා මේ රට බෙදනවාට විරුද්ධව,

මේ රට කඩනවාට විරුද්ධව, මේ රටේ රාජ්‍ය කප්පාදුවට විරුද්ධව, මේ රටේ රාජ්‍ය දේපළ විකුණනවාට විරුද්ධව, මේ රටේ ස්වාධීන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනුවට ෆෙඩරල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විරුද්ධව ඡන්දය පාවිච්චි කරන්න කිව්වාම, මහරගම ජනතාව පොහොට්ටුවද? අතද? අලියාද? බැලුවේ නැහැ. බයිසිකලයට ඡන්දය දුන්නා. මේ මැතිවරණ ප්‍රතිඵලය දෙන්නේ, මුළු ලංකාවටම පොහොට්ටුවට. මහින්ද රාජපක්ෂට ඡන්දය ලබා දුන්නා වාගේ මහරගම ජනතාව ඒ ඡන්දය ලබා දුන්නේ, ඇමරිකාවේ ඉන්න ට්‍රම්ප්ට විරුද්ධව. ඩයස්පෝරාවට විරුද්ධව. ඉන්දියාවේ ඉන්න රෝ සංවිධානයට විරුද්ධව. ඒ වාගේම ලංකාවේ තිබෙන මෛත්‍රීපාල සිරිසේන - රනිල් වික්‍රමසිංහ දෙමුහුන් ආණ්ඩුවට විරුද්ධව තමයි මහරගම ජනතාවට ඡන්දය දුන්නේ. ගමට ලාම්පුව දාන්න නොවෙයි. ගමට පාර හදන්න නොවෙයි. කුණු ටික එකතු කරන්න නොවෙයි. මහරගම ජනතාව ඡන්දය දුන්නේ, රටට ආදරේ බව පෙන්වන්නයි. විශේෂයෙන්ම මුළු ලෝකයටම ආදර්ශයක් පෙන්වන ඡන්දයක් බවට මේ ඡන්දය පරිවර්තනය කළා. කොඩිකාරලායි මහරගම ජනතාවයි එකම පවුලක්. ඒ නිසා මේ කෑ ගහන රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමාගේ කොට්ඨාශයේ ඡන්ද 64 යි එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයාට. ඡන්ද 64 යි. මෙන්න බලන්න. මහ ඇමතිගේ කොට්ඨාශයේ. මහ ඇමතිතුමාගේ කොට්ඨාශය මිරිහාන. මිරිහාන කොට්ඨාශයේ ඡන්ද 121 යි. මහ ඇමතිතුමාගේ කොට්ඨාශය. මහ ඇමතිතුමා එළිවෙනකල් පාරවල් හැදුවා. මේ සභාවේදී මම කිව්වා, මේ පාරවල් හදන්න, හදන්න ඡන්දය දෙන්නේ කොඩිකාරට කියලා. මේ අය හිනා වුණා.

දැන් මේ අපේ සභාවේ අය මට එදා හූ කිව්වා. දැන් නියම ප්‍රතිඵලය හම්බ වුණා. මහ ඇමති පාරවල් හැදුවා. 10% කොමිස් එක ගැහුවා. ඒ කොමිස් එක අරගෙන ඡන්දයට වියදම් කළා. ඒ කොමිස් එකෙන් රොඩ්නි ෆ්‍රේසර්ටත් ගාණක් දුන්නා. ඒ 10% න් අරගෙන ඔක්කොම පාරවල් ටික මිනිස්සු හදා ගත්තා. ඡන්දය ගැහුවා බයිසිකලයට. මහින්ද රාජපක්ෂ වෙනුවෙන් ලෝකයට පෙන්වන ඡන්දයක් බවට පරිවර්තනය කරලා මේ ඡන්දය පාවිච්චි කළා. දැන් කියනවා, කොහොමද බයිසිකලය කියලා. ඒක නීත්‍යානුකූල තත්ත්වයක්. අපි කර ගන්නම්. ඒක අපේ ප්‍රශ්නයක්. ස්වාධීන කණ්ඩායමේ නායකතුමාත් එක්ක අපි සාකච්ඡා කළා. ගිවිසුමක් ගහලා අපි ඒ ප්‍රශ්නය විසඳගන්න කටයුතු කරන්නම්. එහෙම නැත්නම් අපි කියනවා, අද මේ සභාපතිතුමාට මම නම්බුකාර විධියෙන් ඔබතුමාට ආරාධනය කරනවා, රොඩ්නි ෆ්‍රේසර්ගේ සූට් එක ගලවලා ටොමියාට අන්දන්න. මහ ඇමතිතුමා, මහ ඇමතිතුමාගේ සූට් එක ගලවලා ගෙදර යන්න කියලා මම ඉල්ලා සිටිනවා. මේ මුළු ඇමති මණ්ඩලයම පරාදයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසානයි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ සූට් එක ගලවලා ගෙදර යන්න ඕනෑ. ගාමිණී තිලකසිරි ඇමතිතුමා පරාදයි. රංජිත් සෝමවංශ ඇමතිතුමා පරාදයි. වනිගරත්න ඇමතිතුමාගේ බෑණා - ලේකම්තුයි, දුවයි දෙන්නාම පරාදයි. ගාමිණී තිලකසිරි ඇමතිතුමාගේ මල්ලි පරාදයි. රංජිත් සෝමවංශ ඇමතිතුමාගේ අය පරාදයි. සුමිත්ලාල් මැන්දිස් ගරු ඇමතිතුමාගේ අය පරාදයි. එහෙම නම් මේ පළාත් සභාව නීත්‍යානුකූල පළාත් සභාවක් නොවෙයි. මහජන ඡන්දයෙන් ප්‍රතික්ෂේප කරපු කැබිනට් මණ්ඩලයක් නිසා මේ කැබිනට් මණ්ඩලය වහාම අස් කරලා, නව කැබිනට් මණ්ඩලයක් පත් කරන්න කියලා මම මේ සභාවටත්, ජනාධිපතිතුමාටත් යෝජනා කරනවා. නව කැබිනට් මණ්ඩලයක් පත් කරන්න කියලා ඉල්ලමින්. මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව ස්තුතිය ප්‍රකාශ කරනවා. (බාධා කිරීම්) එක කොට්ඨාශයක් දිනා ගන්න බැරි වුණු ඇමතිවරු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාව අවසන් කරන්න. කාලය ඉවරයි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එක කොට්ඨාශයක් දිනා ගන්න බැරි වුණු ඇමතිවරු කියලා කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහොම ස්තුතියි.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මගේ නම කියලා කථා කරපු නිසා මම කථා කරන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, දැන් මේ මැතිවරණ ක්‍රමය ගැන හරියට එක එක්කෙනා කථා කළා. මගේ නම සඳහන් වුණු නිසා මම මේ කථා කරන්නේ. හැබැයි, යුතුකමක් තිබුණා, මහරගම මැතිවරණ කොට්ඨාශයේ පොහොට්ටුව නාම යෝජනා ප්‍රතික්ෂේප වුණාට පස්සේ අපේ හිටපු ගරු ජනාධිපතිතුමාට යුතුකමක් තිබුණා, මේ ඉසුරු දේවප්‍රියලා ජනාධිපතිතුමාව දිනවන්න තුන් වතාවක් වැඩ කළා. තුන් වතාවක් වැඩ කරලා ජනාධිපතිතුමාව දිනවන්න වැඩ කරපු කෙනෙක් මෙතුමා. පැරදුනා නම් සද්ද නැතිව ඉන්න තිබුණා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පරද්දවන්න බයිසිකලයකට ඡන්දය දෙන්න කිව්වා. මේ අසානයේ ජනතාව බයිසිකලයට - හිතනවා ඇති මේගොල්ලෝ දිනුවා කියලා. පට්ටපල් හොරු. වංචාකාරයෝ. දූෂකයෝ. අල්ලස් ගත්ත අය වැඩි ප්‍රමාණයක් හිටියේ. උදාහරණයක් වශයෙන් වලල්ලාවිට ප්‍රාදේශීය සභාව ගන්න කෝ? අද නඩුව තිබෙනවා. පොහොට්ටුවේ අයත් විරුද්ධයි එයාව සභාපති කරනවාට. මේ ඡන්දය දුන්නේ මිනිස්සුන්ට නොවෙයි. පොල් ලෙලිවලට. ගරු සභාපතිතුමනි, ජනතාව ඡන්දය දීලා තිබෙන්නේ පොල් ලෙලි වලට. අර බන්දුල ගුණවර්ධන මැතිතුමා කියපු කථාව සහතික ඇත්ත. ඒ වාගේම මගේ බෑණා ඡන්දය ඉල්ලුවේ නැහැ. (බාධා කිරීම්) මල්ලි ඡන්දය ඉල්ලුවා. මේක බරපතළ වැරැද්දක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හිත් අමනාප වීම ගැන කනගාටු වෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

හෝමාගම එක කොට්ඨාශයක් දිනා ගන්න බැරි වුණා.

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

මේ අනවශ්‍ය කථා නේ? වලල්ලාවිට ගැනයි - අපේ සීයලාගේ කාලයේ ඉඳලා අපි පරම්පරාවෙන් දේශපාලනය කරලා තිබෙනවා. අපි මේ මහින්ද මහත්තයාට වැඩ කරපු මිනිස්සු. මතක තියා ගන්න. අපි දැන් වැඩ කරන්නේ නැහැ. අපි දැන් වැඩ කරන්නේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට. (බාධා කිරීම්) වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ සභාපති අමු හොරෙක්. වලත්තයෙක්. මේ වාගේ මිනිස්සුන්වද අපි ආපහු සභාපතිවරු හැටියට පත් කරන්නේ. මට පොහොට්ටුවේ මන්ත්‍රීවරු කථා කරලා කියනවා, කොහොමද අපි මෙයත් එක්ක සභාපතිකම් කරන්නේ කියලා. මගේ ආසනයේ. මම හදපු අය පොහොට්ටුවෙන් ඉල්ලලා තිබෙනවා. පැරදුනු එක ඇත්ත. තනිකර හොරු මේ. මෙතුමන්ලා මේ හොරුන්ට කතිනවා මෙතැන ඉඳගෙන.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අගලවත්ත පරාදයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වෙන්න. මීළඟට ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. විනාඩි 04 ක් තිබෙනවා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

ගරු සභාපතිතුමනි, පසුගිය 2018 මහ මැතිවරණය පිළිබඳව ජනතාව ඉතා විශේෂ ජයග්‍රාහී තීන්දුවක් ලබා දීලා, අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පක්ෂය ජයග්‍රහණය කරලා, මම හිතන්නේ, 239 කට වඩා ප්‍රමාණයකින් අපට පළාත් පාලන ආයතන ජයග්‍රහණය කරලා දීලා ලොකු සතුටක්, ලොකු ශක්තියක් ජනතාව අපට ලබා දුන්නා. මේ වන කොට අපි බෙරුවල ආසනයේ ජනතාව හැටියට විවිධ අභියෝග මැද අපි මේ මැතිවරණයට මුහුණ දුන්නේ. ඒ අභියෝගයත් එක්ක අපේ සෞඛ්‍ය අමාත්‍ය

[ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව ]

රාජිත සේනාරත්න මැතිතුමා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ශක්තිමත් කරන්න, ඒ වාගේම එක්සත් ජාතික පක්ෂය ජයග්‍රහණය කරන්න මේ දෙපිලේම නායකයින් කටයුතු කරන කොට අපේ පියල් නිශාන්ත ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා අභියෝගයක් අරගෙන, මන්ත්‍රීකම දන් දෙනවා කියලා, නැත්නම් ඉල්ලා අස් වෙනවා කියලා අරගෙන, අපි ඔක්කොම එකතු වෙලා ප්‍රාදේශීය සභාවත්, නගර සභාවත් දෙකම අතිවිශාල ජයග්‍රහණයක් කරලා ලබා දුන්නා. අපේ ජනතාවට හෘදයාංගම ස්තුතිය මේ අවස්ථාවේදී පුද කරනවා. ඒ වාගේම මේ කථා කරන සමහර මන්ත්‍රීවරු කියනවා, දැන් උදාහරණයකට ගන්න කෝ -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

මහරගම - මහරගම නගර සභාවට කාපට් උඩින් කාපට් දාලා මොනවා කළත් අපේ මහින්ද රාජපක්ෂ මැතිතුමා බයසිකලෙන් ඇවිල්ලා, ඒ කාපට් උඩින් ඇවිල්ලා මහරගම ස්වාධීන කණ්ඩායමත් ජයග්‍රහණය කරලා අද කොඩිකාර මන්ත්‍රීතුමාට ශක්තිය දුන්නා. අර එහා පැත්තේ ඉන්න අපේ රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා කථා කළා. ඡන්ද 84 යි නේද? ඡන්ද 84 යි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

64 යි.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

64 යි. මෙන්න කථා. මෙතැන ඉන්න මන්ත්‍රීතුමා කියනවා, කොල්ලන්ට කොල්ලෝ දෙනවා. කෙල්ලොන්ට කෙල්ලෝ දෙනවා. ඒ කාලය උදා කරන්න තමයි -

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මේක මහ ඇමතිතුමාගේ ඡන්දයක් නොවෙයි.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

මේ රට නැති කරලා, අද මම හිතන්නේ නැවත මහින්ද රාජපක්ෂ මැතිතුමාට ජනතාව ශක්තිය දුන්නේ නිවැරැදි ගමනක් යන්න. ඒ අවශ්‍ය කරන ශක්තිය දෙන්න.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ඔය ඔරලෝසුවේ බට්ටා එහෙට ගිහිල්ලා මෙහෙට එනවා. පෝය හයයි ඕනෑ.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

රටේ සමස්ත ජනතාවට අපි ස්තුතිය පුද කරනවා. ඒ පුද කරන ගමන්ම මේ මැතිවරණය මේ ආකාරයෙන්ම ගෙනැල්ලා අවුරුද්දක් වැනි කෙටි කාලයක් තුළ පොහොට්ටුව ලකුණ ගෙනැල්ලා පක්ෂය ඇති කරලා කටයුතු කරපු බැසිල් රාජපක්ෂ මැතිතුමාට, ඒ වාගේම ඒ වෙනුවෙන් කටයුතු කරපු අපේ පක්ෂයේ නායක ජී.එල්. පීරිස් මැතිතුමාට, අපි හෘදයාංගම ස්තුතිය පුද කරනවා. පුද කරන ගමන් අපි ඉල්ලා සිටිනවා. අපට අවශ්‍ය කරන්නේ දැන් මේ මැතිවරණ ක්‍රමය - මගේ පෞද්ගලික මතය මේ කොට්ඨාශ මැතිවරණයට මම නම් කැමති නැහැ. අපි ඉල්ලා සිටිනවා, පළාත් සභාවේ මැතිවරණයත් මේ තිබෙන විධියටම තියන්න. අපි එකතු වෙලා මෙලෙස කටයුතු කරන්න ඉල්ලීමක් ජනාධිපතිතුමාගෙන් කරන්න ඕනෑ. මොකද, මේ ක්‍රමයේදී සමහරු කෑ ගහනවා. හොරුන්ව දැම්මාලු. මංකොල්ලකාරයෝ දැම්මාලු. කුපාඩියෝ දැම්මාලු කියලා. මේ කථාව තමුන්නාන්සේලා කථා කරන කොට මම හිතන්නේ තමුන්නාන්සේලා මතක තියා ගන්න ඕනෑ, උඩ බලලා කෙළ ගැහුවොත් ඒ හැමෝගේම මූණට වැටෙන්නේ. මේ හැම පක්ෂයම මේ දේ කළා. කවුරුත් නොකරන අය නොවෙයි. හැම කෙනෙක්ම කළා. එහෙමනම් ඒක දැන ගන්න ඕනෑ පක්ෂයේ නායකයෝ. ඒ නිසා කථා කරන කොට මට මතක් වෙනවා. මේ පාර අයවැයේදී දොම්පේ ආසනය ගැන කථා කළා. මම තමයි මේ ඔක්කොටම ඉංග්‍රීසි උගන්වලා මුළු දොම්පේ ආසනය හැදුවේ කිව්වා. බලන කොට දොම්පේ ආසනය අද ඔක්කොම පරාදයි. අද මෛත්‍රී මලෝ කියලා තමයි කියන්න වෙන්නේ. ඒ පැත්තෙනුත් අපේ මන්ත්‍රීතුමා

කථා කළා. ඒ පැත්තෙනුත් මෛත්‍රී මලෝ කියලා තමයි, අප්පච්චි මළා වාගේම තමයි. දැන් අද අපට කියන්න තිබෙන්නේ ඒ ටික තමයි. ඒ නිසා කාට හරි කථා කරන කොට අගෞරවයක් නොවන විධියට කථා කරන්න. මම හිතන්නේ මේ ඉන්න මන්ත්‍රීවරු පුරුදු වෙන්න ඕනෑ. තමන් තමන් විසින්ම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ගම්පහ දිස්ත්‍රික්කය ගැන කථා කරන්න එපා. ගම්පහ දිස්ත්‍රික්කය ගැන කථා කරන්න එපා. ගම්පහ දිස්ත්‍රික්කයේ ආසන සම්බන්ධව ඔබතුමා කථා කරන්න එපා. අයිතියක් නැහැ. දොම්පේ ආසනය ගැන ඔබතුමා කරන්න ඕනෑ නැහැ නේ.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

තමුන්නාන්සේලාට මතක් කරනවා. අපි සියලුම දෙනා මන්ත්‍රීවරු හැටියට මේ මැතිවරණය වෙනුවෙන් ඇප කැප වෙලා කටයුතු කළා. ඒ කටයුතු කරන කොට තම තමන්ගේ පක්ෂය ජයග්‍රහණය කරන්න තම තමන් කටයුතු -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

විනාඩි 04 ඉවරයි.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

මේ මොකා දින්නත් මැට්ටා මැට්ටමයි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

වෙලාව ඉවරයි.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

මේකා මැට්ටා. ගොං බිජ්ජා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

දොම්පේ ආසනයම විනාශ කරලා, දොම්පේ ආසනයේ මිනිස්සුන්ට බොරු කියලා අද සත පහකට ගණන් ගන්නේ නැති මන්ත්‍රීවරයෙක් බවට පත් කරලා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

වෙලාව ඉවරයි.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

අපි කියනවා, තමුන්නාන්සේ කරුණාකරලා -

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

මැට්ටා මැට්ටමයි . ගොං බිජ්ජා ගොං බිජ්ජමයි.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

ඔය වියදම් කරන සල්ලි පැත්තකට දාලා ගෙදර ගිහිල්ලා බුදිය ගන්න කියලා තමයි කියන්නේ. බාර්වලින් මේ මැතිවරණය වෙනුවෙන් තමන්ගේ බාර්වලින් ගමේ ඉන්න, දොම්පේ ආසනයේ ඉන්න අහිංසක ළමයින්ට, ජනතාවට අරක්කු ටික දීලා මේ මැතිවරණය දිනන්න හැදුවා. නමුත් බැරි වුණා. මහින්ද රාජපක්ෂට ආදරය කරන ඒ මිනිස්සු ටික ඔක්කොම එකතු වෙලා මේ ජයග්‍රහණය කරා යන්න කටයුතු කළා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසානයි.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

අපි ඒ කැපවීම කරපු හැම කෙනාටම ශක්තිය, ධෛර්යය, ගෞරවය හැම කෙනාටම පුද කරනවා. බොහොම ස්තූතියි.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

කවුරු දින්නත් ගොං බිජ්ජා ගොං බිජ්ජමයි. මැට්ටා මැට්ටමයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට පැහැදිලි නැහැ. ගොං බිජ්ජා කිව්වේ. මට ඒ වචනය පැහැදිලි නැහැ.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

ගොනා ගෙත් බිජ්ජා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. මොකද හේතුව කොච්චර ඉගෙන ගත්තත් නූගත්කම පෙන්වනවා නේ. ඔළුවක් නැහැ නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කවුද ගොං බිජ්ජා කියන්නේ? කාටද ගොං බිජ්ජා කියන්නේ?

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

මේ වාගේ ගොං බිජ්ජෝ තමයි දොම්පෙට ඉංග්‍රීසි උගන්වන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වාඩි වෙන්න. පෞද්ගලික ප්‍රශ්නවලට යන්න එපා. මාගේ ජීවිත තර්ජන හේතුවෙන් ආරක්ෂාව සම්බන්ධව මොහොමඩ් ෆායිස් ගරු මන්ත්‍රීතුමාට විනාඩි 04 ක කාලයක් තිබෙනවා.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ගරු සභාපතිතුමනි, වෙලාව ලබා දීම සම්බන්ධයෙන් ප්‍රථමයෙන්ම මා ස්තුතිවන්ත වෙනවා. මම මේ කථා කරන්නේ මම හිතන විධියට මේ සභාවේ තුන් වැනි වතාවට. නැත්නම් හතරවැනි වතාවට. මගේ ජීවිතයට තර්ජනයක්, මාව ඝාතනය කරන්න පිරිසක් මාන බලාගෙන ඉන්නවා කියන එක සම්බන්ධයෙන් මම කීප වතාවක්ම මේ සභාවේ කථා කරලා තිබෙනවා. ඒ වාගේම මගේ බිරිඳ, ඒ වාගේම මගේ ලොකු දුව, ඒ වාගේම මගේ පොඩි දුව, මගේ ලොකු පුතා, පොඩි පුතා, ඇතුළු මගේ දරුවන් පස් දෙනාම - කොයි මොහොතේ හරි මාව හා මගේ බිරිඳව, දරුවන්ව ඝාතනය කරයිද කියන එක මට සැකයක් තිබෙනවා. ඒ නිසා මේ සම්බන්ධව මම කීප වතාවක්ම කථා කළා. මගේ ළඟ බුද්ධි අංශ වාර්තා තිබෙනවා. පොලිසියේ දාපු පැමිණිලි තිබෙනවා. ඒ වාගේම ආණ්ඩුවක් වෙනස් වෙන කොට බුද්ධි අංශ වාර්තා වෙනස් වෙන්නේ නැහැ. ඒක මගේ පෞද්ගලික හැඟීමක්. ඒ නිසා මම මේ සම්බන්ධව අතිගරු ජනාධිපතිතුමාට දන්වලා තිබෙනවා. ඒ වාගේම අගමැතිතුමාට දන්නවලා තිබෙනවා. ඒ වාගේම නීතිය හා සාමය පිළිබඳව ඉන්න ආරක්ෂක අමාත්‍ය සාගල රත්නායක මැතිතුමාට මම මේ සම්බන්ධව දන්වලා තිබෙනවා. ඒත් එක්කම මගේ නායක රිෂාද් බර්දුදීන් මැතිතුමා හරහා මේ සියලු දෙනාටම ලිඛිතව ලියුම් යවලා මේ සම්බන්ධව දැනුවත් කළත් මේ වන තෙක් කිසිදු ප්‍රතිචාරයක් නොලැබීම හේතුවෙන් මගේ ජීවිතය අනතුරේ කියන එක මම දැනගෙන සිටියා. පසුගිය පළාත් පාලන මැතිවරණයේදී මහ දවාලේ පවා ජීවිත රාශියක් ඝාතනය කරපු ඒ අවස්ථාව දැක්කා. ඒ වාගේම සමහර මේ දේශපාලන හස්තයන් අපේ පිටිපස්සෙන් ඉන්නවා කියන එකත් මම දැන ගත්තා. ඉන් පසුවයි සමහරක් අය පළාත් පාලන ඡන්දයේදී ජයග්‍රහණය කරලා මගේ ගේ ඉදිරිපිටට ඇවිල්ලා තමයි රතිඤ්ඤා දාලා, කෑ කෝ ගහලා ප්‍රීති ඝෝෂා නැඟුවේ. එහෙමනම් මගේ දරුවෝ ඒ වෙලාවේ මගේ බිරිඳ ඇතුළු අපි සියලු දෙනාම විශාල කම්පනයකින්, විශාල බියකින් ජීවත් වුණු එදා දවස අපට අමතක කරන්න බැහැ. ඊට එහා පැත්තේ, මීටර් 10 කට එහා පැත්තේ පොලිසිය නිහඬව බලාගෙන සිටිය අයුරුත් මම දැක්කා. ඒ නිසා මේ සම්බන්ධව අපි කිහිප දවසක් කථා කළත් ඒ කිසිම විධියකින් මට සරණක් නොලැබීම හේතුවෙන් මා නැවතත් මේ කථා කරන්නේ මගේ ජීවිතය හා මගේ දරුවන්ගේ, මගේ බිරිඳගේ ජීවිත ආරක්ෂා කර ගැනීම සම්බන්ධයෙන්. ඒ නිසා මම දේශපාලනය කරන මගේ ජනතා මෙහෙවර මට ඉදිරියට අරගෙන යන්නට කිසිම ක්‍රමවේදයක් නැතිව මම අසරණ වෙන වෙලාවල් තිබුණා.

ඒ වාගේම පසුගිය මැතිවරණයේදී මගේ ලේකම්තුමා පෞද්ගලිකව යම්කිසි ප්‍රශ්නයකට මුහුණ දෙන්නට ගිය වෙලාවේ, මගේ ලේකම් නිලාර් මහත්මයාව යම්කිසි පිරිසක් වාහනයකින් ඇවිල්ලා එතුමාව කැලි කැලි කපනවා. එතුමාව මරණවා කියලා තර්ජනය කරපු අවස්ථාවක් තිබෙනවා. එතුමාට මම නියෝග දුන්නා. පොලිසියට ගිහිල්ලා පැමිණිල්ලක් දාලා පොලිසියේ පිහිට පතන්නයි

කියලා. අපට ඒකෙනුත් සරණක් නොවුණු නිසා නැවතත් මට මේ සභාවේ මේක කථා කරන්නට සිදු වෙලා තිබෙනවා. අපි දැක්කා පසුගිය සතියේ මහා පට්ට දවාලේ අලුත්කඩේ රොක්මී ආයතනයේ අධිපතිතුමාව මහා දවාලේ වෙඩි තියලා ඝාතනය කළා. ඒ වාගේම උතුරු කොළඹ තවත් කාන්තාවකට වෙඩි තිබ්බා මම දැක්කා. ඒ නිසි අපි පැල්පත්වල ජීවත් වන අය හැටියට අපගේ ආරක්ෂාව සම්බන්ධයෙන් තවත් දැඩිව හිතන්නට වෙනවා. ඒ නිසා නිකන් අපි ඉල්ලන්නේ නැහැ. අපට ආරක්ෂාවක් ඇවැසි නැහැ. නමුත් යම්කිසි ක්‍රමවේදයකට හරි අපේ ආරක්ෂාව සම්බන්ධයෙන් දැනුවත් කරන්නට පොලිසිය ඇතුළු ඒ වගකිවයුතු අයගෙන් මා ඉල්ලා සිටිනවා. ඒ නිසා මම පසුගිය කාලවලත් සභාපතිතුමා ඇතුළු අපේ ගරු මහ ඇමතිතුමා ඒ වාගේම විරුද්ධ පක්ෂයේ නායකතුමා ඒ සියලුදෙනාටම මේ සභාවේදී මම ආයාචනා කළා. මේ සම්බන්ධව අපට උදව් කරන්න කියන එක. මේ වන තෙක් ඒ කිසිම දෙයක් නොවුණු හේතුවෙන් තමයි මට නැවතත් මේ කථා කරන්නට සිදු වෙලා තිබෙන්නේ. ඒ නිසා මා හා මගේ දරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් මීට වැඩිය ඔබගේ අවධානය යොමු කරලා මේ සභාවෙන් මම ඉල්ලා සිටිනවා. ඒ වාගේම වගකිවයුතු ජනාධිපතිතුමන්, අගමැතිතුමන්, ආරක්ෂක ලේකම්තුමා, ආරක්ෂක අමාත්‍යතුමා ඒ සියලු දෙනාවත් මතක් කරගෙන ගරු සභාපතිතුමා හරහා හෝ ලිපියක් මගින් හෝ දන්වලා අපේ ආරක්ෂාව තහවුරු කර දෙන මෙන් ඉල්ලා සිටිනවා. මේ අවස්ථාව ලබා දුන් ඔබතුමාට ස්තූතිවන්ත වෙමින් නිහඬ වෙනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, මෙය වරප්‍රසාද කමිටුවට අරගෙන එතුමාගේ ජීවිත තර්ජනය සම්බන්ධව ඇත්තටම හැඟීම්බර අවස්ථාවක්. මේ අද ඊයේ වුණු දෙයක් නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කලිනුත් වුණා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

කලිනුත් වුණා. ඒ නිසා මේ සම්බන්ධව ඔබතුමා දැඩි ක්‍රියා මාර්ගයක් ගන්න. මන්ත්‍රීවරයෙක්ට වන දෙයක් මේක. මේක කොයි පැත්තද කියලා වැඩක් නැහැ. උණාට පස්සේ වැඩක් නැහැ. අපි හෙටම තීන්දුවක් අරගෙන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සංවිධායකතුමා, අපි මීට පෙරත් අපි ගිහිල්ලා හම්බ වුණා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

අපි ගත්තා. ඔබතුමාත් එක්ක මාත් ගියා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ගිහින් හම්බ වුණා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඒ සම්බන්ධව මමත් ගියා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මට ඔබතුමා ඕක පොඩ්ඩක් ලිඛිතව දෙන්න. ඔය කාරණා ටික සඳහන් කරලා. අපි හෙට සභා කටයුතු කාරක සභාවට යොමු කරලා, කඩිනමින් මොකක් හරි -

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ගරු සභාපතිතුමනි, හොඳයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මහින්ද මහත්තයාගේ කාලයේ ආරක්ෂාව දීලා තිබුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙහෙමයි ගරු මන්ත්‍රීතුමා. පළාත් සභා මන්ත්‍රීවරුන්ට ආරක්ෂාව දීලා තිබුණේ නැගෙනහිර පළාතයි, උතුරයි විතරයි. අනික් පළාත්වල දීලා තිබුණේ නැහැ. මටත් දීලා තිබුණ ඒවා පස්සේ ඔක්කොම අයින් කළා. ඒ නිසා මේ තීරණය ගන්න ඕනෑ, ජනාධිපතිතුමා නැත්නම් ආරක්ෂක -

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ගරු සභාපතිතුමනි, අපේ සමහර අයටත් දීලා තිබුණා. උදාහරණයක් හැටියට අපේ මෙරිල් ගරු මන්ත්‍රීතුමාටත් දීලා තිබුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. නැහැ. එයාට දීලා තිබුණේ නැහැ .

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

දීලා තිබුණා. පුද්ගලිකව මම දන්න නිසා කියන්නේ. එයාටත් දීලා තිබුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමාටයි -

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

මට අවුරුදු හයකට ලබා දීලා තිබුණා.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

මෙරිල් මන්ත්‍රීතුමාට දීලා තිබුණා. මම දන්න නිසා කියන්නේ.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ගරු සභාපතිතුමා, මට අවුරුදු 06 කකාලයක් ආරක්ෂාව ලබා දීලා තිබුණා. මේ රජය ආපු ගමන් තමයි මගේ ආරක්ෂාව ඉවත් කළේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. අපි හෙට අනිවාර්යයෙන්ම ඒ සම්බන්ධයෙන් තීන්දුවක් ගන්නවා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, දිගින් දිගටම මේ ගැටලුව මතු වෙනවා. ඔබතුමාගේ කාරුණික අවධානයට යොමු කරන්නේ. ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීවරයෙක් ඔහුට වුණු විශාල අසාධාරණයක් පිළිබඳව කලින් කථා කළා. අපි සියලු දෙනාම කිව්වා ඔබතුමාට පොලිස්පතිතුමාත් එක්ක කථා කරලා ඒකට සාධාරණීයකරණය කරන්න කියලා. දැන් දිගින් දිගටම මෙවැනි දේවල් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා අපි ගියා. අපි ගිහිල්ලා පොලිස් කොමිසමේ ලේකම්තුමා හම්බවුණා. එතුමා සිද්ධිය දන්නවා. එතුමාට පැමිණිල්ලක් කළා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ඒකට යම් තීන්දුවක්, තීරණයක් ලැබුණාද කියන එක පිළිබඳව මේ සභාව දන්නේ නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

සභාපතිතුමා උසාවියක් නොවෙයි. ඒක පුද්ගලිකව කටයුතු කරන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ ගැන අපි ගිහින් සාකච්ඡාවක් පැවැත් වූවා. එතුමා අපට පොරොන්දු වුණා. ඒ කාරණාව සම්බන්ධයෙන් ලිඛිතව දෙන්න කියලා. මම හිතන්නේ ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී ක්‍රියාත්මක වෙයි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මම මීට පෙර මේක හැන්සාඩ් කරලා තිබෙනවා. මට වුණු අසාධාරණය සම්බන්ධයෙන්. අද වනතුරු ඔබතුමා පොලිස්පතිට ලියලා අපට ලියුමක් එව්වාද?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

නීතිය හැටියට පුද්ගලික යොමු කරන්න ඕනෑ.. සභාපතිතුමා උසාවියක් නොවෙයි නේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම පාරේ යන කොට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි මන්ත්‍රීතුමා. හරි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අද වනතුරු ඔබතුමා ලිපියක්වත් අපට එව්වාද? ඒ ගැන.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. න්‍යාය පත්‍රය අනුව අද දවසේ පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු තමයි තිබෙන්නේ. නමුත් රීති අංක 107 යටතේ ගරු මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ යෝජනාවට අපි අනිවාර්යයෙන්ම මේ සභාවේ සාකච්ඡාවට බඳුන් කරනවා. ඊට පෙරාතුව නවක මන්ත්‍රීවරු දෙන්නෙක් අද සභා ගර්භයට පැමිණියා. අපේ පංචරත්නම් රාම් ගරු මන්ත්‍රීතුමා මීට පෙර පැමිණියා. ඒ නිසා එතුමන්ලා මගෙන් ඉල්ලීමක් කරලා තිබෙනවා, එතුමන්ලාට විනාඩි දෙකක් හරි, තුනක් හරි දෙන්න කියලා. එතුමාගේ පණිවිඩයක් සභාව මගින් ජනතාවට ලබා දෙන්න. ඒ නිසා මුලින්ම ආරාධනා කරනවා, පංචරත්නම් රාම් ගරු මන්ත්‍රීතුමාට. ඔබතුමාගේ පණිවිඩය ඉතාම කෙටියෙන් අවසන් කරන්න.

**ගරු පංචරත්නම් රාම්**
Hon. Pancharathnam Ram

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. තුන් වැනි වතාවටත් බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රී කෙනෙක් හැටියට මේ සභාවට පත් වීම ගැන මම බොහොම සන්තෝෂ වෙනවා. ඒ වාගේම මේ අවස්ථාවේදී 2014 මැතිවරණය කාලයේදී මගේ මැතිවරණ කටයුතුවලට උදව් කරපු මගේ පවුලේ අයට, මගේ ඥාතීන්ටත්, ඒ වාගේම මගේ සංවිධායකවරුන්ට, මගේ මිත්‍රයින්ට හැම කෙනෙකුටම මගේ ස්තුතිය මේ අවස්ථාවේදී මම පුද කරන්න කැමැති වෙනවා. ගරු සභාපතිතුමනි, මේ පළාත් සභාවේ මම හිටපු කාලයේදී මගේ මේ පළාත් සභා ප්‍රතිපාදන ජනතාවට, අධ්‍යාපනයේ දියුණුව සඳහාත්, ඒ වාගේම සෞඛ්‍යය, යටිතල පහසුකම් දියුණුව සඳහාත් මම වැඩියෙන්ම වියදම් කළාය කියන එක මේ අවස්ථාවේදී මම ප්‍රකාශ කරන්න කැමති වෙනවා. ඒ වාගේම අනාගතයේත් ජනතාව වෙනුවෙන් මට මේ බස්නාහිර පළාතේ, විශේෂයෙන්ම කොළඹ දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් මගේ සේවය ඒ වාගේම ඉදිරියට අරගෙන යන්න මම බලාපොරොත්තු වන විත්තිය මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න කැමති වෙනවා.

ගරු සභාපතිතුමනි අපේ රටේ ආර්ථිකය ගැන නිතරම අපි කථා කරනවා. ආර්ථිකයේ දියුණුව ගැන කථා කරනවා. මේ පළාත් සභා තිබෙන සමහර රටවල් ගත්තාම විශේෂයෙන්ම චීන රට ගත්තාම ඒ රටවල්වල පළාත් සභාව තුළ ඒ රටේ ආණ්ඩුවට විශාල දායකත්වයක් ලැබෙන විත්තිය අපි කවුරුත් දන්නවා. මේ රටේ පළාත් සභාවල් ගත්තාම පළාත් සභාවේ යටතේ තිබෙන ආයතනවලින් ලැබෙන ඒ ආදායම්වලින් තමයි ඒ පළාත් සභාවල්වලට තිබෙන වියදම් හැම දෙයක්ම දරන්නේ කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමති වෙනවා. ඒ වාගේම අපි දන්නවා, අපේ පළාත් සභාව තුළ පාසල් ගැන මම විශේෂයෙන්ම මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න කැමති වෙන්නේ, අපේ පළාත් සභාවේ පාසල් දියුණුව සඳහා අපි වැඩි ශ්‍රමයක් අරගෙන ඒ පළාත් සභාවේ තිබෙන පාසල් අපේ දුප්පත් දරුවන් වෙනුවෙන් දියුණු කරන්න විශේෂ උවමනාවක් තිබෙන විත්තිය මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න කැමති වෙනවා. අද අපි යටිතල පහසුකම්වලට මුදල් වියදම් කරනවා. ගුවන් තොටුපලවල් හදන්න මුදල් වියදම් කරනවා. පාරවල් හදන්න මුදල් වියදම් කරනවා. ඒ හැම දෙයක්ම කරන්නේ, රටේ ආර්ථිකය ඉදිරියට වැඩි දියුණු කරන්න ඕනෑ නිසා. මම හිතන්නේ ඒ වාගේම අපි අපේ දරුවන් ගැන - විශේෂයෙන්ම ඒ දරුවන්ගේ දියුණුව සඳහා පාසල් දියුණුවට වැඩි වියදමක් කරන්න ඕනෑය කියලා මේ සභාවට මම මේ අවස්ථාවේ මගේ යෝජනාව ප්‍රකාශ කරන්න කැමති වෙනවා.

[ගරු පංචරත්නම් රාම් ]

ගරු සභාපතිතුමනි, මේ සභාවට පත්වීම ගැන සතුටු වෙන මේ අවස්ථාවේ අපි දන්නවා, මැතිවරණයට තරග කරන කාලයේදී එක එක පක්ෂවලින් අපි තරග කළාට අද අපි කොළඹ දිස්ත්‍රික්, කළුතර දිස්ත්‍රික්කය, ඒ වාගේම ගම්පහ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරු හැටියට, ජනතා නියෝජිතයෝ හැටියට එකම වහළයක් යට ඉඳගෙන අපට ජනතාවට සේවයක් කරන්න සිද්ධ වෙලා තිබෙනවා. එහෙමනම් අපි රට බෙදන එක ගැන කථා කරන්නේ නැතිව, රට කඩන එක ගැන කථා කරන්නේ නැතිව එකමුතුවෙන් ජනතාවට අපේ සේවය ඉදිරියට අරගෙන යන්න ඕනැය කියලා මේ අවස්ථාවේ මම ඉල්ලීමක් කරන්න කැමැති වෙනවා. ගරු සභාපතිතුමනි, මේ අවස්ථාව මට ලබා දීම ගැන නැවත වරක් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, ඒ වාගේම මේ සභාවේ ඉන්න හැම මන්ත්‍රීවරයෙකුටම මගේ ස්තුතිය පුද කරනවා. ඒ වාගේම මාව පත් කිරීම සඳහා උනන්දු වුණු අපේ නායකතුමා, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත් අපේ එක්සත් ජාතික පක්ෂයේ කණ්ඩායමටත්, අපේ සංවිධායකවරුන්ටත් නැවත වරක් ස්තුති කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. මමත් ඔබතුමාට සුභ පතනවා. ඔබතුමාගේ දේශපාලන ජීවිතය ඉතාමත්ම වාසනාවන්ත වේවා කියලා ප්‍රාර්ථනය කරනවා.

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට චන්ද්‍රසෝම සරණලාල් ගරු මන්ත්‍රීතුමාටත් අවස්ථාව ලබා දෙනවා.

**ගරු චන්ද්‍රසෝම සරණලාල්**
Hon. Chandrasoma Saranalal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ප්‍රථමයෙන් ස්තුතිවන්ත වෙනවා, මේ සභාවට හතරවැනි වතාවටත් මේ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට පත් කිරීම සම්බන්ධව විශේෂයෙන්ම ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාවට ස්තුති කරන්න මම මෙය අවස්ථාව කර ගන්නවා. බස්නාහිර පළාත් සභාව සඳහා තුන් වතාවක් මීරිගම ආසනය නියෝජනය කරමිනුත්, ඒ වාගේම 2014 පළාත් සභා මැතිවරණයට අත්තනගල්ල ආසනය නියෝජනය කරමිනුත් ඉදිරිපත් වෙන්න අවස්ථාව ලැබුණා. අත්තනගල්ල කියන්නේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නිජභූමිය හැටියට සලකන්නේ. නමුත් ඒ මැතිවරණයේදී මේ පවතින මනාප ක්‍රමය අනුව තමයි ඒ මැතිවරණ ප්‍රතිඵලයට මුහුණ දෙන්න වුණේ. මම අද සන්තෝෂ වෙනවා. මොකද, අත්තනගල්ල නියෝජනය කරමින් මෙතෙක් එක්සත් ජාතික පක්ෂයෙන් පළාත් සභාවට මන්ත්‍රීවරයෙක් බිහි වුණේ නැහැ. ප්‍රමාද වෙලා හරි ඒ අවස්ථාව ලැබිලා තිබෙනවා. එතැනදී මාගේ ජයග්‍රහණය වෙනුවෙන් කැප වුණු මගේ පවුලේ සියලු දෙනාම, මගේ සහෝදරයා ඇතුළු පවුලේ සියලු දෙනාටත්, ඒ වාගේම ඡන්දය ලබා දුන්න අත්තනගල්ලේ ජනතාවටත්, ඒ වාගේම මීරිගම ජනතාවටත් ගම්පහ දිස්ත්‍රික්කයේ අනිකුත් ජනතාවටත් මගේ ස්තුතිය සහ ගෞරවය ප්‍රකාශ කරනවා.

විශේෂයෙන්ම මේ අවස්ථාව වන විට මේ රටේ දින 10 කට ඉස්සෙල්ලා 10 වැනිදා මේ පළාත් පාලන ආයතන මැතිවරණය පිළිබඳව - පළාත් පාලන මැතිවරණය තියලා ප්‍රතිඵල ප්‍රකාශයට පත් වෙලා තිබෙන්නේ. අපට මතකයි, 1991 පළමුවැනි පළාත් සභා මැතිවරණයට අපි තරග කරලා මීරිගම ප්‍රාදේශීය සභාවට - මම හිතන්නේ, බහුතරයක් මන්ත්‍රීවරු මෙතැන නියොජනය වන අය පළාත් පාලන ආයතන හරහා ඇවිල්ලා ඉන්නේ. එදා ඒ තිබුණු මැතිවරණ ක්‍රමය අනුව ඒ ජන බලය ලබා ගන්න අපේ හැකියාව හා අපේ කැපවීම තමයි අවශ්‍යතාවය වී තිබුණේ. ඉතින් මෙතැනදී මම දකින දෙයක් තිබෙනවා. මොකද, හතරවැනි වතාවට මේ පළාත් සභාව නියෝජනය කිරීමේදී අපේ ගරු මන්ත්‍රීතුමන්ලා දිහා බැලුවාම, ඒ අය එක එක පාටවලින් සැරසිලා තිබෙනවා. මම දැක්කේ පළමුවැනි වතාවට තමයි. හතර වතාවක් මේ බස්නාහිර පළාත් සභාව

නියෝජනය කළත් මේ විධියේ ඇඳුමකින් සැරසිලා ඉන්නවා. ඉතින් මම බැලුවා, මොකද කියලා. මේකට හේතුව පොදුජන එක්සත් පෙරමුණ ජයග්‍රහණය කිරීම. ඉතින් මෙතැනදී මම හිතනවා, මම විශ්වාස කරන දෙයක් තමයි මොකද ජාතික මට්ටමේ මැතිවරණයක් නොවෙයි අපි ජයග්‍රහණය කරලා තිබෙන්නේ. කවුරු මොන දේ කිව්වත්. හැබැයි, අපට මම දන්න එක දෙයක් තිබෙනවා. මොකද, මේ මැතිවරණයේදී අත්තනගල්ල ආසන සංවිධායකවරයා හැටියට එක්සත් ජාතික කණ්ඩායම මම මේ මැතිවරණය මෙහෙයුව්වා. මෙතැනදී අපි දැක්ක ප්‍රධාන සටන් පාඨය තිබුණේ, 10 වැනිදායින් පස්සේ මේ රටේ අග්‍රාමාත්‍යවරයා හැටියට මහින්ද රාජපක්ෂ මැතිතුමා පත් කර ගන්නවා කියන එක. එහෙමනම් ඊයේ දිනයේදී මන්ත්‍රීවරු 113 ක් ලබා ගැනීමට අපොහොසත්වීම තුළ ඒ අගමැති සිහිනය මහින්ද රාජපක්ෂ මහත්මා ප්‍රමුඛ පොදුජන පෙරමුණේ නැවතිලා තිබෙනවා. එහෙම නැත්නම් ඒ බලාපොරොත්තුව -

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ඔබතුමා ආපු එක ගැන වර්ණනා කරන්න.

**ගරු චන්ද්‍රසෝම සරණලාල්**
Hon. Chandrasoma Saranalal

ඉවු කරන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා කියන එක මට මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න පුළුවන්. එදා මෙහෙම ක්‍රමයක් තිබුණේ නැහැ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

නවක මන්ත්‍රීවරයෙක්ගේ මංගල ප්‍රකාශය.

[සභාවේ ඝෝෂා]

**ගරු චන්ද්‍රසෝම සරණලාල්**
Hon. Chandrasoma Saranalal

මේ මැතිවරණයේදී මොකද වුණේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කරන්න එපා.

**ගරු චන්ද්‍රසෝම සරණලාල්**
Hon. Chandrasoma Saranalal

මේ මැතිවරණයේදී අපි දැක්කේ, ඒ කියන්නේ මහින්ද -

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නවක මන්ත්‍රීවරයෙක්ගේ මංගල ප්‍රකාශය.

[සභාවේ ඝෝෂා]

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ගරු මන්ත්‍රීතුමා කෝප්පෙන් නාන්න. බාල්දියෙන් නාන්න එපා.

**ගරු චන්ද්‍රසෝම සරණලාල්**
Hon. Chandrasoma Saranalal

මුද්දරයක් විතර මහින්ද රාජපක්ෂ මහත්මයාගෙයි -

[සභාවේ ඝෝෂා]

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ඉස්සෙල්ලාම කෝප්පෙන් නාලා ඉන්න. පස්සේ බාල්දියෙන් නාන්න පුළුවන්.

**ගරු චන්ද්‍රසෝම සරණලාල්**
Hon. Chandrasoma Saranalal

ඔය ආකාරයෙන් හැසිරීම තුළ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කරන්න එපා. පළමුවැනි කථාව.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

හයවැනි පාරටත් පැරදිලා ඇවිල්ලා කෑ ගහනවා. මංචනායක වාගේ වැදගත් විධියට ඉන්න කෝ.

**ගරු චන්ද්‍රසෝම සරණලාල්**
Hon. Chandrasoma Saranalal

මහින්ද රාජපක්ෂ මහත්මයා මේ රට තුළ පරාජයට පත් වෙලා තිබෙනවාය කියන එකයි මට ප්‍රකාශයට පත් කරන්න වෙලා තිබෙන්නේ.

[සභාවේ ඝෝෂා]

මේ පළාත් සභාවට පත් කරලා තිබෙන්නේ. එහෙමනම් තව මාස 10 ක් -

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ඕක තමයි යහපාලනය. යහපාලනය ඕවා නම් මහින්ද රාජපක්ෂ අගමැති තමයි.

**ගරු චන්ද්‍රසෝම සරණලාල්**
Hon. Chandrasoma Saranalal

අපට තිබෙන්නේ -

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

2015 ජනවාරි පැරදිලා පැය 24 න් අගමැති කෙරුවා. දැන් මොනවද කියන්නේ?

**ගරු චන්ද්‍රසෝම සරණලාල්**
Hon. Chandrasoma Saranalal

නියෝජනය කරන්න ලැබිලා තිබෙනවා. මම ඉල්ලීමක් කරනවා. අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අමාත්‍යවරු හතර දෙනාගෙන්. විශේෂයෙන්ම අත්තනගල්ල ජනතාව වෙනුවෙන් යම් සේවාවක් කරන්න යහපාලනය තුළ අපට ශක්තිය ලබා දෙන්න කියලා. සියලු දෙනාටම ජය වේවා කියමින් මම නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට කිත්සිරි මංචනායක ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු කිත්සිරි මංචනායක**
Hon. Kithsiri Manchanayake

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා. හය වැනි පළාත් සභාවට පරක්කු වෙලා හෝ නියෝජනය කරන්නට මාව පත් කරපු මුළුමහත් ගම්පහ දිස්ත්‍රික්කය ඇතුළු මම නියෝජනය කරන, මම සංවිධායක ධුරය දරන දිවුලපිටිය මගේ ආදරණීය ජනතාව වෙනුවෙන් මගේ අවංක ආදර ස්තූතිය පුද කරනවා. ඒ වාගේම මෙම පළාත් සභාව තුන්වැනි වතාවටත් නියෝජනය කරන්නට මගේ පක්ෂය දුන්නු දායකත්වය සහ අපේ පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා ප්‍රමුඛ ඒ සියලුම පක්ෂ නායකකාරකාදීන්ටත් මගේ අවංක ආදර ස්තූතිය පුද කරනවා. ඒ වාගේම අපි බලාපොරොත්තු වෙනවා, ඉදිරි පළාත් සභා කාලය තුළ මුළු ගම්පහ දිස්ත්‍රික්කය ඇතුළු මගේ දිවුලපිටිය ජනතාව වෙනුවෙන් මට හැකි අයුරින් ඒ කරන්නා වූ දේශපාලන කටයුතුත්, සමාජ සේවයත් කරන්න. ඒ නිසා මම මේ සභාවේ ඉන්න ගරු මහ ඇමතිතුමා ප්‍රමුඛ ගරු අමාත්‍යතුමන්ලාගෙන්, සියලුම මන්ත්‍රීතුමන්ලාගෙන්, ගරු විපක්ෂ නායකතුමා ප්‍රමුඛ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඒ සහයෝගය බලාපොරොත්තු වෙනවා. ඔබ සියලු දෙනාටම සුභ පැතුම්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොමත්ම ස්තූතියි. න්‍යාය පත්‍රානුකූලව තිබෙන්නේ පෞද්ගලික මන්ත්‍රී යෝජනා. රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියට යෝජනාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමා, රීති අත්හිටුවීමේ යෝජනාවක් තිබෙනවා. ඒකෙන් පස්සේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එහෙමනම් රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියගේ යෝජනාව පසුවට කෙරෙනවා. රීති අත්හිටුවීමේ යෝජනාව ඉදිරිපත් කිරීමට මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යෝජනාව සම්බන්ධව අදහසක් ප්‍රකාශ කරන්න තිබෙනවා. 2017 අංක 17 දරන

පළාත් සභා ඡන්ද විමසීම සංශෝධනය කිරීමේ පනත මගේ අතේ තිබෙනවා. එතකොට මේ පනත පාර්ලිමේන්තුවේ සම්මත වෙලා මේක නීතිගත වෙලා ඉවරයි. එක්කෝ මේ යෝජනාව වෙනස් වෙන්න ඕනෑ. ඒ කියන්නේ අපි හැල්ලුවට ලක් වෙනවා. දැන් මේ යෝජනාව නම් අපි මේ අද සභාවේ කාලය අරගෙන කථා බහ කරන්නේ මේක කිසි තේරුමක් නැති එකක්. නීතිමය තත්ත්වයක් නැහැ. ඉතින් ඒක නිසා අපේ කාලය අපතේ යැමක්. රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියගේ යෝජනාව තිබෙනවා. ඕනෑ නම් අපට ඒක සාකච්ඡා කරන්න පුළුවන්. නමුත් මේ සම්බන්ධව සාකච්ඡා කිරීමේ හැකියාවක් අපට නැහැ. මේක කලින් එන්න තිබුණු එකක්. මේ යෝජනාව කලින් ආවා නම් -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් මේ ඡන්ද ක්‍රමය ආවාට පස්සේ මතු වෙලා තිබෙන ප්‍රශ්නයත් එක්ක තමයි මේ යෝජනාව කරලා තිබෙන්නේ. යෝජනාවක් කරන්න කිසි බාධාවක් නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

රජයෙන් ඉල්ලා සිටීම කියලා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

එතුමාගේ අදහස කියන්න කියන්න යෝජනාවේදී.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

යෝජනාව වැරැදියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා මෙතුමා කියන විධියට සංශෝධන -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

අපට කථා කරන්න පුළුවන්. නමුත් මේ යෝජනාව වැරැදියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සංශෝධන ඇතුළත් කරලා මේ කියන විධියට -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියොජ්‍ය සභාපතිතුමනි, මම යෝජනාව කරලා තිබෙන්නේ ආණ්ඩුවට දන්වන්න කියලා. යෝජනාව ඇතුළේ එතුමාගේ අදහස කියන්න කියන්න. මේ යෝජනාව ගන්න කිසි බාධාවක් නැහැ. මොකක්ද තිබෙන බාධාව? කිසිම නීතිමය බාධාවක් නැහැ. මේකේ යෝජනාවක් කරන්න පුළුවන්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

අපි කියන්නේ මේකේ අදහස් ප්‍රකාශ කිරීමෙන් වැඩක් නැහැ. කථා කිරීමෙන් කිසිම අබමල් රේණුවක තරම්වත් ප්‍රතිඵලයක් නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

යෝජනාවක් කරන්න කිසි බාධාවක් නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

යෝජනාවක් සම්මත කරනවා නම් -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මගේ යෝජනාව තිබෙනවා. එතුමාගේ අදහස යෝජනාවේදී කියන්න කියන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඉදිරිපත් කරලා කැමැත්ත අහන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මෙතුමාගේ අදහස් අනුව ඔබතුමා කථා කරන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

එක්කෝ මේ යෝජනාව කොහේ හරි තැනකට යොමු කිරීමේ හැකියාවක් තිබෙන්න ඕනෑ. මේකට මොකක් හරි ක්‍රියා මාර්ගයක් ගන්න ඕනෑ. අපේ න්‍යාය පත්‍රවල වෙන්නේ, අපි යෝජනාවක් මොකක් හරි සම්මත කරලා ඒක කොහේටවත් යොමු කරන්න විධියකුත් නැහැ. මේක කොහාටද යොමු කරන්නේ? මේකේ කොහෙවක්වත් තැනක් නැහැ. මොකද මේක පාර්ලිමේන්තුව සම්මත කරලා නීතිගත වෙලා ඉවරයි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එතුමාගේ අදහස කියන්න, කියන්න යෝජනාව පිළිබඳ සාකච්ඡාව යද්දී. යෝජනාවක් කරන්න බාධාවක් මේකේ නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

පාර්ලිමේන්තුව සම්මත කරලා ඉවරයි. එහෙමනම් මේ පළාත් සභාවට

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මම රීති අත්හිටුවලා යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ. ඉස්සෙල්ලා යෝජනාව කරන්න දෙන්න කියනන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

අපේ අදහස් කිව්වා. ඒ කියන්නේ මේ පළාත් සභාවට කලින් එව්වා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

එතුමාගේ අදහස ඊට පස්සේ කියන්න කියන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒක නිසා කලින් අපි මේකට අදහස් කියලා තිබෙනවා. මේ පළාත් සභාවේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මේක සම්බන්ධයෙන් අලුත් අදහසක් තිබෙනවා. යෝජනාවක් කරන්න බාධාවක් නැහැ. ඔබතුමා යෝජනාව කළාම අදහස දෙන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අය කරන්න බැරි වැඩ තමයි දිගටම කියන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඔබතුමන්ලා තමයි මේ විනාශ කළේ. ඔබතුමන්ලා තමයි මේ මැතිවරණ ක්‍රමය පාර්ලිමේන්තුවේ සම්මත කරලා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර වාඩි වෙන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මහින්ද අගමැති කරන්න ගියා. දැන් දහලලා හොට බිම ඇණගෙන ඉන්නේ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පිළිබඳව කොට්ඨාශ පවා දැන් නිර්ණය කරලා තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

වාඩි වෙන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

අර ප්‍රාදේශීය සභාවේ ඡන්දයෙනුත් ජනතාව ඇන්දුවා. දැන් මේකෙනුත් ජනතාව අන්දන්න හදන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න. දැන් මේ රීති අත්හිටුවීමේ යෝජනාව සම්බන්ධව පරස්පර මත දෙකක් ක්‍රියාත්මක වෙනවා. ඒක නිසා මට රීති අත්හිටුවීමේ යෝජනාව ගන්නවාද නැද්ද කියන එක පිළිබඳව බහුතරයේ කැමැත්ත අනුව අපි මේ යෝජනාව ඉදිරිපත් කරලා, ඊට පස්සේ ඒ යෝජනාවට ඡන්දය විමසනවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පක්ෂ නායකයින්ගේ සාකච්ඡාවකින් අනතුරුව තීරණය කරන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකේ මොකක්වත් අවශ්‍ය නැහැ. යෝජනාව ගන්න පුළුවන්. යෝජනාවක් කරන්න අයිතිය නැද්ද? මේක රීති අත්හිටුවලා ගෙනාපු යෝජනාවක්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

සම්මත කරපු එකක් ඔබතුමා කොහොමද මේකේ සාකච්ඡාවට ගන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දෙපැත්තේ මත දෙකක් තිබෙනවා. ගන්න තීන්දුව මොකක්ද?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යෝජනාව වැරැදියි.

**ගරු සුනිල් ජයමිණි**
Hon. Sunil Jayamini

ඒ අය විරුද්ධ වුණාට කමක් නැහැ. සභාවේ දැන් කථා කරන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

යෝජනාව වැරැදියි කියලා එතුමාට කියන්න බැහැ. ඔබතුමා යෝජනාව ගන්නවාද නැද්ද කියලා තීන්දු කරන්න. මෙතුමා කොහොමද යෝජනාව වැරැදියි කියලා කියන්නේ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙහෙම අදහස් ඉදිරිපත් කරන්න දෙන්න බැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එක්කෙනෙක් කථා කරන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එහෙම කථා කරන්න දෙන්න බැහැ. ඔබතුමා මොන අයිතියටද මෙහෙම දෙන්නේ. ඉස්සෙල්ලා යෝජනාව ගන්න. යෝජනාවට අදහස් ප්‍රකාශ කරන්න කියන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

යෝජනාවක් ගෙන්න ඕනෑ හදිසි වැදගත්කමක් තිබෙන එකක්.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

හදිසි වැදගත්කමක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අදහස පස්සේ කථා කරමු.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

වැදගත්කමක් කෙහෙද මේ යෝජනාවේ?

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඇයි වැදගත්කමක් නැත්තේ? වැදගත්කමක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අත්හිටුවීමේ යෝජනාව ගැනීමට විවාදයකට යන්න වෙනවා.

**ගරු සුනිල් ජයමිණි**
Hon. Sunil Jayamini

මන්ත්‍රීවරු කැඳවන්න. ඉස්සෙල්ලා සීනුව ගහන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

සීනුව ගහන්න.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

මේ යෝජනාවේ හදිසි වැදගත්කමක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සීනුව නාද කරන්න.

**ගරු සුනිල් ජයමිණි**
Hon. Sunil Jayamini

සීනුව නාද කරලා මන්ත්‍රීවරු කැඳවමු.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මන්ත්‍රීවරු කැඳවන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා, විනාඩි පහකට සභාව කල් තබනවා. ගරු සභාපතිතුමාගේ කාමරයට -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි ඒකට අපි විරුද්ධයි. සභාව කල් තියන්න බැහැ. යෝජනාව ගන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාව කල් තියලා, පක්ෂ නායකයින්ගේ

[සභාවේ ඝෝෂා]

පක්ෂ නායකයින් කැඳවලා සාකච්ඡාවක් කරමු.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පක්ෂ නායකයෝ තීරණයක් ගන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

සභාවේ කැමැත්ත විමසන්න. ඡන්ද විමසන්න ඔබතුමා සීනුව ගහලා තිබෙන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

රීතිවලට යන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මහේෂ් ගරු මන්ත්‍රීතුමා, අපි පක්ෂ නායකයෝ කට්ටිය ගෙනැල්ලා -

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

බැහැ. බැහැ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

බැහැ. බැහැ. පක්ෂ නායකයෝ ඕනෑ නැහැ. මේ මන්ත්‍රීවරු කියන්නේ. මේ සභාවේ එහෙම කරන්න එපා. මොකක්ද රීතිය කියන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පක්ෂ නායකයින්ගේ රැස්වීමක් තියලා -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

එහෙම කරන්න එපා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අත්‍යවශ්‍ය දෙයක්ද කියලා කථා කරලා ගේන්න. අපට ගෙනාවත් කමක් නැහැ. නැතත් කමක් නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

යෝජනාව ගන්නවාද නැද්ද කියලා -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පක්ෂ නායකවරු කථා කරලා ගේන්න. මේ සභාව නොමඟ අරින්න එපා. ඔබතුමන්ලා කථා කරලා ගේන්න. අපට ප්‍රශ්නයක් නැහැ.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේයෝජනාවට සංශෝධනයක් දාන්න පුළුවන්ද දැන්?

**ගරු සුනිල් ජයමිණි**
Hon. Sunil Jayamini

මොන රීතිය යටතේද කථා කරන්නේ?

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මොන රීතියෙන්ද කරන්නේ. සීනුව නාද කළා. දැන් ඡන්දය තියන්න.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු නියොජ්‍ය සභාපතිතුමනි, මම සංශෝධනයක් ගේනවා. මේ ක්‍රමය සම්පූර්ණයෙන්වම අයින් කරලා පුළුවන් නම් පරණ ක්‍රමයට දිස්ත්‍රික් මැතිවරණයකට යන්න කියලා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

යෝජනාවේදී කියන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

සභාව කල් තියලා තිබෙන්නේ දැන්. විනාඩි පහකට කල් තියලා තිබෙන්නේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

යෝජනාවේදී කියන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

විනාඩි පහකට කල් තියලා තියෙන්නේ.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු නියෝජ්‍ය සභාපතිතුමා, ඔබතුමා සීනුව නාද කරලා ඉවරයි. දැන් ඡන්දය තියන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

විනාඩි පහකට කල් තියලා තියෙන්නේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඔබතුමා සීනුව නාද කළා. දැන් ඡන්දය ගන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

සීනුව නාද කරලා තිබෙන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

රීති අනුව කටයුතු කරන්න. සාකච්ඡා කරලා ගේන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

රීති අනුව කටයුතු කරන්න. සීනුව නාද කරලා තිබෙන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපට ප්‍රශ්නයක් නැහැ. මේ සභාවේ රීති අනුව කටයුතු කරන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. රීති අත්හිටුවීමේ යෝජනාව ගන්න දෙපාර්ශවයම එකඟ වෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඉදිරිපත් කරලා කැමැත්ත විමසන්න. විරුද්ධත්වයක් තිබෙනවා නම්.

## රීති අංක 107 යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 107

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඉස්සෙල්ලාම රීති අත්හිටුවීමේ යෝජනාව ඉදිරිපත් කරනවා.

*"පොදු වැදගත්කමකින් යුක්ත වූ පහද සඳහන් වන යෝජනාව 2017.02.20 දින සභාවට ඉදිරිපත් කිරීම පිණිස කාර්ය පටිපාටි රීති අංක 107 යටතේ සලසා ඇති ප්‍රතිපාදන වලට අනුකූලව හා ඊට අනුශාංගිකව කාර්ය පටිපාටි රීති 8(5), 8(6), 15(1), 15(2), 15(5), 53(2), 53(3), 57(2) හා 57(5) යන රීතින් අත්හිටුවිය යුතු යැයි යෝජනා කරනවා."*

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට යෝජනාව ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දෙනවා.

## පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :
PRIVATE MEMBERS MOTION:

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි මගේ යෝජනාව වෙන්නේ, *"කේවල හා සමානුපාතික අනුපාතය 60% ක් හා 40% ක් ලෙස වූ මිශ්‍ර ක්‍රමයක් වශයෙන් හඳුන්වා දුන් නව මැතිවරණ ක්‍රමයක් යටතේ ප්‍රථම වරට පැවති පළාත් පාලන මැතිවරණයෙහි ප්‍රතිඵලවලට අනුව පළාත් පාලන ආයතන සඳහා බහු පක්ෂ ක්‍රමයක් තුළ නියෝජිතයින් පත්ව ඇති ආකාරය අනුව එම පළාත් පාලන ආයතනයන්හි ස්ථාවර පාලනයක් පිහිටුවීම ප්‍රායෝගිකව දුෂ්කර වී ඇත. පළාත් පාලන මැතිවරණය සඳහා වන එම අනුපාතයන් මත එවැනි දුෂ්කරතාවයන් මතු වීමෙන් හෙළිවන කරුණක් වනුයේ, ඉදිරියේ මෙම ක්‍රමය යටතේ පැවැත්වෙන පළාත් සභා මැතිවරණයකදී දැනට යෝජිත පරිදි කේවල හා සමානුපාතික අනුපාතය 50% ක් බැගින් වන සේ වුවහොත් පළාත් සභාවන්හි පාලනය පිහිටුවීමේදී ද දැඩි අස්ථාවර තත්ත්වයකට මුහුණ දීමට සිදු විය හැකි බවය. එබැවින් පළාත් සභා මැතිවරණ ක්‍රමය සකස් කිරීමේදී කේවල හා සමානුපාතික නියෝජනයේ අනුපාතය 70% ක් හා 30% ක් වශයෙන් වන පරිදි එම මැතිවරණ ක්‍රමය සකස් කරන මෙන් මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජයෙන් ඉල්ලා සිටී."*

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, යෝජනාව පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්න,

යෝජනාව සාකච්ඡා කිරීමට අවස්ථාවක් සලසා දීම පිළිබඳව. අපි සියලු දෙනා දන්නවා, 2003 අවුරුද්දේ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පිහිටෙව්වා, පවතින මැතිවරණ ව්‍යුහය වෙනස් කරලා, පළාත් පාලන ආයතනවලට නව මැතිවරණ ක්‍රමයක් හඳුන්වා දීම සඳහා. දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ නායකත්වයෙන් මේ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව පිහිටවනු ලැබුවා. අපි දන්නවා, අවුරුදු 13 ක් තිස්සේ මේ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව විවිධ සාකච්ඡාවලට ගිහිල්ලා, අදහස් අරගෙන, විවිධ කාරණා එක්ක දිගින් දිගට සාකච්ඡා කරමින් ඉදිරියට ආවා. ඇවිල්ලා පසුගිය අවුරුද්දට එහා අවුරුද්දේ මේ යෝජනාව පිළිබඳව කෙටුම්පත භාර දුන්නා. ඒ භාර දුන්නාට පස්සේ ඒ කෙටුම්පත භාර ගත්ත එක්සත් ජාතික පක්ෂය මේ නව මැතිවරණ ක්‍රමය හඳුන්වා දුන්නා. මේ නව මැතිවරණ ක්‍රමය හඳුන්වා දෙද්දී අපි දන්නවා, දේශපාලඥයින්ගේ අදහස් වාගේම ලංකීය බුද්ධිමතුන්ගේත් අදහස් මේ යෝජනාව සඳහා ඉදිරිපත් කරනු ලැබුවා. එහිදී අපි දන්නවා, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ හිටපු මහාචාර්යවරයෙක් තමයි පළාත් පාලන මැතිවරණ ක්‍රමය සඳහා වූ මේ යෝජනාව ඉදිරිපත් කරනු ලැබුවේ. ඒ මහාචාර්යවරයාගේ දේශපාලනය මේ මැතිවරණ ක්‍රමය සලකා බලද්දී අපි හඳුනාගත යුතු වෙනවා. ඔහු අයිති වෙන්නේ කුමන දේශපාලන පක්ෂයකටද? ඔහු නියෝජනය කරන්නේ මොන දේශපාලන පක්ෂයද? ඔහුගේ අදහස් ආවේ මොන දේශපාලන පක්ෂය ඉස්මතු කරන්න ද කියන කාරණය අපට පැහැදිලි වන අවස්ථාව තමයි මේ යෝජනාව ඉදිරිපත් කරද්දී මතු වුණු විරෝධතාවය. ජනතා විමුක්ති පෙරමුණ ඇයි මේ යෝජනාවට විරුද්ධ වන්නේ? ජනතා විමුක්ති පෙරමුණට කිසිම කොට්ඨාශයක් ලංකාවේ දිනාගන්න බැරි වෙන කොට, ඔවුන්ට සමානුපාතික නියෝජනය යටතේ තමන්ගේ නියෝජිතයා පත් කර ගැනීමේ හැකියාව ඒ මැතිවරණ ක්‍රමය ඇතුළේ තියලා තිබුණා. ඒ නිසා තමයි -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක්. මෙතුමා මම ඉදිරිපත් කරපු එක වැරදි විදියට අර්ථකථනය කරනවා. එක්කෝ මෙතුමාට ඔළුවක් නැහැ, ඒක තේරුම් ගන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඔව්. මට ඔළුවක් නැහැ. ඔළුව තිබෙන කෙනා තමයි කථා කරන්නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මම මේ යෝජනාව සම්බන්ධව කිව්වේ -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මට ඔළුවක් නැති නිසා තමයි මම ඒවා කියන්නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මේ යෝජනාව -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඔව්. ඔළුවක් නැහැ. මට ඔළුවක් නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මේ යෝජනාව පදනමක් නැති යෝජනාවක් කියන එක විතරයි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මට ඔළුවක් නැහැ. ඒ නිසා තමයි කියන්නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

නැත්නම් අපට ඕක සාකච්ඡා කළාට ප්‍රශ්නයක් නැහැ. ඒ නිසා තමයි ඉඩ දුන්නේ. නැත්නම් අපි විරුද්ධ වෙනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලංකාවේ කිසිම කොට්ඨාශයක් ජනතා විමුක්ති පෙරමුණට දිනාගන්න බැරි වුණා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒක වෙනම වැඩක්.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඒ කියන්නේ ජනතා විමුක්ති පෙරමුණට දිනාගන්න බැරි වුණේ, ජනතා විමුක්ති පෙරමුණට කිසිම කොට්ඨාශයක දිනාගන්න පුළුවන් ජනමතයක් නැති නිසා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ජනතාව නොමඟ ඇරපු එක වෙනම කථාවක්.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඒ නිසා පසුගිය කාලයේ අවලාද කිය කිය, බොරු කිය කිය මැතිවරණ ක්‍රමය -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ශ්‍රී ලංකා කොමියුනිට්ස් පක්ෂය දිනල තිබෙනවාද?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ජනතා විමුක්ති පෙරමුණේ උවමනාව මොකක්ද? එක්සත් ජාතික පක්ෂයට මුක්කු ගහලා මේ පවතින ආණ්ඩුව බලයට පත් කරන්න කටයුතු කරලා - පවතින ආණ්ඩුවේ (බාධා කිරීමක්) දේශපාලන පක්ෂයක් විධියට අද ජනතා විමුක්ති පෙරමුණ මේ රටේ දේශපාලන බිමේ අනාථ වුණු දේශපාලන පක්ෂය බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා අද ඒ අය උත්සාහ කරනවා, මේ මැතිවරණ ක්‍රමය වෙනස් වීම හරහා ඔවුන්ට නොලැබෙන වාසියක් දිනා ගැනීම සඳහා -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හීනමානයක් තිබෙන්නේ. ඔය හීනමානය අරින්න බැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මානසික ආතතිය.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කථා කරන්න අවස්ථාව දෙන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔය ලෙඩේට බෙහෙත් නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අපි හැමෝම දන්නවා, මේ මැතිවරණ ක්‍රමය ක්‍රියාත්මක වීම නිසා පසුගිය කාලයේ ආපු ප්‍රතිඵලය මොකක්ද කියලා. මේ ප්‍රතිඵලය අනුව පළාත් පාලන ආයතන රැසක් -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේ වෙන ලෙඩක් තිබෙන්නේ. පුළුවන් නම් කොමියුනිට්ස් පක්ෂය ඉල්ලලා බලන්න කෝ?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මේ 60% යි, 40% යි කියන කාරණාව අනුව බලය පිහිටුවා ගැනීමේ අපහසුවක් තිබෙනවා. ඒ අපහසුව නිර්මාණය වුණේ මේ සමානුපාතික නියෝජනයේ තිබුණු තත්ත්වයන් උඩ. කේවල කොට්ඨාශ මත 60% ක් දිනාගන්න කොට 40% ක් තමයි සමානුපාතික නියෝජනය යටතේ ඉදිරිපත් වුණේ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් අපේ සීතාවක ප්‍රාදේශීය සභාව සැලකුවාම, සීතාවක ප්‍රාදේශීය සභාවේ ඡන්ද කොට්ඨාශ 26 න් 23 ක්ම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ දිනාගන්න කොට එක්සත් ජාතික පක්ෂය දිනුවේ කොට්ඨාශ 03 යි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

සීතාවක කොමියුනිට්ස් පක්ෂය කොට්ඨාශ කීයක් දිනුම්ද? කොමියුනිට්ස් පක්ෂයට කොට්ඨාශ කීයද?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අද කොට්ඨාශ 13 ක මන්ත්‍රී ආසන 13 ක් ලබා ගැනීමට අවස්ථාව ලැබී තිබෙනවා, එක්සත් ජාතික පක්ෂයට.

[ ගරු මහේෂ් අල්මේදා ]

ඒ වාගේම එක කොට්ඨාශයක්වත් දිනා ගන්න බැරි වුණු ජනතා විමුක්ති පෙරමුණට බෝනස් ආසන තුනක් හම්බ වෙලා තිබෙනවා. ඒ නිසා බෝනස් ආසන -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා බාධා කරන්න එපා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

කොමියුනිට්ස් පක්ෂයට සීතාවක කොට්ඨාශ කීයද?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

බෝනස් ආසන නිසා මන්ත්‍රීවරු සංඛ්‍යාව සමාන තත්ත්වයට පත් වුණ් නිසා තමයි බලය පිහිටුවා ගන්න බැරි වෙන්නේ. 1991 දී ආර් ප්‍රේමදාස මැතිතුමා ඉදිරිපත් කරපු ඡන්ද ක්‍රමය අනුව පළාත් පාලන ආයතනවල බලය පිහිටුවා ගන්න පළාත් පාලන ආයතනවලට නිවැරදිව ඉඩකඩ ලැබුණා. ඒ නිසා ඒ පත් වුණු සභාපතිවරුන්ට තමන්ගේ බල ප්‍රදේශවල සංවර්ධන කටයුතු ඉතාම සාර්ථකව කර ගැනීමේ අවස්ථාව ලැබුණා. නමුත් මේ ඡන්ද ක්‍රමය අනුව ඒ අවස්ථාව ලැබෙන්නේ නැහැ. නමුත් පළාත් සභාවට යද්දී අපි දන්නවා -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හොරකම සංවර්ධනය කරගන්න ඉඩකඩ හම්බ වුණා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අපි දන්නවා, 50% 50% නියෝජනය අද ඉදිරිපත් කරන්න හම්බවුණා. අපි දන්නවා, ගුරු ගෙදරින් හොරා කාපු හැටි. ඒක අපට මේකේ කියන්න ඉඩ තියන්න එපා. ගුරු ගෙදරින් හොරා කාපු හැටි අපි දන්නවා. ඒ නිසා ඒවාට ඉඩ තියන්න එපා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

කියන්න. කියන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

රෙද්ද ගැලවෙයි. අපි කිව්වොත්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

කියන්න. කියන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඒ නිසා සද්ද නැතිව ඉන්න. අපි දන්නවා ගුරු ගෙදරින් හොරා කාපු හැටි. ඒ නිසා තමයි ගුරු ගෙදරින් ගහලා පැන්නුවේ. ගුරු ගෙදරින් ගහලා පැන්නුවේ ඒ නිසා තමයි. හොරා කාපු නිසා තමයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අර ඉන්නේ ආසනයේ නොවෙයි. කියන්න ආසනයට එන්න කියලා. මේ කථාවට බාධා කරන්න ඉස්සෙල්ලා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

කවුද? මම ආසනයේ තමයි ඉන්නේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ආසනයට එන්න කියන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මම ආසනයේ ඉන්නේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

සභාවේ රීති අනුගමනය කරන්න කියන්න. කොහෙද ඉන්නේ කියලා අහන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ආසනය හරියට දැක්කේ නැහැ. මඤ්ඤං. අද මඤ්ඤං.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

හොරා කාපු හැටි අපිට (බාධා කිරීමක්) ඕනෑ නැහැ. මහ බැංකු මංකොල්ලයට ජනතා විමුක්ති පෙරමුණ උදව් කළා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පනහ හැත්තෑව කරන්න කිව්වාම ජේ.වී.පී. එකට කේන්ති යනවා. මොකද ඒ? පොඩ්ඩක් අහගෙන ඉන්න කෝ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මහ බැංකුව මංකොල්ල කෑවේ -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කට්ටියට මඤ්ඤං අද රතු ඇඳගෙන ඇවිල්ලා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මහ බැංකුව කොල්ල කන්න උදව් කරපු දේශපාලන පක්ෂය අද අපට මේ කථා කරන්නේ. ඒ නිසා අපි ලැජ්ජා වෙනවා, ජනතා විමුක්ති පෙරමුණ ගැන.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ලැජ්ජා වෙන්න ඕනෑ ඕගොල්ලෝ. මහ බැංකු මංකොල්ලය ගැන කථා කළේ කවුද?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

කෝටි ගණන් (බාධා කිරීම්) කොහෙන්ද සල්ලි කියලා හෙළි කරන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මහ බැංකු මංකොල්ලය කවුද හෙළි කළේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

යූ.ඇන්.පී එක තමයි ජේ.වී.පී. එකට සල්ලි දුන්නේ මැතිවරණ ව්‍යාපාරය කරන්න. ඒ සල්ලි -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ආ.... ඇත්තද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කවුද යූ.ඇන්.පී එකට කඩේ ගියේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

කවුද පත්තර දැන්වීමේ හිටිය මහාචාර්යවරු. කවුද පත්තර දැන්වීම අත්සන් කරලා තිබුණු මහාචාර්යවරු. ඔක්කොම ඩොලර් කාක්කෝ. එන්.ජී.ඕ. කාරයෝ තමයි විශ්ව විද්‍යාලවල ඒ මහාචාර්යවරු. ඒ නිසා අද එන්.ජී.ඕලා.ත් එක්ක, ඒ මහාචාර්යවරුත් එක්ක තමයි දේශපාලනය -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔය ලෙඩේට බෙහෙත් නැහැ. අල්මේදාගේ ලෙඩේට බෙහෙත් නැහැ. ඕකට බෙහෙත් නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

රාජ්‍ය නොවන සංවිධාන-

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔය ලෙඩේට බෙහෙත් නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

රාජ්‍ය නොවන සංවිධාන -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඕකට ලෝකයේ කොහෙවත් බෙහෙත් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා බාධා කරන්න එපා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඒ සල්ලිවලින් තමයි - ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔය හීනමානේ කියන ලෙඩට බෙහෙත් නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

පළාත් සභාවල බලය මේ විධියට නිර්මාණය කරන්න ගියොත් පළාත් සභා එකක්වත් පරිපාලනය කරගන්න බැරිව යනවා. ඒ නිසා අපි කියනවා, සියයට පනහ පනහ නියෝජනය අහෝසි කළ යුතුයි. එහෙම නැති වුණොත් පළාත් සභා එකක්වත් බලය පිහිටුවලා මහ ඇමතිවරයෙකුට, අමාත්‍ය මණ්ඩලයකට බලය ගෙනියන්න බැරිව යනවා. ඒ නිසා 70% යි, 30% යි යෝජනාව අනුව කොට්ඨාශ මට්ටමෙන් 70% ක් මන්ත්‍රීවරු පත් වුණොත්, සමානුපාතික නියෝජනයෙන් 30% ක් මන්ත්‍රීවරු පත් වුණොත් මහජන මතය නිවැරැදිව ඒ ආයතනවල පිළිඹිබු වෙනවා. එහෙම නැති වුණොත් මහජන මතය පිළිඹිබු වෙන්නේ නැහැ. එහි විකෘතියක් තමයි පිළිඹිබු වන්නේ. ඒ වාගේම පරිපාලන කටයුතු නිවැරැදිව කරගෙන යන්න බැරිව යනවා. ඒ නිසා අපි ආණ්ඩුවට යෝජනා කරනවා. මේ ආණ්ඩුවේ වගකිවයුතු කොයි ඇමතිවරයා හරි මේකට මැදිහත් වෙලා මේ කටයුත්ත ඉෂ්ට කරන්න කියලා. එහෙම කරන්න පුළුන්කම තිබෙනවා. අපි දන්නවා, ඊයේ පාර්ලිමේන්තුවේ දේශපාලන පක්ෂ නායකයෝ එකතු වෙලා කාන්තා නියෝජනය පිළිබඳව තීන්දුවක් ගත්තා. ගරු සභාපතිතුමනි, මේ පළාත් පාලන ආයතන හදපු එකේ කාන්තා නියෝජනයේත් බරපතළ වැරැද්දක් තිබෙනවා. අපි දන්නවා, තරුණ කැරැළි දෙකටම පස්සේ ලංකාවේ ආණ්ඩු පත් කරපු කොමිෂන්වලින් දීපු තීන්දුවලින් තමයි තරුණයින්ගේ ඉච්ඡාභංගත්වය නිසා, තරුණයින්ට පාලන බලයට හවුල් වෙන්න තිබුණ අයිතිය උදුරාගත්තු නිසා තමයි තරුණ කැරැලි ඇති වුණේ කියලා. ඒ නිසා ඔවුන්ගේ ප්‍රශ්න කථා කරන්න ඔවුන්ට මේ මහජන නියෝජිත ආයතනවලට ඇතුල් වෙන්න ඉඩ තියන්න ඕනෑ නිසා තමයි තරුණ නියෝජනය වැඩි කළේ. නමුත් ඒක වෙනස් කරලා, තරුණ නියෝජනය අයින් කරලා කාන්තා නියෝජනය දැම්මා. කාන්තා නියෝජනය පත් කරද්දී අද ලොකු අර්බුදයකට ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි කියනවා. මේකේදීත් ඒ අර්බුදකාරී තත්ත්වයන් වෙනස් කරන්න. මේ නියෝජනය නිවැරැදිව, මහජන මතය නිවැරැදිව පිළිඹිබුවන ආකාරයට මේ නියෝජනය තියන්න කියලා. ඒ නිසා තමයි අපි යෝජනා කරන්නේ, 70% ක් කොට්ඨාශ මට්ටමිනුත්, 30% ක් සමානුපාතික නියෝජනයෙනුත් පත් කරලා මහජන මතය පිළිඹිබු වන පළාත් සභා ඉදිරි කාලයේ පිහිටුවන්න කටයුතු කරන්න කියලා. එහෙම වුණොත් මහ ඇමතිවරුන්ට සහ අමාත්‍ය මණ්ඩලවලට ජනතා සේවය නිවැරැදිව කරන්න පුළුවන් වෙයි. එහෙම බැරි වුණොත් මේ ආයතනත් දියාරු වී පාලනය ගෙනියන්න බැරි දියාරු ආයතන බවට පත් වෙනවා. ඒ තත්ත්වය වළක්වන්න මේ යෝජනාව ක්‍රියාත්මක කරන්න රජය කටයුතු කරන්න කියන යෝජනාව තමයි කරන්නේ. වෙලාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, බොහොමත්ම ස්තුතියි. මීළඟට සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10 ක කාලයක් ලැබෙනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

අද දවසේ මේ රීති අත්හිටුවලා මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා යෝජනාවක් ඉදිරිපත් කළා. මම දන්නේ නැහැ, මේ යෝජනාවේ තිබෙන -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සිරිකමල් ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් ඉන්න.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට වුණු අසාධාරණයක් පිළිබඳව. ගුරු මාරුවීම් පිළිබඳව අධ්‍යාපන ඇමතිතුමාට යොමු කරන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අධ්‍යාපන ඇමතිතුමා, 36(1) යටතේ ප්‍රශ්නයක්.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

දෙමළ මාධ්‍ය මුස්ලිම් පාසල්වල ගුරු මාරුවීම්වලට මන්ත්‍රීවරයෙක් හැටියට ලියුම් දුන්නාම ඒ ලියුම් ටික ඉරලා දානවා අධ්‍යාපන අධ්‍යක්ෂවරු. හැබැයි ඒක සාධාරණයි කියලා පිළිගන්න කාරණා තිබුණත් මම අවුරුදු දෙකක් කළුතර ඉඳලා කොළඹට ගුරු මාරු වීමක් ඉල්ලුවා දුන්නේ නැහැ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි,

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඉස්සෙල්ලා ප්‍රශ්නයට ඇහුම්කන් දෙන්න.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

අනිද්දාට ඔබතුමාට මට පුද්ගලිකව කියන්න. නම් සඳහන් කරන්න එපා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමතිතුමා,

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

අනිද්දාට අපි ඒ නිලධාරිනිය අමාත්‍යාංශයට කැඳවනවා. මෙතැන නම කියන්න එපා. අවශ්‍ය නැහැ.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

නම කියන්නේ නැහැ. දැන් අවුරුදු දෙකක් මම ඒ ගුරුවරිය එක්ක ගිහිල්ලා මාරුවීම ඉල්ලන කොට අවුරුදු දෙකක්ම දුන්නේ නැහැ. අසාද්සාලි මන්ත්‍රීතුමා ගිය සතියේ ඇවිල්ලා එයා කොළේ පෙන්නුවාම මාරුවීම අතේම ලියලා ගහලා දෙනවා, මාරුවීම දෙන්න කියලා. අලුත් ක්‍රමය. එතකොට මන්ත්‍රීවරුන්ට වන ගරුත්වය මොකක්ද කියලා මට අහන්න වෙන්නේ? අසාද්සාලි මන්ත්‍රීතුමාට එක නීතියක්. කොළඹ දෙමළ ගුරුවරු අතිරික්තයි කියනවා. දෙන්න බැහැයි කිව්වා, අවුරුදු දෙකක්. අසාද්සාලි මන්ත්‍රීතුමා දැක්ක ගමන් ලියුම ගහලා දුන්නා. මාරුවීමක් ලබලා අද කොළඹ උගන්වනවා. මේවා වෙනස් වෙන්න ඕනෑ, අධ්‍යාපන ඇමතිතුමා. ඒ නිසා දෙමළ භාෂා ගුරුවරු - මේ පාසල් කඩා වට්ටන්න එපා. මුස්ලිම් පාසල්. ඒ නිසා දස අවුරුදු මාරු වීම වෙනස් කරන්න, උදව් කරන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම ඉෆ්තිකාර් ගරු මන්ත්‍රීතුමාගේ අදහස ඔබතුමාට විතරක් නොවෙයි. ගරු ප්‍රධාන අමාත්‍යතුමාට විශේෂයෙන් - ගරු ඇමතිතුමා විනාඩියක් ඉන්න.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

දැන් ප්‍රායෝගිකව දෙමළ මාධ්‍ය පාසල්වල බරපතළ ගුරු හිඟයක්. ඒක මේ රංජිත් සෝමවංශ ඇමතිතුමා නිසා වුණු දෙයක් නොවෙයි. එතුමන්ලා දන්නවා, මම තමයි ගුරුවරු 140 ක් එක සැරේ දෙන්න කටයුතු කළේ.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ඒකටම මම දොස් කියනවා නොවෙයි. පාසල් වැටෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමතිතුමා,

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

විනාඩියක්. එතකොට මේ සිදුවීම මම එතුමාත් එක්ක කථා කරලා ඒ නිලධාරියා අමාත්‍යාංශයට ගෙන්නලා අවශ්‍ය පියවර ගන්නවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමතිතුමා, මේ මන්ත්‍රීතුමා කිව්වේ ඒ කථාවක් නොවෙයි. මේ මන්ත්‍රීතුමාගේ ලියමන අරන් ගියාම අර අධ්‍යක්ෂවරයා ඉරලා පැත්තකට විසි කළා කියන එක. අර මනුස්සයා ඉස්සරහා. ඒක නිසා -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඒ නිලධාරිනිය තමයි අපි අනිද්දාට ගෙන්වන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒක නිසා මම මූලාසනය වශයෙන් කියනවා. ඇමතිතුමන්ලා සියලු දෙනාටමත්. විශේෂයෙන් ප්‍රධාන ලේකම්තුමාටත්. යම් නිලධාරියෙකුට මන්ත්‍රීවරයෙක් ඇඩ්‍රස් කරලා ලියමනක් ගියාම ඒ මනුස්සයා ඉස්සරහා එහෙම ලියමනකට කරන්න එපා. ඒක භාර ගන්න. කරන්න පුළුවන් දේ බැරි දේ වෙනයි. ඒ ලියමන භාර ගන්න කියලා ඒ නිලධාරීන්ට උපදෙස් දෙන්න. ඒකයි වෙන්න ඕනෑ.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් අසාද් සාලි මන්ත්‍රීතුමාට එවලේම ලියුම ගහලා මාරු වීම ලබා දෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරන්න බැරි වුණත්, ඒ ලියමන අර මනුස්සයා ඉස්සරහා ඉරලා විසි කළාම අර මන්ත්‍රීතුමාට තිබෙන ගරුත්වය මොකක්ද? ඒ සම්බන්ධව පොඩ්ඩක් කියන්න ඕනෑ.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36(1). මටත් ඇත්තටම තිබෙනවා. මම ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම අර ගරු මන්ත්‍රීතුමා මතක් කළා වාගේ අධ්‍යාපන ඇමතිතුමා ඔබතුමා අපට මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද එහෙම කඩන්න එපා. ඔබතුමාට අපි අයවැයට අත උස්සලා ඒ ශක්තිය දෙනවා. අපි එතැනදී පක්ෂ භේද අපේ මතය අපි වෙනස් විධියට හැරෙව්වේ නැහැ. දැන් මේ ළඟදී කලාපයට කථා කරලා අර මංජුවා කියන්නේ මොකෙක්ද? ඌ කවුද? මං කවුද? එහෙම අහලා. ඇත්තටම එහෙම අහන්නේ ඔබතුමා ඇමතිතුමා නේ. මාව එහෙම අහන්න උවමනාවක් නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කේළම්.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

එහෙම නොවෙයි. ගරුත්වයක් තියන්න. අපි ඕනෑ එකක් මේක ඇතුළේ බේර ගනිමු. අපිට ගරුත්වය තියන්න. අපිත් ඇවිල්ලා තිබෙන්නේ ඔබතුමන්ලා වාගේ ඡන්දයෙන්.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මම කවදාවක්වත් එහෙම කථා කරලා නැහැ. මේක ඇතුළේ කෑ කැහුවත් මම කවදාවක්වත් - ඔබතුමා ඔය හිතේ අමාරුවට කියන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සිරිකමල් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මම සමාව ඉල්ලනවා. මම එහෙම කථා කරන්නේ නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒ බොරු. ඇමතිතුමා එහෙම කථා කරන්නේ නැහැ.

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම එහෙම කථා කරන්නේ නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඇමතිතුමා ඒවා දන්නෙත් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. කථා කරන්න.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඉන්න කෝ. ඉවර වෙනකන්. හරිද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. ඔබතුමා කථා කරන්න.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා රීති අත්හිටුවලා මේ යෝජනාව ඉදිරිපත් කළාම, මම දන්නේ නැහැ මේක කොයිතරම් දුරට අද දවසේ මේ සභාව ඇතුළේ සාකච්ඡා කරන්න මේකේ වලංගු භාවය මොකක්ද කියන එක. ඒ ගැන මම හිතන්නේ අපට වඩා හොඳට මේ සභාවේ යෝජනාව ඉදිරිපත් කරපු මන්ත්‍රීවරයා දැනගන්න ඕනෑ. මේ යෝජනාව පිළිබඳව මේ සභාවේ මීට කලින් සාකච්ඡා කෙරුවා. ඒ වෙලාවේ දරපු අදහසුයි, අද මේ පළාත් පාලන මැතිවරණයේ යම්කිසි ජයග්‍රහණයක් එතුමන්ලාගේ පාර්ශවය ලබා ගත්තාට පස්සේ එක පාරටම යම් පිබිදීමක් ඇති වෙලා, ඒ මැතිවරණ ප්‍රතිඵලත් එක්ක ගණන් හදලා තමයි අද මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ. ඒක නිසා මේකේ වලංගුභාවය පිළිබඳව මම හිතන්නේ අපට ප්‍රශ්නයක් තිබෙනවා. හැබැයි ආසාවට මේ සභාව ඇතුළේ එක එක්කෙනාගේ මත ප්‍රකාශ කරන්න අවස්ථාව දීලා තිබෙනවා. මම අපේ කණ්ඩායම් නායකතුමාගෙනුත් ඇහුවා, මොකක්ද එක්සත් ජාතික පක්ෂයේ මතය කියලා. අපි මේකට ඡන්දය දෙනවාද? විරුද්ධ වෙනවාද? මොකුත් නැහැ. ගිහිල්ලා තම තමන්ට රිසි සේ තමන්ගේ අදහස ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දීලා තිබෙනවා. ඒ නිසා මේක සත පහකට වැඩක් නැති, නිකන් මේ කාලය නාස්ති කරන මාධ්‍යයට විතරක් යන්න හදන යෝජනාවක් විධියට තමයි මම මේක දකින්නේ. මේකේ කිසිම නීත්‍යානුකූල වලංගුභාවයක් නැහැ.

හැබැයි, එතුමා කියන මේ කර්තව්‍යය ඇතුළේ පොඩි කතන්දරයක් තිබෙනවා. ඒ මොකද, මෙච්චර කාලයකට පළාත් සභා, පාර්ලිමේන්තු මැතිවරණ දිස්ත්‍රික්ක මැතිවරණයකට තමයි දිව්වේ. මිනිස්සු පුදුමාකාර විධියට සල්ලි නාස්ති කරගෙන, ඒ දිස්ත්‍රික් ඡන්ද ක්‍රමයකට ගියා. කොට්ඨාශ ක්‍රමයට මේ මැතිවරණ ගේන්න ඕනෑ කියලා මේ යහපාලන ආණ්ඩුව ඇති කරපු වෙලාවේ ඒකේ ප්‍රතිඵලයක් තමයි මේ පසුගිය දවසක තිබුණු පළාත් පාලන මැතිවරණය. ඒක ගමට වැඩ කරන, ගමේ මිනිස්සු අඳුරන ගමේ මිනිස්සු දකින අපේක්ෂකයා තමන්ගේ මන්ත්‍රීවරයා බවට පරිවර්තනය කර ගැනීම සඳහා වූ මැතිවරණයක්. හැබැයි, සමහර තැන්වල නම් අවාසනාවකට තමන්ගෙන් ඉල්ලපු අපේක්ෂකයා කවුද කියලාවත් ඒ ඡන්දය දීපු මිනිස්සු දන්නේ නැහැ. උදාහරණයක් හැටියට මහරගම. මහරගම මිනිස්සු දන්නේ නැහැ, ඡන්දය දුන්නේ තමන්ගේ කාටද කියලා. ඒ අය දුන්නේ මහින්ද රාජපක්ෂට. ඒ වාගේම තමයි සමහර අපේ කොට්ඨාශවලත් අපි මේ ඉඳලත් අපි තවම දැකලා නැහැ, කවුද මේ දිනපු මන්ත්‍රීවරයා කියලා. සංවිධායකවරු දන්නෙත් නැහැ. ඒ දුන්නේ එක මතයකට. ඒක වෙනම කතන්දරයක්. හැබැයි, මේ වෙලාවේ මේ යෝජනාවේ පනහට පනහ ආපුවාම ගණන් හදලා බැලුවා. කොහොමද අපිට දිනන්න පුළුවන් කියලා. හැබැයි මේක නොවෙයි. මැතිවරණයක් තිබෙනවා නම්, මේ රටේ මැතිවරණ තියන්න ඕනෑ එක ක්‍රමයකට. පළාත් පාලන මැතිවරණය හැටයි හතළිහයි. පළාත් සභා මැතිවරණය පනහට පනහයි. පාර්ලිමේන්තු මැතිවරණය එතකොට කොහොම තියයිද? එතකොට ඒකට කවුද කියන්නේ? ඒක කොට්ඨාශ ක්‍රමයට තියෙනවාද? සමානුපාතික ක්‍රමයට තිබෙනවාද? කවුරුත් ඒ ගැන සාකච්ඡාවක් නැහැ. ඒක පාර්ලිමේන්තුව නේ. ඒකේ ඉන්නේ අයියලා. මේකේ ඉන්නේ මල්ලිලා. ඒක හින්දා මේ මහ විකෘති ක්‍රමයක්. තිබෙනවා නම් එක ක්‍රමයයි. පාර්ලිමේන්තුවත් හැටයි හතළිහ වෙන්න ඕනෑ. පළාත් සභාවත් හැටයි හතළිහයි

වෙන්න ඕනෑ. පළාත් පාලන ආයතනත් හැටයි හතළිහයි. මොකක්ද මේ? එක එක්කෙනාට ඕනෑ ඕනෑ විධියට යෝජනා ගේනවා. ඒ නිසා මේවා පිළිබඳව අද දවසේ මේ කාලය නාස්ති කරගෙන කරන කථාවේ කිසි ප්‍රයෝජනයක් වෙන්නේ නැහැ. පොඩි දැනුම් දීමක් විතරයි කරන්නේ. මේ නීතිය සම්මත කරලා ඉවරයි.

සමහර අවස්ථාවලදී ඇත්ත වශයෙන්ම මගෙත් පෞද්ගලික විරෝධතාවයක් තිබෙනවා, මේ පනහට පනහා දාපු එක. මගේ පෞද්ගලික මතය මම මේ කියන්නේ. මොකද, එහෙම වුණාම ඇත්ත වශයෙන්ම මහජන මතය හරියට නියෝජනය වෙනවාද කියන එක පිළිබඳව පොඩි ගැටලුවක් තිබෙනවා. මම දැන් උදාහරණයක් කියන්නම්. මේ පසු වුණු පළාත් පාලන මැතිවරණයේ, දැන් එකම දේශපාලන පක්ෂයක් ඇතැම් පළාත්වල ඔක්කොම කොට්ඨාශ ටික දිනුවා. ලැයිස්තුවෙන් එකක්වත් ලැබෙන්නේ නැහැ. උදාහරණයක් වශයෙන් කොළඹ මහ නගර සභාව. එහෙම නැත්නම් වත්තල මාබෝල නගර සභාව. එක්සත් ජාතික පක්ෂය ඔක්කොම දිනුවා. ලැයිස්තුවෙන් කවුරුවත් නැහැ. හැබැයි කොට්ඨාශ දහයයි. දහයම දිනුම්. දහ දෙනයි. විපක්ෂයට හත් දෙනෙක් ඉන්නවා. එක කොට්ඨාශයක්වත් දිනලා නැහැ. මහා විකෘති ක්‍රමයක්. ඒක නිසා යම්කිසි කපීකාවක් එන්න ඕනෑ. ඒ ගැන තර්කයක් නැහැ. මේක වෙනස් කරන්න පුළුවන් නම් මේ නීතිය ආපසු - පළාත් පාලන ආයතන සඳහා අනවශ්‍ය මන්ත්‍රීවරු අති විශාල සංඛ්‍යාවක් පත් කරලා තිබෙනවා. මැතිවරණ කොමසාරිස්වරයාත් මේ නීති පිළිබඳව එක එක අවස්ථාවලදී එක එක දේවල් කියනවා. දැන් අද වන කොට කාන්තා නියෝජනය පිළිබඳව ප්‍රශ්නයක් ඇවිල්ලා තිබෙනවා. ඒක දැන් පාර්ලිමේන්තුවේ ඉන්න පක්ෂ නායකයෝ කථා කරලා කාන්තා නියෝජනය එක විධියකට හදනවා. මට තේරෙන්නේ නැහැ, මොකක්ද මේ කියලා. ඇයි කාන්තා නියෝජනයක් ඉල්ලුවේ? කාන්තා නියෝජනයක් තිබිය යුතුයි. ඇත්ත. ඒ තිබෙනවා නම් ඒ කාන්තා නියෝජනය ඒ ගැසට් කරපු විධියට තියන්න ඕනෑ. මැතිවරණයකින් පස්සේ තීරණය කරනවා, කාන්තා නියෝජනය වෙනස් කරන්න ඕනෑය කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඉතින් ඔබතුමන්ලා -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඔව්. ඒක තමයි කියන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පාර්ලිමේන්තුවේ අනික් අය නිදාගෙන හිටියද?

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

පළාත් සභා මැතිවරණය පනහ පනහ තියලා මේ අපේක්ෂිත ප්‍රතිඵල නාවොත් නායකයෝ ටික එකතු වෙලා පාර්ලිමේන්තුවේදී කථා කරලා, නැහැ මේක වෙනස් වෙන්න ඕනෑය කියලා කිව්වොත්, ඡන්දය ඉල්ලපු මිනිස්සුන්ට දෙයියන්ගේම පිහිටයි. ඒක නිසා මේ යෝජනාව පිළිබඳව කථා කරන්න තිබුණු වෙලාව පැන්නා. මේක හරියට අශ්වයා ගියාට පස්සේ ඉස්තාලය වහනවා වාගේ වැඩක් තමයි. ඒක නිසා මම දන්නේ නැහැ, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට දැන් අර ඉස්සර තිබුණු ප්‍රඥාව නැහැ. මේ සභාවට එන කාලයේ තිබුණු ප්‍රඥාව දැන් එතුමාගේ නැහැ. එතුමා දැන් අන්ධ වෙලා ඉන්නේ. අන්ධ වෙලා එතුමා කරන්නේ මොනවාද? කියන්නේ මොනවාද? කියලාවත් එතුමා දන්නේ නැහැ. ඒක නිසා එතුමාට සමාවෙන්න කියලා ඉල්ලීමක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු අනන්ද හරිශ්වන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යෝජනාවට අදහස් දැක්වීමට අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තූතියි. මම හිතන්නේ මේ යෝජනාව ගේන කොට මේ ජනතා විමුක්ති පෙරමුණ නිකන් භූමිතෙල් ගහපු ගැරඩියෝ වාගේ. (බාධා කිරීමක්) අපි ගෙනෙද්දී දැක්කා නේ. ඒකට හේතුව අද ජනතා විමුක්ති පෙරමුණක් නැහැ. කොම්පැණියක් තිබෙන්නේ. කාට හෝ කඩේ යනවා. මොනවා හරි වාසිය වැඩියෙන් එනවා නම් එතන එල්ලෙනවා. මොකද මේ ඡන්ද ක්‍රමය අනුව ජනතා විමුක්ති පෙරමුණට වැඩියෙන් මන්ත්‍රී ගණනක් එනවා. තමන්ගේ මන්ත්‍රී ගණන වැඩියෙන් එනවා නම් එතනට කඩේ ගිහිල්ලා ඒකට දුවනවා. අර රටට වෙන්නේ මොකක්ද, ආයතයට වෙන්නේ මොකක්ද

[ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා ]

ප්‍රශ්නයක් නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්තටම තිබුණු ඡන්ද ක්‍රමයට මම නම් කැමැතියි. මොකද හේතුව මේ ඡන්ද ක්‍රමයේදී ගමේ කෙනාට තමන්ගේ විරුද්ධවාදියෙක් නම් ඡන්දය ඉල්ලන්නේ ඊළඟට ඡන්දය දාන්න යන්නේ නැහැ. මොකද හේතුව, ඒක දැම්මාම එයා දිනන නිසා. අන්තිමට අර පරණ ක්‍රමය තිබුණා නම් මනාපයක් දුන්නේ නැතත් ඡන්ද ගිහිල්ලා පක්ෂයට පාවිච්චි කරනවා. ඊළඟට මනාප තුනක් තිබුණා. ඒ මනාප තුනේ දී ගමේ මිනිහාට එකක් දෙනවා. සමහරෙක් හිතනවා, මේ ජාතියේ උගත් අය මේ සභාවේ ඉන්නවා කියලා. උගත් කෙනෙකුටත් තව එකක් දෙනවා. සමහර අය කියනවා, ඒආසනය තුළ වැඩ කරන තව හොඳ කෙනෙක් ඉන්නවා. එයාටත් එකක් දෙනවා. ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය ජනතාවට හතර පාරක් දෙනවා. ඒක නැති කරලා විකෘති ක්‍රමයක් ගෙනැල්ලා මැතිවරණ කොමසාරිස්තුමාත් කියනවා, මේක හදපු එකා දැක්කා නම් මරණවා කියලා. අද මැතිවරණ කොමසාරිස්තුමාත් නන්නත්තාර වෙලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හැටයි හතළිහයි මෙහෙම නම් මම හිතන්නේ පනහට පනහ කියන එක ඉතාම විකෘතියි.

මම හිතන්නේ මේ අධ්‍යාපනය තිබෙන්නේ, පළාත් සභාවට. ලංකාවේම පාසල් දහ දාහක් විතර තිබෙනවා. ඒ දහ දාහක් තිබෙන එකෙන් 947 යි ජාතික පාසල් මධ්‍යම රජයට තිබෙන්නේ. පාසල් නව දහස් ගණනක්ම තිබෙන්නේ මේ පළාත් සභාවට. එහෙමනම් මෙච්චර මේ රටේ අධ්‍යාපනය, රටේ අනාගතය තීන්දු කරන, දරුවන්ගේ අනාගතය තිබෙන්නේ පළාත් සභාව යටතේ නම් ඒ පළාත් සභාවේ විකෘති ක්‍රමයක් ඇති වුණොත් එහෙම මහ ඇමතිවරයෙකුටවත්, එහෙම නැත්නම් ඇමතිවරයෙකුටවත් ඒ පළාත් සභා පාලනය කරන්න බැරි තත්ත්වයක් උදා වුණොත් එහෙම, අනාගතයේ මුළු පළාත් සභා සංයුතියම කඩා වැටෙනවා. ඒක නිසා මම හිතන්නේ මෙය වෙනස් වෙන්න ඕනෑ. අපේ සිරිකමල් සහෝදර ගරු මන්ත්‍රීතුමා කිව්වා, මේක ගෙනල්ලා ඉවරයි. දැන් වෙනස් කරන්න බැහැයි කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 1978 ව්‍යවස්ථාව නීති විශාරදයෝ, නායකයෝ ඔක්කොම ගෙනැල්ලා එදාට ඔබින්න තමයි ගෙනාවේ. නීති කියන ඒවා සංශෝධනය වෙනවා. ඇයි? උද්ගත වන ප්‍රශ්න උඩ තමයි නීතිය හැදෙන්නේ. මේ යෝජනා ගෙනෙද්දී කවුරුත් දැක්කේ නැහැ, ප්‍රතිඵලය. මේ පළාත් පාලන ක්‍රමයේ. දැන් ප්‍රතිඵලය පේනවා. එහෙම නම් මේ වෙනස් කරන්න, සාකච්ඡා කරන්න පාර්ලිමේන්තුවට අයිතියක් තිබෙනවා. 1978 ව්‍යවස්ථාව මේ වෙද්දී 19 වතාවක් සංශෝධනය කරලා තිබෙනවා. එහෙමනම් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇයි බැරි පාර්ලිමේන්තුවට මේ යෝජනාව සංශෝධනය කරලා හෝ රිවස් හරි කරන්න. අපිට බැහැ. අපි දන්නවා, කරන්න බැහැයි කියලා. නමුත් පාර්ලිමේන්තුවට යෝජනා කරන්න අපට අයිතියක් තිබෙනවා. මේ පළාත් පාලන ඡන්ද ක්‍රමය විකෘතියි කියලා පෙනි පෙනී, පළාත් සභාව මීට වඩා විකෘති වෙනවා කියලා පෙනි පෙනී, අර ජනතා විමුක්ති පෙරමුණ රට විනාශ වෙන කොට කට වහගෙන ඉන්නවා වාගේ අපට කට වහන් ඉන්න බැහැ. ඔබතුමන්ලා හැමදාමත් කාට හරි කඩේ යනවා. එහෙම නැත්නම් විනාශ කරන පැත්තට ගිහිල්ලා තව ගිනි පොඩ්ඩක් දීලා කුට්ටිය කඩා ගන්නවා. හැමදාම ජේ.වී.පී. කරන්නේ එහෙම තමයි. එහෙම නැත්නම් ජේ.වී.පී. ය බිහි වෙලා අවුරුදු 60 ක් විතර වෙනවා. තවම එතැනමයි. පොහොට්ටුව බිහි වෙලා මාස හයයි. ලංකාවම ඇල්ලුවා. ප්‍රතිපත්ති හොඳ නැති හින්දයි ඔබතුමන්ලා තවම එතැන ඉන්නේ. හැමදාම ලක්ෂ පහයි, හයයි ඡන්දය තියෙන්නේ. කථා කරන්න එපා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒකද විපක්ෂ නායකකම ඉල්ලන්නේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

පස්සේ බලාගමු කෝ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම හිතන්නේ මේක අපට කරන්න බැරි එක ඇත්ත. එක්සත් ජාතික පක්ෂයේ අයත් මේ මතයේ ඉන්නවා. කථා කරන්න බැරිව ගියාට. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ස්තුති කරන්න අවස්ථාවක් කර ගන්නවා. අපේ කටාන ජනතාවට. වැඩි ඡන්ද විසිදාහකින් කටාන ආසනය පොහොට්ටුව ජයග්‍රහණය කරගන්න මට ශක්තිය ලබා දුන්නා. ඒ වාගේම පළාත් සභා මන්ත්‍රීවරු හතර දෙනාත් මට උදව් කළා. ඒ සම්බන්ධයෙන් මම කටාන ජනතාවට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මෙය අවස්ථාවක් කර ගන්නවා. අපේ හිටපු ආර්ථික

සංවර්ධන ඇමති ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාට ස්තුති කරන්න. එතුමා ලංකාවේ නොවෙයි. ආසියාවේම දක්ෂ මිනිහා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

පට්ට හොරා. කම්බ හොරා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මල්වානේ ඉඩම කාගේද?

[සභාවේ ඝෝෂා]

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බැසිල් මහත්තයා පක්ෂයට ඇවිල්ලා මාස හතරයි. ලංකාවම දිනුම්. පට්ට හොරු ඔය ඉන්නේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

යෝජනාව හැත්තෑව තිහ. අර කම්බ හොරෙකුට ස්තුති කරනවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

හොරාට ලංකාවම දුන්නා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි. මීළඟට සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

අම්මට කම්බ හොරු.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම මම මේ යෝජනාව ගෙන එද්දීම කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න උත්සාහ ගත්තේ, සමහර දේවල් ගන්න ගියොතින් එහෙම මේ සභාව නිකන් ගොන් පාට් වෙනවා. විශේෂයෙන්ම බලන්න ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා ගාව යෝජනාව තිබෙනවා නම් කියවලා බලන්න. මේ යෝජනාවේ හත්වැනි පේළියේ තිබෙනවා, හත්වැනි පේළියේ මොකක්ද තිබෙන්නේ?

*"දැනට යෝජිත පරිදි කේවල හා සමානුපාතික අනුපාතය 50% ක් බැගින් වන සේ -*

යෝජිත කියන්නේ මේ අනාගතයේ වෙන්න තිබෙන එකක් වාගේ නේ හැඟෙන්නේ. දැන් මේ පනත පෙන්නුවා. අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා. ඒකේ තිබෙන එක අනුව දැන් ඒක නීතියක් බවට පත් වෙලා ඉවරයි. මේකේ යෝජිත කියන කථාවේ අපි වාද කරලත් ඉවරයි. මේ සභාවට ආවා. මේ සංවාදය මේ සභාවට ආවා. මේ සභාවට ආපු වෙලාවේ යෝජනා පරිදි අපි ඉදිරිපත් කළා. මේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියත් කිව්වා. අපේ යෝජනා සමහරක් ඒවා පළාත් පාලන පනත යටතේ අරහේ මෙහේ පිළිගෙනත් තිබෙනවා කියලා. එතකොට දැන් වැඩේ වෙලා තිබෙන්නේ ටියුබ් ලයිට් කියන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සමහර මූලික දේවල් දන්නේ නැති වුණාම. දැන් මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා වාඩි වෙලා ඉන්න සීට් එක වැරැදි එකක් කියලා කියනවා. දැන් එයා ඉන්නේ ඇත්ත සීට් එකේ. ඊට පස්සේ එයාව ගුරු ගෙදරින් පැන්නුවාය කියලා කියනවා. දැන් එයා ගුරු ගෙදර බලයේ ඉන්නේ. හරිද? එතකොට ජේ.වී.පී. එක කොට්ඨාශයක්වත් දිනලා නැහැයි කියනවා. අපි අභියෝග කරනවා. එයාට පුළුවන් නම් සොයා ගන්න. අපි දිනලා තියෙන්නේ. හරිද? ඉතින් මේ වාගේ අර බැලූ බැල්මට ජේන ගැලරියේ talks වලට ගත්තාට පස්සේ මේ යෝජනාවල තිබෙන weight එකත් අපට ජේනවා. ඉතින් ඒ නිසා ගරු සභාපතිතුමනි, මේක තනිකර වැරැදි පූර්වාදර්ශයක් සහිතව හැම පනතකටම අපේ අදහස කියලා ඕනෑ නම් මේ සභාවේ කාලය කන්න පුළුවන්. මේ විධායක ජනාධිපති ධූරයට අදාළ හොඳ යෝජනාවක් මේ මන්ත්‍රීතුමියගේ මේ න්‍යාය පත්‍රයේ තිබෙනවා අද. ඒක වාද කරන්න තිබෙන මේ ජනතා කාලය මේ විධියට කා දමන එකේ ඵලය කුමක්ද? දැන් ඔබතුමා මේ යෝජනාව කාටද යවන්නේ? මේ අදහස යවලා. මේක කිසි තේරුමක් නැති වැඩක්. මේ පත්තර මහත්වරු ටික ඕනෑ නම් පොඩ්ඩක් -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

පළාත් සභාව හැල්ලුවට ලක් වෙනවා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

භයේ දඟලනවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

භයේ නොවෙයි. තමුන්නාන්සේලා පාර්ලිමේන්තුවේ සම්මත වුණු පනතකට අදහස් ප්‍රකාශ කරනවා. අපට ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා හිනා වෙන්න එපා. මට කෑ ගහන්න එපා. මම මේ ඔබතුමන්ලාගේ අයිතිවාසිකම් වෙනුවෙන් කථා කරන්නේ. තේරුණාද? එතකොට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කථා කර කර සිටියේ, මේකේ මම අහනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ඡන්ද ක්‍රමය නිසා - මෙන්න මේ කාරණය විතරයි මට කථා කරන්න ඕනෑ. මේ ඡන්ද ක්‍රමය නිසාද මේ සභා අස්ථාවර වෙලා තිබෙන්නේ. අද මේ පාර්ලිමේන්තුව අස්ථාවර වෙලා තිබෙන්නේ මේ ඡන්ද ක්‍රමය නිසාද? පාර්ලිමේන්තුවේ තිබුණේ මේ ඡන්ද ක්‍රමයද? පාර්ලිමේන්තුව අද අස්ථාවර තත්ත්වයකට ඇද වැටිලා තිබෙනවා. පූර්ණ සමානුපාතික නියෝජනය යටතේ. එතකොට ඒකට මොකක්ද මහේෂ් ගරු මන්ත්‍රීතුමා කියන්නේ? එතකොට මම කියන්නේ, යම්කිසි ඡන්ද ක්‍රමයක් හඳුන්වලා දීලා තිබෙනවා. ඒ ඡන්ද ක්‍රමය යටතේ කවුරු මොනවා කිව්වත් කුඩා කුඩා ජන කණ්ඩායම් වලට, කුඩා කුඩා පක්ෂවලට සාධාරණ නියෝජනයක් ලබා ගැනීම තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වර්තමාන ලෝකයේ ඇති වෙලා තිබෙන වඩාම ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය. ඒක නිසා අපි පැරණි කේවළ ක්‍රමයට යනවාද? එහෙම නැත්නම් කාටත් නියෝජනයක් සහිතව එන නියෝජන ක්‍රමයකට යනවාද කියන කථාව තමයි මේක අස්සේ තිබෙන්නේ. අද පොහොට්ටුවේ මන්ත්‍රීවරු සේරම කොට්ඨාශ ටික දිනුවා කියලා, එතකොට ඒකෙන් අදහස් වෙනවාද - එතකොට මේ ක්‍රමය යටතේත් එතුමන්ලා කොට්ඨාශ දිනලා තියෙනවා. එතකොට අනිකුත් කණ්ඩායම්වලටත් යම් නියෝජනයක් ලැබිලා තිබෙනවා. ඒක තමයි අද ලෝකයේ වඩා ප්‍රජාතන්ත්‍රවාදී විධියට යන ක්‍රමය. එතකොට ඒ ක්‍රමය තව වර්ධනය කරනවා ඇරෙන්න, ඒ ක්‍රමය තව පටු කරන්න, හකුළුවන්න ක්‍රම ගේනවා නම් ඒක වැරදියි. ඒක නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි කියන්නේ මේ එකක් - මහේෂ් ගරු මන්ත්‍රීතුමා කියන්නේ මේකේ පරිණත මන්ත්‍රීවරයෙක්. මේකේ හිටපු අමාත්‍යවරයෙක්. අපි අතර දේශපාලන ප්‍රශ්න මොනවා තිබුණත් යම්කිසි කාරණාවක් මේ සභාවට ගෙන එද්දී කිසියම් වගකීමක් තිබෙන්න ඕනෑ, ගරු මන්ත්‍රීතුමා. දැන් මේ සම්මත වුණු පනතක් පිළිබඳව අපි කරන වාදයේ හරය මොකක්ද? එතකොට යම්කිසි හඬක් වෙන්න පුළුවන් වෙනත් තැනකදී. මම කියන්නේ මේ සභා කාලය. අපට වෙනත් යෝජනාවක් කථා කරන්න තිබෙන වෙලාව.

එතකොට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම අර ඊට පස්සේ කියපු කාරණාව, දැන් යම්කිසි ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා තමයි. මේ ක්‍රමය යටතේ ඇති වෙලා තිබෙන මන්ත්‍රී ධූර ප්‍රමාණයන් මේ අලුත් මැතිවරණ ක්‍රමය අස්සේ සභාව පිහිටුවීමේදී යම් ගැටලුකාරී තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒක ඇත්ත. එතකොට ඒක අපට නිවැරදි කරගත යුතු වෙනවා. ඒකත් ඇත්ත. ඒකේදී මෙහි තිබෙන සාධනීය කරුණු අරගෙන අපි ඉදිරියේදී යම්කිසි පළාත් සභා ක්‍රමයකදී හදාගන්න පුළුවන්. එහෙම නැත්නම් අපට බෝනස් ක්‍රමයක් ගේන්න පුළුවන් වෙයි. එතකොට වෙනත් වෙනත් විධියේ කළමනාකරණයේදී යම් යම් ක්‍රමයන් අනුගමනය කරන්න පුළුවන් වෙයි. නමුත් මේකේදී මේ සම්මත වුණු ක්‍රමවේදයක් පිළිබඳව කථා කරන එකේ කිසිම හරයක් නැහැ. මම හිතන්නේ මේ කථා කරන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතුමා දේශපාලනය කථා කළා මෙතැන. මෙතුමා හිටියේ නැහැ, මම අදහස් කිහිපයක් කිව්වා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි සතුටු වෙනවා. අපි තනි දේශපාලන පක්ෂයක් හැටියට තරග කරලා සන්ධාන ගහලා නොවෙයි. තනි දේශපාලන පක්ෂයක් ලෙස තරග කරලා මුළු රටේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. හත් ලක්ෂ දාසය දහස් හාරසිය විසි අටක් ඡන්ද අරන් තිබෙනවා. එතකොට මන්ත්‍රී ධූර 434 ක් අපි ජයග්‍රහණය කරලා තිබෙනවා. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාගෙන් අපි අහනවා. කොමිනිස්ට් පක්ෂය හවුලේ තරග කරලා තමුන්නාන්සේලාට මන්ත්‍රී ධූර කීයක් තියෙනවාද? කීයක් අරගෙන තියෙනවාද? ඔබතුමා පුළුවන් නම් කොමිනිස්ට් පක්ෂය විධියට තරග කරලා එක මන්ත්‍රී ධූරයක් අරගෙන

පෙන්වන්න. අපි අභියෝග කරනවා. ඊට පහුවෙනිදා ඉඳලා මම මේ බස්නාහිර පළාත් සභාවට එන්නේ නැහැ. අපි එන්නේ නැහැ. අපි හය දෙනාම එන්නේ නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

කොයි කොට්ඨාශයද දිනුවේ?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

අපි දිනලා තියෙන්නේ. ඔබතුමා හොයා ගන්න. හොයා ගන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමා දන්නේ නැහැ. ඒක හොයාගන්න.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

අභියෝගයක් කරනවාද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒක හොයාගන්න.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

අභයෝගයක් කරනවාද ඔබතුමා? අපි කොට්ඨාශ දිනලා තියෙන්නේ. ඔබතුමා අභියෝගය ගන්නවාද?

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

පානදුර වැකඩ කොට්ඨාශය දිනුම්.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

විකාර කථා කරන්න එපා. ඔබතුමා, ඔබතුමාගේ සීට් එකවත් අදුරන්නේ නැති මිනිහෙක්. දැන් මොකද කියන්නේ? නිකන් යන්න. කථා කරන්නේ නැතුව. මේ කොමිනිස්ට් පක්ෂයේ කුජීත වුණු -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

නොදන්නකමයි, ගොන්කමයි ප්‍රදර්ශනය කරන්න එපා.

[සභාවේ ඝෝෂා]

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

(බාධා කිරීම්) අවසාන වශයෙන් ගරු සභාපතිතුමනි, මේ කොට්ඨාශ ක්‍රමය ඇත්තටම අපි සංවර්ධනය කර ගත්තු ක්‍රමයක්. මේ කොට්ඨාශ ක්‍රමය ඇතුළේ පසුගිය මැතිවරණය පැවැත්වූවා. මුළු රටකම මැතිවරණයක්. ඒක අපි කාටවත් කරදරයක් වුණේ නැහැ. වියදම අතින් ගත්තාම අඩුයි. මිනිස්සුන්ට තිබෙන කරදර ප්‍රමාණය අඩුයි. මුළු රටේම මනුස්ස ඝාතනයක්වත් වුණේ නැති මැතිවරණයක්. එතකොට ඒක ගැන අපි අගය කිරීමක් තිබෙන්න ඕනැ. (බාධා කිරීමක්)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් ඒක තවදුරටත් ඉස්සරහාට වර්ධනය කර ගන්නවා ඇරෙන්න, ඒක තවත් පටු කරන්න යන ක්‍රමයක් නම් යෝජනා වෙන්නේ. මම හිතන්නේ, ඒක ඉතාමත් ඛේදනීය තත්ත්වයක්. ඒක නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි කියන්නේ, මෙවැනි පෞද්ගලික, පටු අරමුණු මුදුන් පමුණුවා ගන්න මේ සභාවට මෙවැනි යෝජනා ගේන එක තමුන්නාන්සේලාගේත් වගකීමක් තිබෙනවා. මේ යෝජනාව කියවලා බලලා, එක්කෝ නීති අංශයට යොමු කරලා, මෙහෙම පනතක් තිබෙනවාද කියලා බලලා මේක කරන්න. එහෙම නැත්නම් අඩුම තරමින් පක්ෂ නායකයන්ගේ හමුවක් කැඳවලා මේ යෝජනාව ගන්නවාද කියන එක සාකච්ඡා කරන්න. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගෙයි, මගෙයි ප්‍රශ්නයක් නොවෙයි මේක. එතකොට මේ සභාව ඉදිරියටත් මේ වාගේ නරක පූර්වාදර්ශයක් එක්ක නම් යන්නේ, මේක එපමණ හොඳ තත්ත්වයක් නොවෙයි. ඒකට ඇහුම්කන් දෙන්නේ නැතුව තමයි තමුන්නාන්සේලා අද දවසේ මේ යෝජනාව විවාදයට ගත්තේ. ඉතින් මේකේ තිබෙන අන්තර්ගතයට අපි සම්පූර්ණයෙන් විරෝධය ප්‍රකාශ කර සිටිනවා. ජනතා විමුක්ති පෙරමුණ විධියට අපි විශ්වාස කරන්නේ, මේ කේවල ක්‍රමයත් එක්කම එන සමානුපාතික නියෝජනය කුඩා කණ්ඩායමකට හරි නියෝජනයක් එන

[ගරු සුනිල් වටගල ]

විධියේ මැතිවරණ ක්‍රමයකට තමයි ජනතා විමුක්ති පෙරමුණ අත් දෙකම උස්සන්නේ. එතකොට පසුගිය මැතිවරණ ක්‍රියාවලියට අපි සම්බන්ධ වුණා. ඇත්ත. ඒ මැතිවරණ ක්‍රියාවලියට සම්බන්ධ වෙලා තමුන්නාන්සේලා ජයග්‍රහණය කළේ නැද්ද? දැන් අපට අත දික් කළා ජනතා විමුක්ති පෙරමුණ තමයි මේ මැතිවරණ ක්‍රියාවලිය හදන්න දායක වුණේ කියලා. දැන් තමුන්නාන්සේලා ජයග්‍රහණය කරලා තියෙනවා නේ? ඉතින් මොකක්ද මේකේ තිබෙන ප්‍රශ්නය? අපි කියන්නේ, ඒ තුළ තිබෙන සාධාරණත්වය කථා කරමු. ඒක නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි කියන්නේ මේ ක්‍රමය තවදුරටත් දියුණු ක්‍රමයක් බවට පත් කර ගැනීමේ වගකීම අපි කාටත් තිබෙනවා. ඒක නිසා පටු පෞද්ගලික දේශපාලන අරමුණු මුදුන් පමුණුවා ගැනීමට නම් මෙවැනි කටයුතු කරන්නේ, ඒකට ජනතා විමුක්ති පෙරමුණ (බාධා කිරීමක්) ඒකට විරුද්ධයි. බොහොම ස්තුතියි.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම අපේ උගත් බුද්ධිමත් ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමන්ලා කියනවා. මේකේ කරන්න බැරි දේවල්, මෙහෙමයි කියලා. නමුත් මෙතුමන්ලා කියනවා මේ යෝජනාව ගේන්න අවස්ථාවක් නොවෙයි කියලා. නමුත් මේක තමයි අවස්ථාව. අපි පළාත් පාලන මැතිවරණයේ කොට්ඨාශ ක්‍රමය හොඳයි. මේකේ සංඛ්‍යා ලේඛන 60% යි 40% යි කියන එක තුළ ඒකේ ඵල විපාක අපි දැකලා තිබෙනවා. ඒකේ ඵල විපාක දැක්ක මොහොතේම ඊළඟට එන පළමුවැනි පළාත් සභාව හැටියට ඒක ඊට එහා යනවා. සියයට පනහ පනහ. මෙතුමන්ලාට තිබෙන්නේ වෙනත් ප්‍රශ්නයක්. මෙතුන්ලාට ලංකාවේම 434 ක් ආවේ මේ ක්‍රමය තුළ තමයි. 30 තිබුණා නම්, මේක 150 ක්වත් වෙන්නේ නැහැ. ඒ ප්‍රශ්නය මෙතුන්ලාට තිබෙන්නේ. නමුත් එහෙම නොවෙයි. පළාත් සභාවක් වුණාම, ප්‍රාදේශීය සභාවක් වුණාම හයියට වැඩ කරන්න, ඒ ශක්තිය තිබෙන්න ඕනෑ. හොඳ හෝ නරක වෙන්න පුළුවන්. ඒකට කෑගහන්න විපක්ෂයක් තිබෙනවා. නමුත් තමන්ගේ ශක්තිය, හයිය තිබෙන්න ඕනෑ. නැත්නම් මේක නොකෙරෙන තැනට යන වැඩ පිළිවෙළක් තමයි මේකෙන් සිද්ධ වෙන්නේ. (බාධා කිරීමක්) මේකේ ගමට ආදරය කරන, මිනිස්සුන්ට ආදරය කරන, ඒ ප්‍රදේශයට ආදරය කරන මිනිස්සු ඉන්නේ භාගයයි. අනෙක් අය නිකන් මෙලෝ රහක් නැති, මිනිස්සුන්ට බය නැති, ජනතා කැමැත්තට බය නැති, පරමාධිපත්‍යයට බය නැති මිනිස්සු තමයි ඇවිල්ලා මේවා විනාශ වන වැඩ පිළිවෙළකට යන්න වෙන්නේ. එහෙම නැතුව මේ අයට එන්න පුළුවන්කමක් නැතිකම මිසක්, මේ රටේ දියුණුව සඳහා අපේ සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා කිව්වා. මේක ගෙනැල්ලා අපට දාලා කියලා. අපට දැම්මා. දැම්මේ 40% යි 60% මහත්තයෝ. ඒක පනහට පනහ දැම්මේ පාර්ලිමේන්තුවේ ඡන්දය ගන්න. අර පළාත් සභා මැතිවරණ තුන ඉස්සරහාට ගෙනියන්න වෙන සුළු පක්ෂ නොවෙයි. ඔයගොල්ලොත් ඒක පිටිපස්සේ හිටියා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔයගොල්ලෝ එකඟ වුණා නේ?

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

පස්සේ දැම්මේ. ඔයගොල්ලන්නට මතක නැහැ. අහන්න. 50% දැම්මේ කොයි වෙලාවේද කියලා දැනගන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පාර්ලිමේන්තු අය මොකද කළේ?

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ඒක තමයි. ජේ.වී.පී. එක අත් දෙකම ඉස්සුවේ. පළාත් සභාව එපා කියපු අය, වෙඩි තියනවා කියපු අය, දණහිසට යටින් වෙඩි තියනවා කියපු අය තමයි අත් දෙකම උස්සලා දුන්නේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

පොහොට්ටුවේ 52 ක් ඉඳගෙන මොකද කළේ? පොහොට්ටුවේ 52 මොකද කළේ? පොල් ගෑවද? බුදියන් හිටියාද?

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

කකුළුවා වාගේ කැගහන්නේ -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

කකුළුවො ඔයගොල්ලෝ. මහ කකුළුවෝ ඇදේට ගිහිල්ලා, පොඩි උන්ට කෙලින් යන්න කියනවා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

මේක 30 ට බැස්සොත් වෙන දේ දන්නවා. අපට ඒක ප්‍රශ්නයක් නැහැ. හරි දේ දකින්න. ජේ.වී. පී. එකට කෙල වුණේ ඒකයි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔයගොල්ලන්ගේ මහ එවුන් තමයි ඒක කළේ.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

2015 අගෝස්තු මැතිවරණයෙන් ජේ.වී.පී. එකේ -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මහ කකුළුවෝ ඇදේට ගිහිල්ලා, පොඩි එවුන්ට කෙළින් යන්න කියනවා. පාර්ලිමේන්තුවේ මහ කකුළුවෝ ඇදේට යනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙහෙම කරන එක වැරැදියි. අර බලන්න සීට් එකේ වාඩි වෙලා. මයික් එක ඔන් කරලා. මොන ලැජ්ජ නැති වැඩක්ද?

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මොකක්ද මේ සභාව? මේක සභාවක්ද?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

වෙනදා බාධා කරන්නේ නැහැ නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මයික් ඕෆ් කරන්න.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ කොට්ඨාශ ක්‍රමයේ ගැටළුවක් නැහැ. අපට හරි සන්තෝෂයි. සල්ලි වියදම් වෙන්නේ නැහැ. එක තැනකට වැඩ කරන්න පුළුවන්. නැත්නම් මේ දිස්ත්‍රික්කයක වැඩ කරන කොට අපට හම්බ වෙන්නේ ලක්ෂ 50 ද, අර එක එක්කෙනා සන්තෝෂ කරන්න මොනවා හරි සමිතියකට රුපියල් 30,000 ක් දානවා. මරණාධාර සමිතියකට තවත් 30,000 ක් දානවා. රටට ප්‍රයෝජනයක් වෙන්නේ නැහැ. හැබැයි අපට කොට්ඨාශයක් තිබෙනවා නම්, කොට්ඨාශයේ වගකීම අපට තිබෙනවා. ඒ වගකීම තුළ අපි නිදි මරාගෙන, අපට තිබෙන හයිය, ශක්තිය යොදලා අපට ඒ කොට්ඨාශය දියුණු කරන්න පුළුවන්. අපට සීමාවක් තිබෙනවා. අද කේවල් ක්‍රමයයි, සමානුපාතික ක්‍රමයයි තුළ තිබෙන ඉඩ ප්‍රමාණය මදිකමයි අපි මේ කියන්නේ. ඒ දිනන මිනිස්සුන්ට බය තිබෙනවා. මිනිස්සුන්ගෙන් පත් වන කොටස අඩුයි. දෙගොල්ලෝම එක සමානයි. එතකොට අනෙක් අයට වගකීමක් නැහැ. ඊළඟට වගකීමක් නැතිකමයි අපට තිබෙන්නේ. ඒ නිසා ඇත්තටම අපේ මන්ත්‍රීතුමන්ලාට, හොඳ ගමනක් යන්න තිබුණා. ඒක නැති වෙලා. දැන් කැගහලා වැඩක් නැහැ. එක එක තැන්වල එල්ලුනේ නැත්නම්. 2015 අගෝස්තු තිබුණු මැතිවරණයෙන් අපි හිතුවා මන්ත්‍රී ආසන 15 ක් 20 ක් ගනියි කියලා. අද වර්තමානය වනකොට තරුණ ඡන්ද එකක්වත් ගන්න බැරි වෙලා තිබෙනවා. මේ කැම්පස් එකේ ඉන්න ළමයි එළියට එනවා නම් අද ජේ.වී.පී. එක -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

අපි ගැන දුක්වෙන්න එපා. ඒක අපි බලාගන්නම්.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

කැම්පස් එකේ ඉන්න ළමයින්ගේ ඔළු මාරු කරලා, ඒ හදන තැනත් එක්ක එළියට එනකොට අද ජේ.වී.පී. ආණ්ඩුවක් තිබෙන්න -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඉතින් ඔයගොල්ලෝ සතුටු වෙන්න කෝ? ඔය හොරු ටික ඔහොමවත් නිදැල්ලේ ඉන්නේ ඒකයි.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

මිරිඟුවක් පස්සේ දුවන්නේ. ඒකයි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

අපේ 15 ක් 20 ක් හිටියා නම් ඔය හොරු එකෙකුටවත් ඉන්න දෙන්නේ නැහැ.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

මේ නීතිරීති එකක්වත් රටට ආදරේටවත්, මේ පළාත හදන්න ආපු ඒවාවත් නොවෙයි. මේ තම තමන්ගේ ගමන ගෙනියන්න, මහින්ද රාජපක්ෂට ගහන්න, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට ගහන්න කියලා තමයි මේවා හැදුවේ. නැතුව මේ නීති ගෙනාවේ ඒවාට නොවෙයි. එදා පළාත් සභා තුන ඉස්සරහාට දාගන්න. ඡන්දය ගන්න නීතිපතිතුමා කිව්වා මේකට තුනෙන් දෙකක් ඕනෑ. අපි විතරක් මදී කියලා. ඒ ඡන්දය ගන්න. අන්තිමට එකඟ නොවුණා මුස්ලිම් නායකයෙක්. එහෙම එකඟ නොවුණේ මොකටද? අපට මේකේ භාගයට භාගේ ඕනෑ. ඒකේ කාරක සභාවක් කරලා, ඒ පනත වෙනස් කරලා, ඊට ඉස්සෙල්ලා පනතත් වෙනස් කරලා තමයි එයාගේ ඡන්දය දාගෙන මේක කල් දාගන්න කළා මිසක්, රටට ආදරේට රට ඉස්සරහාට ගෙනියන්න කරපුවා නොවෙයි. අපේ සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා කිව්වාට අපට එව්වේ 60 යි 40 යි. අපට 50, 50 එව්වේ නැහැ. 50, 50 ආවා නම් අපි කොහොමත් විරුද්ධයි. අපි 60 යි 40 යටත් විරුද්ධ වුණා. අපි කිව්වා 70 යි 30 යි කරන්න කියලා. මහින්ද රජපක්ෂ මහත්තයාගේ පළාත් පාලන කාලේත් 70 යි 30 තිබුණේ. ඉස්සෙල්ලත් 70 යි 30 ට අපි හදලා තිබුණේ. මේ අය කැඟහලා 70 යි 30 ට එකඟ වුණේ නැහැ. මෙහෙමයි. සුළු පක්ෂවලට යන එනමන් නැති වනකොට තමයි, මම කිව්වේ 434 ට බහිනවා. 70 වුණා නම් එකසිය ගණනට. සාමාන්‍යයෙන් වෙනත් ක්‍රමයක් තිබුණා නම් මේ අයගේ ප්‍රමාණය සොයා ගන්නත් බැහැ. ඇත්තටම මීට වැඩිය කථා කරන්න අවශ්‍ය නැහැ. මොකද, මේ අය ලැජ්ජ වෙන්න ඕනෑ. එන්න එන්න පල්ලෙහාට බහිනකොට අද මෙතැන ඉතුරු වෙලා ඉන්නේ ජේ.වී.පී. පස් දෙනා විතරයි. ජේ.වී.පී. පස් දෙනා විතරයි. මේක වෙනස් කර ගත්තොත් කියලා බයයි. ඒ පස් දෙනා විතරයි ඉන්නේ. සමහර අයවැයවලදී පළාතේ එන්නේ නැහැ. එහෙම අය මේක දාලා අද යන්නෙත් නැහැ. කියව ගන්න එපැයි. ඒ කෙසේ වෙතත් මේ ක්‍රමය වෙනස් විය යුතුයි. අණපනත් ගෙන එනකොට, නීති ගෙන එනකොට ඒවා වෙනස් කරන්න බැරි වෙන්නේ නැහැ. පාර්ලිමේන්තුවේ එක රැයෙන්, එක පැය ගණනට කාරක සභා කරලා වෙනස් කරනවා නම්, මේවා රටට ගැළපෙන විධියට ගෙන එන්න හැමෝම එකඟ වෙන්න ඕනෑ. ඒකයි අපේ කාරණාව. රටට ගැළපෙන්න ගේන කොට අපි සියලු දෙනාම රට ගැන හිතන්න ඕනෑ. අපේ ආසනයක් ගත්තාම පාසල් ටික, ඉස්පිරිතාල ටික, පශු සම්පත් සම්බන්ධව විශාල වැඩ කොටසක් කරන, මිනිස්සුන්ට ළඟ ආයතනය MOH එක. සියලු දේටම අපේ පළාත් සභාව හරහා තමයි අපට ලොකු ශක්තියක් තිබෙන්නේ. එහෙම නම් ඒක ශක්තිමත්ව තිබෙන්න ඕනෑ. ශක්තිමත්ව තීන්දු ගන්න පුළුවන් විධියට තිබුණොත් තමයි මම හිතන්නේ මේ පළාතේ ජනතාවට සේවයක් කරන් පුළුවන් වෙන්නේ. නැත්නම් කවදාවත් සේවයක් කරන්න අපට අහු වෙන්නේ නැහැයි කියන එක විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ.

කෙසේ හෝ මොන පනතින් හරි, මොන ක්‍රමයකින් හරි මේ සමානුපාතික ක්‍රමයයි, අනුපාත ක්‍රමයයි වෙනස් විය යුතුයි. කොට්ඨාශ ක්‍රමය හොඳයි. ඒක කෙසේ හෝ කොයි ආකාරයට හරි අවශ්‍ය තැන්වලට දන්වලා කුමන විධියකින් හරි, අපි දන්නේ නැහැ ආණ්ඩුව කාට එයිද කියලා. පළාත් සභාව ජනතා විමුක්ති පෙරමුණට එන්න පුළුවන්. යූ.එන්.පී. එන්න පුළුවන්. නැත්නම් ශ්‍රී ලංකා එන්න පුළුවන්. පොදුජන පෙරමුණට එන්න පුළුවන්. කාට ආවත්, ආපු කෙනාට හරියට ගෙනියන්න පුළුවන් වටපිටාවක් ගොඩනැහෙන්න ඕනෑ. නැත්නම් තමන්ට අවාසි වනකොට එක ක්‍රමයකුත්, අනෙක් අයට වාසි වනකොට තමන්ට යන්න පුළුවන් ක්‍රමයකුත් නොවෙයි. හරි කෙනා කවුරු ආවත් මේ විධියට ශක්තිමත්ව තිබෙන්න ඕනෑ කියන එකයි මගේ යෝජනාව. බොහොම ස්තුතියි.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවට අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දීම සම්බන්ධව පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා. මට මේ විවාදයට සවන් දෙන කොට පැරණි ප්‍රස්ථා පිරුළු කිහිපයක් සිහිපත් වුණා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මිනිස්සු ඉස්සර කිව්වා කණයා නැති වළට මඩයා පණ්ඩිතයා කියලා. කිරි කලයක් දොවලා, ගොම ටිකක් කලවම් වුණාම, ඒ කිරි කලයේ වටිනාකම නැති වන හැටි කිව්වා. දැන් මේ කිහිප දෙනෙක් පමණක් ඉන්න මේ සභාව තුළ හැසිරීම් දිහා බැලුවාම, මේ ප්‍රස්ථා පිරුළු කොයි තරම් ගැළපෙනවාද කියලා මට දැනෙනවා. මොකද, හේතුව සමහරවිට කෙනෙකුට කථා කරන්න බැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් වැරදුණා. ලූලා නැති වළට කණයා පණ්ඩියා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

හරි. සමාවෙන්න. පිළිගන්නවා. ඔබතුමාට බොහොම ස්තුතියි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ මැතිවරණ ක්‍රම සංශෝධනය පිළිබඳව අද කළ කථාබහ මේ රටේ ජනතාවට මොන තරම් වැදගත් වෙනවාද කියන කාරණාවයි අපට වැදගත් වෙන්නේ. මේ දේශපාලන පක්ෂවලට නොවෙයි මේ ප්‍රශ්නය වැදගත් වෙන්නේ. රටේ සමස්ත ජනතාවට. පණ්ඩුකාභය රජතුමාගේ කාලයේ ඉඳලා පළාත් පාලන මැතිවරණ රටාව සකස් වුණේ, රටේ පාලනයට පහසු වන ආකාරයටත්, රටේ ජනතාවට ඉන් යහපත් ප්‍රතිඵල අත්පත් කර දීම සඳහාත් ගැළපෙන ක්‍රමවේදයන් සකස් කිරීමට. මේකට කදිම උදාහරණයක් තිබෙනවා. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. 78 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් (බාධා කිරීමක්) ඉතා නිහතමානීව වැරැද්ද පිළි අරගෙන නිවැරදි කිරීම සම්බන්ධව ස්තුති කළා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කථා කරන්න. ඒක ගැන හිතන්න එපා.



**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ඒක සදාචාර සම්පන්න නොවන කාරණාවක්ද කියලා තමයි මට අහන්න තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම පැහැදිලි කළා වාගේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් හඳුන්වා දීපු සමානුපාතික මැතිවරණ රටාව තුළ එවකට හිටපු ගරු ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා අපේක්ෂා කළේ, ඡන්ද පදනම මත තමන්ගේ පක්ෂයේ ජයග්‍රහණය අඛණ්ඩව පවත්වාගෙන යෑමට. ඒක රටේ බහුතරයක් ජනතාවගේ සුභසිද්ධිය සඳහාමද කියන කාරණාව අපට මතු වන කාරණාවක්. ඒ තුළ 1993 ඉඳලා පරාජිත රැල්ලකට එකතු වුණු එක්සත් ජාතික පක්ෂය අඛණ්ඩ මැතිවරණ පරාජයන්වලට ලක් වුණා. ඒක ඔවුන්ටම පාරාවළල්ලක් බවට පත් වුණා. තවත් පත් වන ආණ්ඩුවක් හරි, එහෙම නැත්නම් වෙනත් දේශපාලන කණ්ඩායම් හරි හිතනවා නම්, මේ රටේ මැතිවරණ රටාව වෙනස් කරන්න තමන්ගේ පක්ෂවල පැවැත්ම වෙනුවෙන්, එහි ආනිසංශ කවදා හරි ලැබෙනවා. ඒක වළක්වා ගන්න බැහැ. රටේ ජනතාවත් එක්ක අපට සෙල්ලම් කරන්න බැහැ. ඒක තමයි මේ මැතිවරණ රැල්ලේ අපි දකින ප්‍රතිඵලය. මේක යම් දේශපාලන පක්ෂයකට මඩ ගහන්නවත්, ඇඟිල්ල දික් කරන්නවත්, දේශපාලන පක්ෂයක් විවේචනය කරන්නවත්, පුද්ගලයෙක් විවේචනය කරන්නවත් කරන කාරණාවක් නොවෙයි.

මම හිතනවා, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාව සභාවට ගෙන එන්නේ හද තුළ උපන් පැහැදිලි ගෞරවයකින් යුතුව. මේ මැතිවරණ රටාව තුළ යම් පරිපාලන ඒකකයක් නිවැරදිව ගෙන යෑමට තිබෙන අපහසුතාවය පිළිබඳව හිතලා. සමහර වෙලාවට මේ පවතින මැතිවරණ පනත, නීතිය විවේචනය කිරීමට මේ පළාත් සභාව කියන ව්‍යවස්ථාදායක සභාවට සදාචාරාත්මක අයිතියක් තිබෙනවා දෝ කියලා ගැටළුවකුත් මේ තුළ මතු වුණා. එහෙම කථා බහකුත් ලියැවුණා. රටේ මිනිස්සුන්ට අයහපතක් වන ක්‍රියාවක් පළාත් සභාව යටතේ පවතින පළාත් පාලන ආයතන තුළ සිද්ධ වෙනවා නම්, ඒ පළාත් සභාවට ඒ පිළිබඳව කථා කිරීමට සාධාරණ අයිතියක් තිබෙනවා.

[ගරු ජගත් අංගගේ ]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි සියලු දෙනා මේ සභාවේ අසුන් අරගෙන ඉන්නේ, මේ රටේ ජනතාව දීපු වරමක් අනුව. ඒ ජනතාවට යම් අකටයුත්තක් සිද්ධ වෙනවා නම්, ඔවුන්ගේ සේවා සපයන ආයතනවල ස්ථාවර භාවයක් නැතුව ඒවා පවත්වාගෙන යන්න බැරි වෙලා, මේ රටේ මැතිරවණ දෙපාර්තමේන්තුවට කෝටි ප්‍රකෝටි ගණන් වියදම් කරලා මැතිවරණ පවත්වලා, ඒ තුළ සාධාරණත්වයක් සිද්ධ නොවෙනවා නම්, ඒ පිළිබඳව යුක්ති සහගතව කථා කරන්න මේ පළාත් සභාවට තිබෙන අයිතිය කාටවත් තහනම් කරන්න බැහැ. අවලංගු කරන්න බැහැ. ඒක අපේ අයිතිවාසිකමක්. ඒ නිසා අද දවස වනකොට අපට පැහැදිලිවම පේන කාරණාවක් තමයි මේ මැතිවරණ ක්‍රමය තුළ - මට මතකයි 1988 – 1989 ජනතා විමුක්ති පෙරමුණත් එක්ක වුණු මහ දැවැන්ත තරුණ සංහාරය. ඒ තරුණ සංහාරය නිසාම මතු වුණු තරුණ අසහනය තුරන් කිරීමේ කොමිෂන් සභාවේ නිර්දේශ මත පළාත් පාලන මැතිවරණයේදී 35% ක් තරුණ දායකත්වයක් දුන්නා. මේ දේ නැති කරලා දැම්මා. අලුත් සංශෝධනය තුළ මේක සම්පූර්ණයෙන්ම අහෝසි කරලා දැම්මා. මේක කොපමණ සාධාරණද? කලින් කලට ව්‍යවස්ථා සංශෝධනය වෙන්නේ, අණපනත් සංශෝධනය වෙන්නේ රටට වන විනාශයන් වළක්වා ගනිමින් රටේ ජනතාවට වඩාත් සාධාරණ සහ සුභවාදී ක්‍රමවේදයන් හඳුන්වා දීමට. එදා ඒ යෝජනාව ඉදිරිපත් වුණේ, ඒ රටේ සිදු වුණු මහ විශාල ඛේදවාචකයකට පිළිතුරක් හැටියට. මෙවර මේක තුරන් කරන්න, ඉවත් කරන්න, මේ පනතින් තරුණයාගේ අයිතිවාසිකම් අහෝසි කරන්න ගත්තු තීරණය කොපමණ සාධාරණද? එය අපි කථා කළ යුතු කාරණාවක්.

දෙවැනි කාරණාව. කාන්තා විමුක්තිය සහ කාන්තා අයිතිවාසිකම්. ඒ හරහා තමයි ඉතුරු ටික ගොනු වෙන්නේ. දැන් මේක කරන්න ගිහිල්ලා මොකද වුණේ? ඒකේ හරියාකාරව දේශපාලන විද්‍යාව පිළිබඳව ප්‍රගුණ කරපු විද්‍යාඥයින්, විශේෂඥයින්, විචාරකයින් එකතු වෙලා මේවා ගළපා ගන්නේ නැතුව, නොගැළපෙන ආකාරයෙන් ක්‍රියාත්මක කරන්න ගියාම ඇති වන ගැටළු මේවා. සමානුපාතික නිසා කේවල ඡන්ද ක්‍රමය මිශ්‍ර ඡන්ද ක්‍රමයක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, භූගෝලීය වශයෙන් මහ දැවැන්ත භූමි භාගයන් තිබෙන, මහ විශාල ජනගහනයන් ඉන්න රටවල්වලට ආදේශිත මැතිවරණ ක්‍රම සමහර අය බොහොම හැල්ලුවට මේ රටට ගෙනැල්ලා අත්හැරලා දානවා. රටේ භූමිය තිබෙන ප්‍රමාණය, මේ රටේ ජීවත් වන ජනගහන සංඛ්‍යාත්මක තොරතුරු, ඒ ඒ ප්‍රදේශවල ජන ඝනත්වය, මේ සාධනීය කාරණා කිසි දෙයක් හිතන්නේ බලන්නේ නැතුව තමන්ට හිතෙන හිතෙන විධියට කොහේ හෝ රටකට ගිහිල්ලා මොකක් හරි දැනගත්තා, පොතක් පතක් කියවලා මොකක් හරි ඉගෙන ගත්තාම, ඒක තමන් දන්න පුද්ගලයා හැටියට මහදැනමුත්තලා වාගේ මේ රටේ අත්හැරලා දානවා. ඒකෙන් අහිංසක මිනිස්සුන්ගේ මුදල් කාබාසිනියා කරනවා වාගේම රටේ පරිපලාන ව්‍යුහයට මහ දැවැන්ත හානි පමුණුවනවා. ඉතින් මෙවැනි තත්ත්වයක් මේ රට තුළ අපට දිගින් දිගටම දකින්න ලැබෙන්නේ. ඉතින් ඒ නිසා මේ පළාත් පාලන මැතිවරණ ක්‍රමය 50 ට 50 කියන කාරණාව කිසිසේත්ම ස්ථාවර සභා පවත්වාගෙන යෑම සඳහා ගැළපෙන්නේ නැහැ. යම් යම් දේශපාලන පක්ෂවල සියලු ජනතාව නියෝජනය කරන්න, සියලු ජනතාවට සාධාණය ඉෂ්ට වෙන්න, තමන්ගේ නියෝජිතයෝ පත් කරන්න ඕනෑ කියන මතයම ප්‍රමුඛතාවය කරගෙන, මේ කටයුත්ත කරන එක සාධාරණයි කියලා හිතනවා නම්, මේ සභාව පවත්වාගෙන යෑමේ ස්ථාවරය පිළිබඳව නොසිතා - කෙසේ වෙතත් 1991 පළමු ප්‍රාදේශීය සභාවක සභාපතිතවරයෙක් හැටියට කටයුතු කරපු නිසා මම දන්නවා. ඒ සභාපතිවරයාට තමන්ගේ සභාව පවත්වාගෙන යෑමට මොනතරම් අධිකාරී බලයක් ඒ පනත තුළ සම්පාදනය කරලා තිබුණාද කියන කාරණාව. ඒ තුළ වැරැදි සිද්ධ වෙන්න පුළුවන්. මේ බලය අතට ගන්න මිනිහා ජනාධිපතිද, අගමැතිද, ප්‍රාදේශීය සභාවේ සභාපතිද, අගමැතිද කියන කාරණාව නොවෙයි ප්‍රශ්නය තිබෙන්නේ. ඒ බලාධිකාරිය හැසිරෙන විධිය. ඔහුගේ මනස හැසිරෙන්නේ මොන ආකාරයටද? ඔහු සැබෑ ජනතාවාදියෙක්ද, එහෙම නැත්නම් තමන්ගේ බඩගෝස්තරවාදියෙක්ද කියන කාරණාව තුළ සිදු වන අකටයුත්ත සහ සාධාරණය පිළිබඳ අපි මැන බැලීමේ කාරණාව වෙන කාරණාවක්. (බාධා කිරීමක්) මොකක්ද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා උත්තර දෙන්න යන්න එපා. ඔබතුමාගේ කථාව කරන්න.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මම අදහස් කරන කාරණාව, මම පෙර කී කාරණාවමයි. දැන් මේ සියලු ජනතාවට සමානුපාතික ක්‍රමය තුළ හෝ කේවල ක්‍රමය තුළ තම තමන් දරන දේශපාලන මතවලට ගැළපෙන පුද්ගලයින් පත් කර ගැනීමට ප්‍රමුඛතාවය දීලා. මම කියන්නේ ඒ අයට අසාධාරණයක් කරන්න කියන කාරණාව නොවෙයි. ඒකට ප්‍රමුඛතාවය දීලා යම් සභාවක් පවත්වාගෙන යන්න බැරි අස්ථාවර ක්‍රමයක් මේ තුළ නිර්මාණය කිරීම රටට කරන අසාධාරණයක් බවයි. ඒකයි මම මේ කියන්නේ. අද වෙලා තිබෙන්නේ ඒ කාරණාව. ඒ නිසා අපි වඩාත් විද්‍යාත්මකව මහජනයාට වැඩි සහනයක් සහ ඔවුන්ගේ අවශ්‍යතා හඳුනාගෙන කටයුතු කරන්න පුළුවන් ස්ථාවර ආයතන මේ රට තුළ ගම්‍යමාන කරන්න නම්, මේ රට තුළ ක්‍රියාත්මක කරවන්න නම් අපට සිද්ධ වෙනවා මේ මැතිවරණ ක්‍රමය වහාම වෙනස් කරන්න. ඒක වහාම වෙනස් කළ යුතුයි. එසේ නොකළහොත් වෙන්නේ පළාත් සභාවත් මේ මට්ටම වැටෙනවා. මේක පාර්ලිමේන්තුවට නම් ඇතුළත් කර ගන්න එකක් නැහැ. පාර්ලිමේන්තුව ඔය තිබෙන ක්‍රමයට යයි. එහෙම නැත්නම් 1976 ට ඉස්සෙල්ලා තිබුණු මැතිවරණ ක්‍රමයට යයි. ඒ පරණ ක්‍රමයට. හැබැයි මේ විෂබීජය ගෙනැල්ලා අතහරින්නේ පළාත් සභාවටයි, පළාත් පාලනයටයි. මේ නීතිය සම්පාදනය කරන්නේ පාර්ලිමේන්තුව. පාර්ලිමේන්තුවටත් මේ විෂබීජය ක්‍රියාත්මක වෙනවාද කියන ප්‍රශ්නය අපට තිබෙනවා. මේක එන්නේ පළාත් පාලනයටයි, පළාත් සභාවටයි විතරද? මේ ආයතන දියකර හැරීමේ කුමන්ත්‍රණයක්ද මේක? ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි ප්‍රාර්ථනා කරනවා. වහාම මෙය නිවැරදි කළ යුතු කාරණාවක් වන නිසා මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට මගේ ගෞරවය සහ ස්තූතිය පුද කරනවා, මේ සභාව තුළ මේ ප්‍රශ්නය මතු කිරීම සම්බන්ධව. මට අවස්ථාව ලබා දීම පිළිබඳව බොහොම ස්තූතියි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම අද මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ඉතාම කාලෝචිත යෝජනාවක්. ඇයි මම කාලෝචිත යෝජනාවක් කියලා කියන්නේ? අද හැර වෙන දවසක් ලැබෙන්නේ නැහැ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ගැන කථා කරන්න. මොකද, අපි පසුගිය සතියේ පැවති මැතිවරණයෙන් ලැබූ අලුත් අත්දැකීම විග්‍රහයට ලක් කිරීමට පළාත් සභාවේ ඉන්න ජනතා නියෝජිතයෝ හැටියට අපට අයිතියක් තිබෙනවා, යුතුකමකුත් තිබෙනවා කියලා මම පෞද්ගලිකව විශ්වාස කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම අද මෙතැන බෙහෝ දෙනෙක් සතුටින් ඉන්නවා වාගේ පේනවා. ජයග්‍රහණය සමරනවා. අද අපේ මන්ත්‍රීවරුන්ගේ පාට මාරු වෙලා තිබෙනවා. ඒක හොඳයි. අපි කියනවා අලුත් ජවයකින් - සමහර අය කියනවා, පළාත් සභා ඡන්දය ඉක්මණින් තියන්න කියලත්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට මතක් වෙනවා 2004 දෙසැම්බර් මාසේ 25 වැනිදා. කාටවත් අමතක නොවන දවසක්. එදා රාත්‍රී 12.00 ට සියලු දෙනා නත්තල් සමරලා, සාද පවත්වලා, ජයපැන් පුරලා 25 වැනිදා අවසන් කරන කොට, රාත්‍රියක් ගත වෙලා එළි වනකොට අපි දැක්කා මොකක්ද වුණේ කියලා. මේ රට මහ විශාල ඛේදවාචකයකට ලක් වුණා. සුනාමි ඛේදවාචකය අපට මතක් වෙනවා.

ඇත්ත වශයෙන්ම ජයග්‍රහණයෙන් පස්සේ අපි දැක්කේ ඛේදවාචකයක්. මම කියන්නේ මේ පළාත් පාලන මැතිවරණයේ ජයග්‍රහණයෙන් පස්සේ ඊළඟට මේ පළාත් සභා ඡන්දයත් මේ ක්‍රමය යටතේ තිබුණොත් ඒක දේශපාලනික වශයෙන් සුනාමියක් වෙයිද කියලා බයක් මගේ හිතේ ඇති වෙනවා. මේක සමහරුන්ට ප්‍රශ්නයක් නොවෙන්න පුළුවන්. නමුත් සමහර ජනතා නියෝජිතයින්ට මේක ප්‍රශ්නයක් වෙනවා කියලා මම කියන්නේ, මෙතැන ඉන්නවා බහුතරයක් ජනතා නියෝජිතයෝ. වෙනත් වෘත්තියක් කරන්නේ නැති අය. දේශපාලනය තමන්ගේ ජීවිතය කර ගත්තු, තමන්ගේ වෘත්තිය බවට පරිවර්තනය කර ගත් අය ඉන්නවා. ඒ නිසා ඒ අය ගැනත් ලොකු බරපතළ අවධානමක් තිබෙනවා මේ ප්‍රශ්නයත් එක්ක. හැබැයි මම කියන්නේ ජනතාවට වැඩ කරන්නේ නැත්නම්, ඒ අය මේ දේශපාලන ප්‍රවාහයෙන් කුණු කූඩයට තල්ලු වෙන්න ඕනෑ. ඒක වෙනම කථාවක්. එතකොට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ මැතිවරණය දිහා ආපහු හැරිලා බැලුවොත් අපට පිටින් පේන දේ තමයි, පැරදුණු අය දිනපු, දිනපු අය පැරදුණු මැතිවරණයක් බව. ඇයි මම එහෙම කියන්නේ? මේ ප්‍රතිඵලය දිහා බැලුවාම වැඩි ආසන ප්‍රමාණයක්, වැඩි පළාත් පාලන ආයතන ප්‍රමාණයක්

[ගරු සුසිල් කිඳෙල්පිටිය ]

ජයග්‍රහණය කරලා තිබෙන්නේ අපි කැමැති වුණත්, අකැමැති වුණත් සරල භාෂාවෙන් කියනවා නම් පොහොට්ටුව. නමුත් අද ඒක අපට අනෙක් පැත්තට හරවන්න පුළුවන් විධියේ සංයුති ගොඩනැගෙමින් තිබෙනවා. එතකොට මේ ක්‍රමය ඇතුළේ මොකක් හෝ අවුලක්, ප්‍රශ්නයක්, ගැටළුකාරී තත්ත්වයක්, අඩුවක් තිබෙනවා කියලා අපට පේනවා. එහෙමනම් මේක නිවැරදි වෙන්න ඕනෑ. මේක පළාත් සභා ඡන්දය ඉදිරියේදී කොහොමද පවත්වන්නේ කියලා පාර්ලිමේන්තුවට ගෙන ආවා නම්, ඒක පවා මේ ක්‍රමයත් එක්ක අනුගත වෙලා යනවා නම් මේක බරපතළ තත්ත්වයක්. අපි කියන්නේ, මේ පළාත් පාලන ඡන්දය තියපු ක්‍රමවේදය ගෙඩිය පිටින් ගේන්න එපා. එහෙම වුණොත් බරපතළ ගැටළුවක්. මොකද, අපේ අධ්‍යාපන ඇමැතිතුමාත් කිව්වා, පොල් ලෙලි රජ වෙනවා කියලා. පොල් ලෙලි තමයි ගොඩක් රජ වෙලා තිබෙන්නේ. එහෙම නුසුදුසු පුද්ගලයෝ මේකට ඇවිල්ලා තිබෙනවා. ඒක අපි පිළිගන්න ඕනෑ. අපේ ගම් පළාත්වල බැලුවත් මේ ලැයිස්තුවලින් එවැන්නෝ ඇවිල්ලා තිබෙනවා. හොරු ඉන්නවා. වංචාකාරයෝ ඉන්නවා. විවිධ නීති විරෝධී ව්‍යාපාරවලට සම්බන්ධ වුණු අය ඉන්නවා. වැලි ජාවාරම්කාරයෝ ඉන්නවා. ඒ වාගේම නීති විරෝධී ලෙස ඉඩම් ගොඩ කරපු අය ඉන්නවා. එහෙම විශාල පිරිසකුත් මේක ඇතුළේ ඇවිල්ලා තිබෙනවා.

ඒක නිසා අපට පෙන්නේ, අපට කොතැන හරි වැරදිලා තිබෙනවා. මිනිස්සු ඒ අය පත් කර ගත්තේ ඇයි කියන ප්‍රශ්නය එනවා. සමහර පත් වුණු අය ගම අඳුරන්නේ නැහැ. ගමේ මිනිස්සු පත් වුණු නියෝජිතයාව අඳුරන්නේ නැහැ. එහෙම තත්ත්වයන් තිබෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේවා කොහොමද නිවැරදි කරන්නේ? ඒ නිසා මෙතැන අපට එක දෙයක් පේනවා. මොකක්ද? ගැටුම් අඩුයි. ඡන්ද පත්‍රිකාව පොඩියි. පුංචි ඡන්ද පත්‍රිකාවක්. ලෙහෙසියි. මනාප ලකුණු කරන්න නැහැ. ඒ වාගේම නරක් වුණු ඡන්ද ප්‍රමාණය අඩුයි. හැබැයි මම කියන්නේ නැහැ මේකේ සාධනීය ලක්ෂණ නැහැයි කියලා. මේකේ සාධනීය ගුණාංග තිබුණා. හැබැයි නිශේධනය කළ යුතු තත්ත්වයනුත් තිබුණා. ඒ නිසා මේ ක්‍රමය එහෙම් පිටින්ම ගේන්න එපා. ඒක සංශෝධනයට ලක් විය යුතුයි කියන යෝජනාව මම හිතනවා පළමුවෙන්ම අපි ඉදිරිපත් කරන්න ඕනෑ. ඒ කියන්නේ මේ කොට්ඨාශ ක්‍රමයට යා යුතු නම් මේ ක්‍රමය වෙනස් ක්‍රමයක් බවට පරිවර්තනය විය යුතුයි. මේ රටේ බහුතරයක් කොට්ඨාශ ක්‍රමය ඕනෑ කියලා ඉල්ලනවා නම් මේ අපි කිහිප දෙනෙක් එකතු වෙලා ඒකට විරුද්ධව වැඩ කළාට වැඩක් නැහැ.

ඊළඟට කාන්තා නියෝජනය සැලකුවාම, 25% කාන්තා නියෝජනයේත් සංශෝධනයක් විය යුතුයි කියලා මා විශ්වාස කරනවා. දැන් 60%, 40% වශයෙන් වෙන් කිරීම ගැන ගැටළුක් ගොඩ නැගිලා තිබෙන්නේ. අපි දැන් 70% යි 30% යි ඉල්ලුවොත් අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා හිතනවා නම් ගැටළුවක් ගොඩ නැගෙන්නේ නැහැයි කියලා. ඒක මම හිතන්නේ නැහැ සාධාරණ ප්‍රකාශයක් සහ ඉල්ලීමක් කියලා. මොකද, මෙතැන ගැටළුවක් ගොඩ නැගීමේ ප්‍රවණතාවයක් පෙනෙන්න තිබෙනවා. සරල අර්ථයෙන් සලකා බැලුවත්, මේක දිහා සරල අර්ථයෙන් බැලුවත් අපට පේනවා මේකේ ගැටළුකාරී තත්ත්වයක් මතු වෙන්න පුළුවන් කියලා. ඒක නිසා කොට්ඨාශයට පත් වුණු මන්ත්‍රීවරයෙක් ගැන අපි කථා කළා. මම දන්නේ නැහැ එහෙම මන්ත්‍රීවරු අද පත් වෙලා තිබෙනවාද? මම සරල උදාහරණයක් ගන්නම් කෝ? අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාගේ සහෝදරයාගේ දරුවාව දැම්මා එක කොට්ඨාශයකට. ඒ දරුවාව ගම දන්නේ නැහැ. ඇත්ත කතන්දරේ ඒකයි. ගමේ මිනිස්සු ඒ දරුවාව දන්නේ නැහැ. හැබැයි ඒ දරුවා පත් වෙලා ඉවරයි. එතකොට කොට්ඨාශයට මන්ත්‍රීවරයා කියන එක බරපතළ කාරණයක් බවට පත් වෙලා තිබෙනවා. මේක කොහොමද විසඳ ගන්නේ කියන ප්‍රශ්නය අපි ඉස්සරහා තිබෙනවා. මම කියන්නේ මේක දිහා ආපහු හැරිලා බලන්න කියලා. ඇත්ත වශයෙන්ම සාමාන්‍ය කොට්ඨාශ ක්‍රමයේදී ජයග්‍රාහකයාට ලොකු වටිනාකමක් ලැබෙන්න ඕනෑ. නමුත් පළාත් පාලන ඡන්ද ක්‍රමය ඇතුළේ අපි දැකපු දෙයක් තමයි ජයග්‍රාහකයාට වඩා පරාජිතයාට හුඟක් තැන්වල මහ විශාල වටිනාකමක් ලැබිලා තිබෙනවා. එහෙම වෙලා තිබෙනවා නේ? ඒක නිසා මේ මොකක්ද වෙලා තිබෙන්නේ? මේක නිවැරදි වෙන්න ඕනෑ. මේක ආපහු සංශෝධනය වෙන්න ඕනෑ. අනෙක් එක අපි දැක්කා අපි ජයග්‍රහණය කරපු කණ්ඩායමට කලින් තිබුණු ක්‍රමය යටතේ බෝනස් ආසන ලැබුණා. මේ ක්‍රමයෙන් සියල්ල ජයග්‍රහණය කළාමත් බෝනස් නැහැ. ඒක නිසා මේකත් යළි සලකා බලන්න ඕනෑ තත්ත්වයක්

කියලා අපට පේනවා. එම නිසා අවුල් සහගත තත්ත්වයන් ගණනාවක් තිබෙනවා. අඩුපාඩු හදාගන්න ඕනෑ. ඒක කරන්නේ කෙසේද කියන එක ගැන සලකා බලන්න ඕනෑ. මේක ආපහු යළි විශ්ලේෂණයට ලක් කරන්න ඕනෑ. ඒක නිසා මේ පළාත් පාලනයට පාවිච්චි කරපු ක්‍රමය ගෙඩිය පිටින් පාවිච්චි කළොත් අවුලකට යාම වළක්වන්න බැහැ. ඒක නිසා මේ විධියට ක්‍රියාත්මක වුණොත් මේ ක්‍රමය පළාත් සභාවට සුනාමියක් වීම වළක්වන්න බැහැ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ නිසා අපි සමානුපාතික ක්‍රමයට වැඩි වටිනාකමක් ලැබීම අසාධාරණයි කියලා බොහෝ අය හිතනවා නම් ඒක යළි සලකා බලන්න ඕනෑ කියලාත් මා හිතනවා. හැබැයි වැඩේ තිබෙන්නේ බලය ලබා ගන්න කියලා ඕනෑම වල් බූරු ක්‍රමයකට කැමැති වීම නොවෙයි අපි කළ යුත්තේ. ඊට වඩා ජනතාවට වැදගත්, ජනතාවගේ පරමාධිපත්‍ය බලයට වැඩි වටිනාකමක් ලැබෙන ක්‍රමයකට අපි යන්න ඕනෑ. මේකේ කුඩා කණ්ඩායම්වලට වාසි සහගත තත්ත්වයන් උදා වෙන්න පුළුවන්. දැන් උදාහරණයක් හැටියට. ජනතා විමුක්ති පෙරමුණ විශාල බලපෑමක් කරන්න පුළුවන් පක්ෂයක්.

හැබැයි ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රතිඵල දිහා බැලුවාම විශාල ජයග්‍රහණයක් එතුමන්ලාට ලැබිලා තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණේ ඡන්ද ප්‍රමාණය 695,000 කට වැඩි වෙලා තිබෙනවා. පසුගිය පාර්ලිමේන්තු මැතිවරණයට ලැබුණු 543,000 එක්ක බලන කොට. වැඩිවීමක් තිබෙනවා. සෑහෙන්න වැඩිවීමක් තිබෙනවා. මම හිතන්නේ ආසන 432 ක් ලැබිලා තිබෙනවා. එහෙම බැලුවාම විශාල වර්ධනයක්. මම කියන්නේ එහෙම කුඩා පක්ෂ පවා මේ රටේ දේශපාලනයේ බලපෑමක් කරන්න පුළුවන් කණ්ඩායම් ඉදිරියට එන්න ඕනෑ. හැබැයි, ඒ අතරේදී මම කියන්නේ, මේ හැමෝටම සාධාරණය ඉෂ්ට වන ක්‍රමයකට යන්න ඕනෑ. ඒක නිසා මේ සියයට පනහ පනහා කියන එක නම් කිසිසේත්ම ගැළපෙනවා කියලා මම හිතන්නේ නැහැ. මම හිතන්නේ එහෙම නම් අපි මේ අර්බුද සියල්ල මඟ හරවා ගන්න නම් එක්කෝ අපි පැවැති ක්‍රමයට යන්න ඕනෑ. පැවැති ක්‍රමයේ ඊට වඩා සාධනීය ගුණාංග තිබුණා කියලා මගේ පෞද්ගලික මතයක් තිබෙනවා. ඒක නිසා අපි එවැනි ක්‍රමයක් කෙරෙහි අවධානය යොමු කළ යුතු අවස්ථාවකයි ඉන්නේ කියන එක අවධානයට ලක් කරමින් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවේ කාලීන වැදගත්කම පිළිබඳව ප්‍රශ්නය කරනු ලැබුවා මේක ඵල රහිතයි, අර්ථ විරහිතයි කියලා. නමුත් මම එක දෙයක් කියන්න ඕනෑ. පාර්ලිමේන්තුවේ ඕනෑතරම් නීති සම්මත වෙලා තිබෙන්න පුළුවන්. සම්මත කරලා තිබෙන්න පුළුවන්. ඒවා ගලේ කෙටූ දේවල් නොවෙයි. ඒවා ගලේ කෙටූ දේවල් විධියට සමහරු කල්පනා කරනවා. ඒවා වෙනස් කරන්න බැහැ. ඒවා කථා කරන එකේ තේරුමක් නැහැ. කාලය නාස්ති කිරීමක්. කාලය අපතේ යැවීමක් කියලා. දැන් අපි පාර්ලිමේන්තුවේ නීතියක් සම්මත කළා. ඒක තමයි 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. මේ 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අපත් දායක වුණු පක්ෂයක්. ඒ පිළිබඳව විවෘතව කියන්න ඕනෑ. අද වනකොට අපට පෙනී ගිහිල්ලා තිබෙනවා ඒකේ තිබෙන අඩුපාඩු. ඒකේ තිබෙන අවුල් සහගත තත්ත්වය. ඒකේ තිබෙන අර්බුදකාරී තත්ත්වය. ඒ නිසා තමයි මේ මොහොතේ රටේ තිබෙන දේශපාලන අර්බුදය ව්‍යවස්ථා අර්බුදයක් දක්වා ගමන් කරලා තිබෙන්නේ. රටේ අගමැතිවරයා ඉවත් කිරීම පිළිබඳ ප්‍රශ්නය අද ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය විමසීම දක්වා ගමන් කරන්න සිද්ධ වෙලා තිබෙනවා. නීතිපතිවරයාගෙන් මේ පිළිබඳව විමසන්න සිද්ධ වෙලා තිබෙනවා. පාර්ලිමේන්තුවේ බහුතර බලය යම් පක්ෂයක් පෙන්නුවත් අගමැතිවරයා ඉවත් කරන්න බැහැයි වාගේ අදහසක් ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම සම්මුතිවාදී ආණ්ඩුවේ, හවුල් ආණ්ඩුවේ එක පාර්ශවයක් ඉවත් වුණත් තනියම දික්කසාද වෙන්න බැහැයි කියලා අදහසක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඉතින් මට තේරෙන්නේ නැහැ මේ වාගේ තත්ත්වයක් තුළ අපි සියලු දෙනාම එකතු වෙලා පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකකින් සම්මත කරපු, 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ - අපේ කථාවක් තිබෙනවා කොකාගේ සුද පේන්නේ ඉඟිලෙනකොට කියලා. ඒක නිසා අඩුපාඩු තිබෙනවා නම්, වැරැදි තිබෙනවා නම් ඒවා නැවත සලකා බලන්න, පසුවිපරම් කරන්න, සමාලෝචනය කරන්න, ඒවා වෙනස් කරන්න. රටේ ජනතාවගේ පරමාධිපත්‍ය නියෝජනය කරන පාර්ලිමේන්තුව වෙන්න පුළුවන්. පළාත් සභාව ඇතුළේත් ජනමතයක් නියෝජනය වෙනවා. ජනවරමක් නියෝජනය වෙනවා. ඒවා සාකච්ඡා කරන්න, වෙනස් කරන්න අවස්ථාව තිබෙනවා.

[ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ]

ඒ නිසා පළමුවෙන්ම මම කියන්න ඕනෑ. මෙතුමා ගෙනාපු යෝජනාව බාල්දු කරන්න හෝ ඒක අනුචිත, නොගැළපෙන, ප්‍රඥාගෝචර නොවන, සබුද්ධික නොවන දෙයක් විධියට ඉදිරිපත් කරන්න උත්සාහ කරනවා නම්, ඒක වැරැදියි. අපි විවෘතව සාකච්ඡා කරන්න ඕනෑ. රටක් අස්ථාවර වෙන්න දෙන්න බැහැ. රටක් අරාජික වෙන්න දෙන්න බැහැ. රට තුළ විශාල ව්‍යවස්ථානුකූල අර්බුදයක් නිර්මාණය වෙන්න ඉඩක් තියන්න පුළුවන්කමක් නැහැ. දැන් අපි නව මැතිවරණ ක්‍රමයක් අත්හදා බැලුවා. එතකොට ඒ නව මැතිවරණ ක්‍රමය අත්හදා බැලීම පසුගිය පෙබරවාරි 10 වැනිදා අපි සිදු කළා. ඒ සඳහා අපි සැහෙන්න කාලයක් ගත කළා. මේ නව මැතිවරණ ක්‍රමය සකස් කර ගන්න. පළමුවෙන්ම මේ පිළිබඳව විශේෂඥයින්, විද්වතුන් අපට යෝජනා ඉදිරිපත් කළා. නව මැතිවරණ ක්‍රමය පිළිබඳව. නමුත් ඒ නව මැතිවරණ ක්‍රමය පිළිබඳව අවසාන වශයෙන් පාර්ලිමේන්තුව නියෝජනය කරන දේශපාලන පක්ෂවල අදහස් සාකච්ඡා කළා. සම්මුතියකට එළැඹුණා. මුලින් ඉදිරිපත් වුණේ 70, 30 අනුපාතය. නමුත් අවසාන වශයෙන් මහා සම්මුතියකින්, එකඟතාවයකින් මේක කළ යුතු නිසා 60, 40 එකඟතාවයකට ආවා. ඒ අනුව තමයි මේ නව මැතිවරණ ක්‍රමය පැවැත් වූයේ. ඒ අනුව අපි 60% ක් කොට්ඨාශ ක්‍රමයට, කේවල ක්‍රමයටත්. 40% ක් සමානුපාත ක්‍රමයටත් සකස් වන විධියටයි මේ නව මැතිවරණ ක්‍රමය සකස් කළේ. දැන් මැතිවරණ ක්‍රමය සකස් කරලා, මැතිවරණය පැවැත්වූවා. අපි සැහෙන්න කාලයක් ගත්තා. අවුරුදු තුනකට ආසන්න කාලයක් කල් මැරුවා. මැතිවරණය පැවැත්වූවා. ප්‍රතිඵල නිකුත් වුණා. ප්‍රතිඵල නිකුත් වන දවසේ දින දෙකකට කලින් මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමා ප්‍රකාශ කර සිටියා රාත්‍රී ආහාරය ගන්න කලින් මැතිවරණ ප්‍රතිඵල ඔබතුමන්ලාට දැනගන්න පුළුවන් වෙයි. තමන්ගේ කොට්ඨාශයේ නියෝජිතයා කවුද? තමන්ගේ පළාත් පාලන ආයතනයේ ජයග්‍රාහී පක්ෂය මොකක්ද කියලා. නමුත් දවස් 1 ½ ක් ගියා. 11 වැනිදා පස්වරු 6.00 වනකුනුත් සම්පූර්ණ මැතිවරණ ප්‍රතිඵල නිකුත් කර ගන්න බැරි වුණා. එහෙම නම් මේ System එක පිළිබඳව - එතුමා කිව්වා Software එකත් අවුල් වුණා කියලා. එහෙම නම් මේ System එක පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. අද දක්වාම මැතිවරණ ප්‍රතිඵල නිසි පරිදි නිවැරැදිව ප්‍රකාශයට පත් කරන්න පුළුවන් වෙලා නැහැ. මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා ප්‍රකාශ කරනවා මේ මැතිවරණ ක්‍රමය හදපු මිනිහා අහු වුණොත්, මට වෙඩි තියන්න තරම් තරහක් තිබෙනවා කියලා. කේන්තියක් තියෙනවා කියලා.

ඊළඟට කාන්තා නියෝජනය සම්බන්ධයෙන් එතුමා මොකක්ද කියන්නේ? මේක එකම අවුල් ජාලයක්. එකම අපභ්‍රංසයක් කියලා එතුමා ප්‍රකාශ කරනවා. ඒක වෙනස් කරන්න ඕනෑ කියනවා. එහෙම නම් මේවා වෙනස් කරන්න බැහැයි කියලා කථා කරන ඇතැම් මන්ත්‍රීවරුන්ට කියන්න කැමැතියි, ඊයේ එතුමා ගිහිල්ලා කථානායකතුමා හම්බ වෙලා කිව්වා මේක සංශෝධනය කරන්න ඕනෑ කියලා. සංශෝධනය කරන්න. එතකොට පාර්ලිමේන්තුව රටේ සියලුම අනෙක් ආයතනවලට වඩා ඉහළින් තිබෙන ආයතනයක් නම්, ඒ ආයතනය තුළ ඕනෑම ආකාරයේ වෙනසක් කරන්න, සංශෝධනයක් කරන්න, තීන්දු තීරණ ගැනීමේ හැකියාවක් තිබෙනවා. ඒක නිසා කථානායකතුමා දැනුම් දුන්නා කාන්තා නියෝජනය 25% සම්බන්ධයෙන් අවශ්‍ය වෙනසක්, සංශෝධනයක් කළ යුතුයි කියලා. මේ පිළිබඳ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය ෆයිසර් මුස්තාපා මැතිතුමාට දැනුම් දුන්නා. එතුමා කිව්වා එතුමාට මේ පිළිබඳව ගැටළුවක් තිබෙනවා. නීතිපති උපදෙස් පිළිපදින්න කියලා. එහෙම නම් මේ මැතිවරණ ක්‍රමය පිළිබඳව අද ප්‍රශ්නාර්ථයක් මතු වෙලා තිබෙනවා. මේ පිළිබඳව අවුල් සහගත තත්ත්වයක් මතු වෙලා තිබෙනවා. ගැටළුකාරී තත්ත්වයක් මතු වෙලා තිබෙනවා. ඒක අපි සාකච්ඡා කරන්න ඕනෑ. මේවා මේ ගලේ කෙටූ අකුරු නොවෙයි. මේවා වෙනස් කරන්න බැහැ. දැන් පාර්ලිමේන්තුවේ නීතිය සම්මත කරලා තිබෙන්නේ. අපේ අදහසුත් විමසලා අපි යවලා තිබෙන්නේ. ඒක නිසා ආපස්සට ගන්න බැහැ. මේවා වෙනස් කරන්න බැහැ කියලා එකක් නැහැ. රටේ ඉදිරි ගමන ගැන හිතන්න ඕනෑ. පළාත් පාලන මැතිවරණය අවසන් වෙලා දැන් දින 10 ක් ගත වෙලා තිබෙනවා. රටේ යම්කිසි දේශපාලන අර්බුදකාරී තත්ත්වයක් තිබෙනවා. මේක විදේශ මාධ්‍යයත් වාර්තා කරනවා. Breaking News ගහනවා අපට පේනවා. ඒ රටවලුත් නිරන්තරයෙන් ලංකාව සම්බන්ධයෙන් කියන කොට කියනවා, ලංකාවේ මේ මොහොතේ දේශපාලන අස්ථාවරභාවරයක්, අර්බුදයක් තිබෙනවා කියලා. ඒක දැන් ප්‍රකාශයට පත් කරන්නේ ව්‍යවස්ථානුකූල අර්බුදයක් විධියට.

පසුගිය දවස්වල අපි මාලදිවයිනේ දැක්කා. ඒ වාගේ අර්බුදකාරී තත්ත්වයක් ඇති වුණා. මාලදිවයින ඒ සම්බන්ධයෙන් තීරණයක් ගත්තා. හමුදාව මැදිහත් වුණා. ශ්‍රේෂ්ඨාධිකරණය මැදිහත් වුණා. සමහරු අත්අඩංගුවට අරගෙන සිරගත කළා. ඒක නිසා අපි පැහැදිලිව කියන්න ඕනෑ. මෙතැන යම්කිසි ගැටළුවක් තිබෙනවා නම්, ඒක අපි විවෘතව සාකච්ඡා කරන්න ඕනෑ. නැවත විමසා බැලීමක් කරන්න ඕනෑ. මේ ඡන්ද ප්‍රතිඵල ඉතා පැහැදිලියි. අපි ඕනෑම කෙනෙකුට සංඛ්‍යා ලේඛන අරගෙන අපට පෙන්වන්න පුළුවන්. ඉලක්කම් හරඹ කරන්න පුළුවන්. අංක ගණිතයෙන්, වීජ ගණිතයෙන්, ඊළඟට කලින් තිබුණු ජනාධිපතිවරණ ප්‍රතිඵලයි, මේ මැතිවරණ ප්‍රතිඵලයි සංසන්දනය කරන්න පුළුවන්. පාර්ලිමේන්තු මැතිවරණ ප්‍රතිඵලයි මේ මැතිවරණ ප්‍රතිඵලයි සංසන්දනය කරන්න පුළුවන්. කාටද වැඩිපුර ජනමතය තිබෙන්නේ, කාටද ගොඩ කියලා, පරාජිත දෙක තුන හතර එකතු කරලා එක ගොඩක් කරලා අපේ ගොඩ ලොකුයි කියලා පෙන්වන්න පුළුවන්. නමුත් රටේ ජනමතය පිළිබඳව අපි පැහැදිලි අදහසකට එන්න ඕනෑ. මේවා තර්කන බුද්ධියෙන් පමණක්ම අපට කියන්න බැහැ. ජනතාවගේ හද ගැස්ම කොහොමද? ජනතාව මොන පැත්තටද මේ ප්‍රතිඵල දීලා තිබෙන්නේ? ජනතාවගේ කැමැත්ත මොකක්ද කියන එක පිළිබඳව අපි පැහැදිලිව තේරුම් ගන්න ඕනෑ.

ඒක නිසා මේ ප්‍රතිඵලත් එක්ක අපි ජාතික හෙළ උරුමය විධියට මේ පණිවිඩය පැහැදිලියි. සමහරු බර හැල්ලු කරලා කියන්න හදනවා. මේක අපට පොඩි අනතුරු ඇඟවීමක්. රතු එළියක් දල්වලා තිබෙනවා. පොඩි කණේ පහරක් ගහලා තිබෙනවා. නැහැ. මේක පැහැදිලිව මේ රටේ බහුතරයක් සිංහල බෞද්ධ ජනතාව - විශේෂයෙන් මේ මැතිවරණ සිතියම අරගෙන බැලුවාම පැහැදිලිය. මේ රටේ බහුතරයක් සිංහල බෞද්ධ ජනතාව. මේ රටේ බහුතරයක් ජනතාවගේ සිතුම් පැතුම් තේරුම් ගන්නේ නැත්නම්, ඒ සිතුම් පැතුම් එක්ක ආණ්ඩුවක් නැත්නම් ජනමතයකින් තොරව ආණ්ඩුවක් ඉස්සරහාට යන්න බැහැ. ව්‍යවස්ථාවට මුවා වෙලා හරි, නීතියට මුවා වෙලා හරි, කලින් තිබුණු ජනවරම පෙන්වලා හරි එහෙම ඉස්සරහාට යන්න බැහැ. පවතින්න පුළුවන්. අල්ලගෙන ඉන්න පුළුවන්. හැබැයි ඉස්සරයාට යන්න බැහැ. ඒක නිසා මේක පැහැදිලිව තේරුම් අරගෙන ඒ අනුව අපි මේ රට අරාජික වෙන්න දෙන්නේ නැතුව, රට අස්ථාවර වෙන්න දෙන්නේ නැතිව - මේ වනකොට Stork Market එක වැටිලා තිබෙනවා. රුපියල වේගයෙන් බාල්දු වෙමින් තිබෙනවා. මේ වනකොට ඩොලරය 158 දක්වා ගිහිල්ලා තිබෙනවා. රටේ ආයෝජකයෝ බිය වෙලා තිබෙනවා. ඉතින් ඒ නිසා ආර්ථිකය විතරක් නොවෙයි. රටේ දේශපාලන අර්බුදයකුත් ඇති වෙලා තිබෙනවා. මේ ඇත්ත කථා කරන්නේ. ඒක නිසා අපි පැහැදිලිව කියන්න ඕනෑ. ජාතික හෙළ උරුම විධියට මේ ජනවරම හරියට තේරුම් ගන්න. මේවා නිකන් රතු ලයිට් පත්තු කරලා, කණේ පහරක් ගහලා, එහෙම නැත්නම් අපට සංඥාවක් දීලා තිබෙනවා වැරැදි හදාගෙන යන්න කියලා. ඒක නොවෙයි. මේ කියලා තිබෙන්නේ, පලයන් කියලා. ආණ්ඩුවට අපට කියලා තිබෙන්නේ පලයන් කියලා. පසුගිය අවුරුදු තුන ඇතුළේ ආණ්ඩුකරණයේදී අපි අසමත් වෙලා තිබෙනවා. ඒක අපි පිළිගන්න ඕනෑ. අපේ සාර්ථක පැති තිබෙනවා. මේ රටට සාපේක්ෂව මානව නිදහස අපි දීලා තිබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදය දීලා තිබෙනවා. මාධ්‍ය නිදහස දීලා තිබෙනවා. නමුත් රටේ ආර්ථිකය මෙහෙයවීම පැත්තෙන් අපි අසමත් වෙලා තිබෙනවා. රටේ ආණ්ඩුකරණය පැත්තෙන්, රටේ පාලනය පැත්තෙන්, Governance පැත්තෙන් අපි අසාර්ථක වෙලා තිබෙනවා. සමහර පැතිවලින් ජාත්‍යන්තර වශයෙන්, රටක් විධියට අපි සාර්ථක වෙලා තිබෙනවා. රටේ ගෞරවය, කීර්තිනාමය ගොඩ නඟන්න.

හැබැයි රටේ බහුතරයක් ජනතාව තුළ විශාල අප්‍රසාදයක් තිබෙනවා කියන එක තේරුම් ගන්න ඕනෑ. එහෙම නම් ඒකට ගැළපෙන විධියට දැන් මේ ජනමතයක් පිළිඹිබු වෙලා තිබෙනවා. ඒ ජනමතයට ගරු කරමින් කළ යුතු වෙනස්කම්, ව්‍යුහාත්මකව කරන්න ඕනෑ. පාර්ලිමේන්තුව ඇතුළේ. පැහැදිලිව අපි කියන්න ඕනෑ. දැන් මේ තිබෙන තත්ත්වය යටතේ, මේ ප්‍රතිඵලත් එක්ක 44.65% ක ජනමතයක් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ජනමතය පෙන්වා තිබෙනවා. හතලිස් නව ලක්ෂයක් ඡන්ද අරගෙන. එහෙම නම් ඔවුන් තමයි පසුගිය කාලයේ මේ රටේ ප්‍රධාන විපක්ෂය විධියට ආණ්ඩුවට විරුද්ධ ජනමතය හැසිරෙව්වේ. එහෙම නම් ඒ ජනමතයට සාධාරණයක් ඉෂ්ට වෙන්න ඕනෑ. පාර්ලිමේන්තුව ඇතුළේ තවදුරටත් නීත්‍යානුකූලව හෝ සාදාචාරාත්මක වශයෙන් කිසිදු ආකාරයකින් ඉලංගෛයි තමිල් අරුසු කච්චි පක්ෂයට, දෙමළ ජාතික සන්ධානයට

[ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ]

පාර්ලිමේන්තුව තුළ විපක්ෂ නායක ධුරය දැරීමේ නීතිමය හෝ සාදාචාරාත්මක හෝ ව්‍යවස්ථානුකූල අයිතියක් නැහැ. ඒක පැහැදිලිව අපි කියන්න ඕනෑ. ඔවුන්ට ලැබිලා තිබෙන්නේ තුන්ලක්ෂ තිස්නව දාහයි. ඔවුන් කලින් කිව්වා, අපට උතුරු - නැගෙනහිර දස ලක්ෂයක් ඡන්දය තිබෙනවා කියලා. ඒ වාගේම ප්‍රතිශයක් විධියට ගත්තාම 3.7% යි ඔවුන්ට ලැබිලා තිබෙන්නේ. එහෙම නම් අපි පැහැදිලිව කියන්න ඕනෑ. මේ තිබෙන තත්ත්වය යටතේ, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට පාර්ලිමේන්තුව තුළ විපක්ෂ නායක ධුරය අනිවර්යයෙන්ම දිය යුතුයි. තවදුරටත් විපක්ෂ නායක ධුරය ඔවුන් අතේ තියාගෙන ඉන්නවා නම් ඒක සාදාචාර විරෝධීයි. නීති විරෝධීයි. ඔවුන් ඒක පාවිච්චි කරලා මොනවාද කරන්නේ කියන එක අපි බලන්න ඕනෑ. පසුගිය කාලයේ මොනවාද කළේ? රටේ විපක්ෂ නායක ධූරයේ භූමිකාව ඔවුන් ඉෂ්ට කළේ නැහැ. විපක්ෂ නායක ධූරයේ භූමිකාව ඉෂ්ට කළේ නැහැ. ඔවුන් පෙනී සිටියේ උතුරු - නැගෙනහිර දෙමළ ජනතාවගේ ප්‍රශ්න වෙනුවෙන් විතරයි. දෙමළ ජනතාවගේ අභිලාෂය වෙනුවෙන් විතරයි. විපක්ෂ නායක ධූරය කියලා කියන්නේ. රටේ සමස්ත ජනතාවගේ අභාලාෂයන්, ඔවුන්ගේ උවමනා එපාකම් සහ ආණ්ඩු විරෝධී උවමනාවන් නියෝජනය කරන එක. නමුත් ඒක ඔවුන්ගෙන් එන්නේ නැහැ. ඒක නිසා මම පැහැදිලිව කියන්න ඕනෑ. මේක වෙනස් විය යුතුයි. මේ ජනමතය නිවැරැදිව තේරුම් අරගෙන කළ යුතු ව්‍යුහාත්මක වෙනස්කම් සහ ඒ ඒ පක්ෂවල කළ යුතු රැඩිකල් වෙනස්කම් අනිවාර්යයෙන්ම කරන්න ඕනෑ.

ඊළඟට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ නව මැතිවරණ ක්‍රමය ගැන කෙටියෙන් මට කියන්න තිබෙන්නේ, අපි නැවත වතාවක් මේ අලුත් මැතිවරණ ක්‍රමය පළාත් සභාවලටත් අනුගත කරන්න ගියොත් විශාල අර්බුදකාරී තත්ත්වයක් නිර්මාණය වෙන්න පුළුවන්. විශේෂයෙන්ම කියන්න ඕනෑ, මේ මැතිවරණ ක්‍රමය හදද්දී අපි කිව්වේ යම්කිසි සභාවක් හදන්න පුළුවන් ආකාරයට එක පක්ෂයකට, සභික සංඛ්‍යාව ඉරට්ටේ සංඛ්‍යාවක් ලැබෙන්න ඕනෑ කියලා. දැන් බොහොමයක් ඒවාට එහෙම ලැබිලා නැහැ. ඔත්තේ සංඛ්‍යා ඇවිල්ලා තිබෙන්නේ. සමහර තැන්වල 19 යි 19. සමහර තැන්වල 10 යි 10. වෙනදා මේ වාගේ ප්‍රශ්නයක් ආවාම මේක බැලන්ස් කර ගන්න බැහැ. බෝනස් සීට් එක දෙන්නේ. දැන් සමහර ජයග්‍රාහී පක්ෂවලට බෝනස් සීට් ඇත්තේම නැහැ. ඒක නිසා පරාජිත පක්ෂ මත එල්ලෙන්න ඒ පක්ෂවලට සිදු වෙලා තිබෙනවා. මම දැක්කා කොටගල ප්‍රාදේශීය සභාව හදන්න එක මන්ත්‍රීවරයෙකුට - දැන් ඔවුන්ගේ වටිනාකම කෝටිය දක්වා ඉහළ ගිහිල්ලා තිබෙනවා. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුගේ වටිනාකම කෝටිය දක්වා ගිහිල්ලා තිබෙනවා. මොනවත් ඕනෑ නැහැ. සභාව වෙනුවෙන් මන්ත්‍රී ධූරය විකුණා ගත්තාම මුළු ජීවිත කාලයකටම ඇති. ඒක නිසා මේ මැතිවරණ ක්‍රමය පිළිබඳව නැවත අපි සිතා බලන්න ඕනෑ.

දැන් මේක 50 යි 50 ට පසුගිය දවස්වල පාර්ලිමේන්තුවේ සම්මත කළා. මේ අනුව අරගෙන බැලුවාම අපට පේනවා කළුතර දිස්ත්‍රික්කයේ සභිකයෝ කීයද ඉන්නේ? 11 දෙනෙක් තරග කරනවා, 11 දෙනෙක් සමානුපාත ලැයිස්තුවෙන් එනවා. එහෙම නම් මේකෙන් ඉදිරියේදී සියලු දෙනාම පෙළඹෙන්නේ ලැයිස්තුවට යන්න. තරග කරන්න නොවෙයි. කොළඹ දිස්ත්‍රික්කය අරගෙන බැලුවාම අපට පේනවා ඉදිරියේදී කොට්ඨාශ 20 යි. ඒ කොට්ඨාශ 20 ට මන්ත්‍රීවරු විසි දෙනෙක් තරග කරන්න ඕනෑ. ඒ නිසා මේ මැතිවරණ ක්‍රමය පිළිබඳව අපි සියලු දෙනා නැවත සිතා බැලිය යුතුයි. දැන් බලන්න අනෙක් පැත්තෙන්. මේ සභික සංඛ්‍යාව එදා සහ අද කොහොමද වැඩි වෙලා තිබෙන්නේ කියලා. එදා පළාත් පාලන ආයතන සංඛ්‍යාව තිබුණේ 335 යි. මෙවර එය 341 දක්වා වැඩි වුණා. මහ නගර සභා 23 ක් තිබුණා. මේ පාර ඒක 24 ක් වුණා. නගර සභා 41 ඒ විධියටම තිබෙනවා. ප්‍රාදේශීය සභා 271 යි. ඒක මේ පාර 276 දක්වා වැඩි වුණා. මුළු ගණන 341 යි. අලුතෙන් වැඩි වුණු සභාව මොනවාද? මිල්ලනිය ප්‍රාදේශීය සභාව. පොළොන්නරුව මහ නගර සභාව. මස්කෙලිය ප්‍රාදේශීය සභාව. නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව. ආගරපතන ප්‍රාදේශීය සභාව. කොටගල ප්‍රාදේශීය සභාව. දැන් බලන්න මේ මස්කෙලිය ප්‍රාදේශීය සභාව සහ නෝර්වුඩ් ප්‍රාදේශීය සභා ඒ ප්‍රදේශයේ කලින් තිබුණු ප්‍රාදේශීය සභාව. ඒ ප්‍රාදේශීය සභාවේ ජනතාවගේ අදහස් විමසන්නේ නැතුව මේ සුළු පක්ෂවල ඉල්ලීම මත තමයි අලුත් ප්‍රාදේශීය සභාව හැදුවේ. අද ජනවාර්ගික සමගිය ගැන, සංහිඳියාව ගැන කථා කරනවා. එහේ තිබුණු සංහිඳියාව බිඳ දාලා තමයි මේ අලුත් ප්‍රාදේශීය සභා දෙකක් හැදුවේ. එහෙම නම් අඹගමුව

ප්‍රාදේශීය සභාව ඇතුළේ තිබුණු ඒ සංහිඳියාව, සහජීවනය බිඳ දාලා එක පක්ෂයක ඉල්ලීම මත තමයි - එතැන පැහැදිලි ප්‍රශ්නයක් තිබුණා. සිරිපාදේ කියලා කියන්නේ මේ රටේ බෞද්ධයන්ගේ අතිශයින්ම වැදගත් කේන්ද්‍රස්ථානයක්. ඒ පූජනීය ස්ථානය පාලනය වුණේ අඹගමුව ප්‍රාදේශීය සභාවෙන්. අඹගමුව ප්‍රාදේශීය සභාව සම්පූර්ණයෙන්ම ඒකේ හිටපු දෙමළ ජනතාව සහ සිංහල ජනතාව වෙනත් ප්‍රාදේශීය සභා දෙකකට එකතු කළා. දැන් මස්කෙලිය ප්‍රාදේශීය සභාවෙන් තමයි ශ්‍රීපාදස්ථානය පාලනය වෙන්නේ. මේ පිළිබඳව ඒ ප්‍රදේශයේ ජනතාව, භික්ෂූන් වහන්සේලා ශ්‍රේෂ්ඨාධිකරණයටත් ගියා. නමුත් සාධාරණය ඉෂ්ට වුණේ නැහැ. එහෙම නම් මේ මැතිවරණ ක්‍රමය පිළිබඳව නැවත නැවතත් අපි සිතා බැලිය යුතු වෙනවා.

ඊළඟට මුළු සභික සංඛ්‍යාව බලන්න. කලින් මුළු සභික සංඛ්‍යාව හිටියේ 4486 යි. දැන් ඒක 8356 දක්වා වැඩි වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 8356 කියලා කිව්වාට දැන් අපේ මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමා මොකක්ද කියන්නේ? එතුමා කියනවා මේ සභික සංඛ්‍යාව තවත් 200 කින් විතර වැඩි වෙයි කියලා. කොළඹ නගර සභාවට ඒ අය අනුමත කළේ 110 යි. දැන් ඒක 119 දක්වා වැඩි වෙලා තිබෙනවා. හුඟක් තැන්වල මේ තත්ත්වය ඇති වෙලා තිබෙනවා. එහෙම නම් බලන්න මේ සඳහා දරන්න වන පිරිවැය කොපමණද කියලා. කාන්තා නියෝජනය මීට කලින් තිබුණේ 86 යි. දැන් ඒක 1986 ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයට මේ සම්බන්ධයෙන් අලුතෙන් වැය ශීර්ෂයක් එවලා තිබෙනවා අනුමත කරලා දෙන්න කියලා. කීයද? කෝටි 186 ක්. වැඩිපුර කෝටි 186 ක් ඕනෑ කියලා. එහෙම නම් මේ පිරිවැය කවුද දරන්නේ? ප්‍රජාතන්ත්‍රවාදය, කොට්ඨාශ ක්‍රමය කියලා මේ තරම් මිලක් අපි ගෙවන්න ඕනෑද? එහෙම නම් මේ හැම දෙයක් ගැනම නැවත නැවත සිතා බැලිය යුතුයි. ඒ නිසා මේ 50 ට 50 අලුතෙන් මේ පළාත් සභා ක්‍රමයට - පළාත් පාලනවලට 60 යි 40 යි. ඊළඟට පළාත් සභාවලට 50 යි 50 යි. පාර්ලිමේන්තුවට මොන විධියේ ක්‍රමයක් එයිද කියලා මම දන්නේ නැහැ. නමුත් මොකක්ද හරි එක ක්‍රමවේදයකට හැදෙන්න ඕනෑ. අපි සියලු දෙනා පිළිගන්නවා කොට්ඨාශ ක්‍රමයේ සාධනීය ලක්ෂණ තිබෙනවා වාගේම ඒකේ නිශේධනීය ලක්ෂණත් තිබෙනවා. මෙවර පළාත් පාලන මැතිවරණයේදී සංසන්දනය වුණේ පක්ෂ විතරයි. තරග කරන අපේක්ෂකයෝ තියුණුව, තරගකාරීව මතු වුණේ නැහැ. ඒ අය සංසන්දනය වීමක් වුණේ නැහැ. කවුද හොඳම අපේක්ෂකයා කියලා. පක්ෂය තමයි ප්‍රමෝට් කළේ. මාර්කට් කළේ. අපේක්ෂකයා මාර්කට් වුණේ නැහැ. ඔහුව හඳුනා ගත්තේ නැහැ.

ඒක නිසා තමයි සමහර අපේක්ෂකයෝ පේන්නවත් හිටියේ නැහැ. පක්ෂය තමයි ගියේ. නායකයෝ තුන් හතර දෙනෙක් අතරේ තමයි. පක්ෂවල ඉන්න, ප්‍රතිරූපයක් තිබෙන නායකයෝ තුන් හතර දෙනෙක් මැතිවරණ ව්‍යාපාරය මෙහෙයවලා ඡන්දය තමන්ගේ සාක්කුවට දාගත්තා. ගමේ අපේක්ෂකයා කවුද? ගමේ නියෝජිතයා කවුද කියලා ජනතාව දන්නේ නැහැ. ඒ නිසා පැහැදිලිව මේ මැතිවරණ ක්‍රමය පිළිබඳව නැවත අපි සිතා බැලීමක් කරන්න ඕනෑ. ඒ නිසා කඩිනම් විය යුතු නැහැ. ඉක්මන් විය යුතු නැහැ. මේ අලුත් මැතිවරණ ක්‍රමය යටතේම පළාත් සභා මැතිවරණය පවත්වන්න. මේක තව කාලයක් අපි අධ්‍යයනය කරන්න ඕනෑ. මේක හොඳට වැඩ කරනවාද? මේකෙන් සභාවක් පිහිටුවන්න පුළුවන්ද? සභාව ස්ථාවර කර ගන්න පුළුවන්ද? මේ සභිකයෝ කාටද විකිණෙන්නේ? මේවා පිළිබඳවත් බලන්න එපැයි. මේ සියල්ල බලලා කාලයක් අරගෙන මේ ක්‍රමය හොඳයිද, නරකයිද කියන එක පිළිබඳ අපි තුලනාත්මක විග්‍රහයක් කර ගන්න ප්‍රමාණවත් කාලයක් ගනිමින් අලුතින් අපි පවත්වන්න යන පළාත් සභා ක්‍රමය පරණ ක්‍රමයටම පැවැත්විය යුතුයි කියන එකයි ජාතික හෙළ උරුමය විධියට අපේ ස්ථාවරය වන්නේ මේ කියන 70, 30 ක්‍රමයටවත් යා යුතුයි කියන තැනක නොවෙයි අපි මේ මොහොතේ ඉන්නේ. ඒ නිසා අපේ මන්ත්‍රීතුමාගේ මේ යෝජනාව පිළිබඳව එතුමාගේ අදහස් එක්ක මගේ මුළුමනින් එකඟතාවයක් නැහැ. එතුමා දරන දේශපාලන මතත් එක්ක. නමුත් මේ යෝජනාව අපි සාකච්ඡා කරලා ඉදිරියේදී ජනාධිපතිතුමාට, අගමැතිතුමාට, පාර්ලිමේන්තුවට, පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍ය ෆයිසර් මුස්තාපා ඇමැතිතුමාට මේ අදහස අපි විධිමත්ම එක සභාවක් විධියට අපේ සම්මුතිය, එකඟතාවය අපි එතැනට ගෙන යන්න ඕනෑ කියන එකයි මගේ අදහස. මගේ අදහස් දැක්වීම මෙතැනින් අවසන් කරනවා. ඔබ සියලු දෙනාට බොහොමත්ම ස්තුතියි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාවේදී රීති අත්හිටුවලා මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කරනකොට අපි විවිධ පක්ෂ, විවිධ දේශපාලන මතිමතාන්තර ඔළුවේ තියාගෙන කථා කරනවාට වැඩිය මේ සභාවේ වටිනා කාලයත්, ඒ වාගේම එහි නිසි ප්‍රයෝජනයත් ජනතාවට ලැබෙනවාද කියන කාරණාව සලකා බලන්නට අවශ්‍යයි. ඇත්ත වශයෙන්ම මේ හදිසි යෝජනා ගේන්න නියමිතව තිබෙන්නේ, යම්කිසි අර්බුදයකට - එහෙම නැත්නම් අපි හිතමු දැඩි නියඟයක්, දැඩි ගංවතුරක් එහෙම නැත්නම් රටට අහිතකර දෙයක් සිදු වනකොට එවැනි තත්ත්වයකදී තමයි හදිසියේ රීති අත්හිටුවලා යෝජනා ගෙන එන්න සුදුසු වන්නේ.

කෙසේ වෙතත් මේ සිද්ධියේදී විවිධ අය, විවිධ අදහස් දැක් වූවත්, අපි දරන අදහස වන්නේ මේ පනත සම්මත කිරීමට ප්‍රථමයෙන්ම මේ පළාත් සභාවට එව්වා. ඒ අවස්ථාවේදී මෙතැන මන්ත්‍රීවරු කී දෙනෙක් අදහස් දැක්වූවද කියන එක හැන්සාඩ් වාර්තාව අරගෙන අපට බලන්න පුළුවනි. දැන් මේ අයගේ අදහස් අද හෙළිදරව් වෙන්නේ බලය ලැබුණාට පස්සේ මේක වඩාත් ත්‍රිවිර කර ගන්න, තමන්ට විශාල බලයක් නතු කර ගන්න අවස්ථාවක් නැති නිසා ඒ ගැන කලකිරීමකින් තමයි විශේෂයෙන්ම මෙවැනි දෙයක් උද්ගත වෙලා තිබෙන්නේ. නමුත් යම් යම් අඩුපාඩු තිබෙනවා. යම්කිසි නීතියක් පනවලා, ක්‍රියාත්මක කරද්දී තමයි එහි අඩුපාඩුව පෙනෙන්නේ. ඒ අනුව ඒවා සංශෝධනය කරන්න පාර්ලිමේන්තුවටත්, ඒ ජනතාවටත් බලයක් තිබෙනවා. ඒ ජනතාව දෙන බලය අනුව සංශෝධනය කරන්න පුළුවන්. එය අපි නැහැයි කියලා කියන්නේ නැහැ. නමුත් මේ අවස්ථාවේදී ජනතාව දුන්නු ජන බලය, මේ පනත් සම්මත කරද්දී මහජන නියෝජිතවරු කොයිතාක් දුරට පාවිච්චි කළාද කියන ප්‍රශ්නය ගැටළුවක් හැටියට මම නම් දකිනවා. අද වනකොට මේ ඡන්දය පවත්වලා ඉවරයි. නමුත් මේ ඡන්දය පවත්වන්න ඉස්සර මේ කෑගහන අය මොනවාද කිව්වේ? වහාම ඡන්දයක් ඕනෑ. මේක පනත් සම්මත කරන කොට මේක හදිසි කළා. මේක කරන්න දුන්නේ නැහැ. ඒ වෙලාවේත් ජනමතය අවුල් කරන එකක් තමයි කළේ. මේක හදිසියෙන් ඉල්ලුවා. එහෙම නම් මේ පාර්ලිමේන්තුවේ ඉන්න පොහොට්ටුව නියෝජනය කරන අය, එහෙම නැත්නම් එයට සහයෝගය දීපු අයත් පාර්ලිමේන්තුවේ ඉන්නවා. මේ අයට පක්ෂ නායක මට්ටමෙන් මේක සාකච්ඡා කරන්න තිබුණා. පැරණි ක්‍රමයට ඡන්දය තියන්න, නිවාඩුවේ හොඳට කථා කරලා සම්මත කරන්න කියලා. බැසිල් රාජපක්ෂ මැතිතුමාට තමයි මුලින්ම උවමනාව තිබුණේ, මේ පළාත් පාලන ආයතන ඡන්ද ක්‍රමය සංශෝධනය කරන්න. එතුමා මේක භාර අරගෙන සීමා නිර්ණයක් කළා. ඒ වෙලාවේ අපි දැක්කා තමන්ට වාසි වන ආකාරයට තමයි කොට්ඨාශ කඩලා කළේ. අපි ඒ වැරැද්දත් දැක්කා. ඒ නිසා විවිධ යෝජනා කථා කළා. මම හිතන්නේ ඒ පනතේම තිබෙනවා ඒ කොට්ඨාශ නිර්ණය කළාම, නැවත අමාත්‍යවරයාට ඉල්ලීමක් කරන්න පුළුවන්. ඒ අනුව ඒ ෆයිසර් මුස්තාපා ගරු ඇමැතිතුමා නැවත සීමා නිර්ණය සම්බන්ධයෙන් යෝජනා අදහස් ලබා ගත්තා. එතුමා ප්‍රජාතන්ත්‍රවාදීව කටයුතු කළා. මේ මහජන නියෝජිතයින්ට අවස්ථාවක් තිබුණා එතුමා යෝජනා ඉදිරිපත් කරන අවස්ථාවේදී තම තමන්ගේ සාකච්ඡා රට වටේම මේ පිළිබඳව කැඳවනකොට ඒ සඳහා කාලයක් දීලා තිබුණා. ඒ අවස්ථාවේදී තමන්ගේ වැදගත් යෝජනා දෙන්න කාටවත් උනන්දුවක් තිබුණේ නැහැ. කිහිප දෙනෙක් පමණයි ඒ අදහස් ලබා දුන්නේ.

දැන් අද වනකොට අපි දකිනවා, මේ කොට්ඨාශ ක්‍රමයේ තිබෙන වටිනාකම තමයි කෝටි ගණනක් මහජන මුදල් ඉතිරියක් සිද්ධ වෙනවා. විශාල වශයෙන් ජනතාව නොමඟ යවමින්, අනවශ්‍ය බලපෑම් කරමින් ඡන්දය කරන්න බැහැ. තමන්ගේ කොට්ඨාශ තුළ විතරයි ඒ ඡන්දය පවත්වාගෙන යන්න පුළුවන්. වෙනත් අයට මනාප ඉල්ලලා විවිධ ප්‍රතිලාභ ලබලා දීලා ඡන්ද ගන්න බැරි ක්‍රමයක්. ඒ වාගේම මැතිවරණ පැවැත්වීමේදී විවිධ දේවල් ඉවත් කරන්න යන කෝටි ගණනක් රජයට ඉතුරු වුණා. ඒ වාගේම ඡන්දය බොහොම සාමකාමී සහ වැදගත් ආකාරයට සිද්ධ වුණා. ලංකා ඉතිහාසයේ තිබුණු ඉතාම ප්‍රජාතන්ත්‍රවාදය අගය කරන නිදහස් මැතිවරණයක් හැටියට මේ මැතිවරණය හඳුන්වන්න පුළුවන්. එවැනි වාතාවරණයක් හදලා දීලා තියෙද්දී එය ක්‍රියාත්මක කරද්දී යම්කිසි දෝෂයක් තිබෙනවා නම් එය නිවැරැදි කර ගැනීමට පාර්ලිමේන්තුවට අවස්ථාව තිබෙනවා. ජනතාවට අවස්ථාව තිබෙනවා ඒ සඳහා සම්බන්ධ වෙන්න. ඒ වාගේම මහජන නියෝජිතයන්ටත්

වගකීමක් තිබෙනවා තමන්ගේ පක්ෂය ගැන, තමන් ලබා ගන්න ඉන්න වාසිය ගැන හිතන්නේ නැතුව ඒක සැබවින්ම මහජන නියෝජනයක් නිරූපණය කරන සහ මහජනයාට වැඩක් කරන්න පුළුවන් හැකියාව ලැබෙන ආයතනයක් හැටියට නිර්මාණය කරන්න, සාධනීය ලක්ෂණ වැඩිදියුණු කර ගන්න යෝජනා ඉදිරිපත් කරන්න අවස්ථාවක් තිබෙනවා.

කෙසේ වෙතත් අපි මේ යෝජනාව කථා කරන්න කියලා අපත් කැමැත්ත ප්‍රකාශ කළේ මෙහිදී පැවැත් වූ ඡන්දය ගැන අදහස් උදහස් කියන්න අවස්ථාවක් ලැබීම ඉතාම වටිනවා. අද කවුරු මොනවා කිව්වත් ඒ බලයේ ඉන්න පක්ෂය හැමදාම කරන්නේ තමන්ට බලය ලබා ගන්න පුළුවන් ක්‍රමයක් තමයි හොයා ගන්නේ. නමුත් අද එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ මේ සන්ධානගත වෙලා ඉන්න ජාතික ආණ්ඩුව තමන්ට බලය ලබා ගන්න ක්‍රමයක් නොවෙයි, විපක්ෂයේ ඉන්න පක්ෂයකට දේශපාලන බලය ක්‍රියාත්මක කිරීමේදී මැදිහත් වෙන්න පුළුවන් ක්‍රමයක් තමයි බෙහොම නිහතමානීව හඳුන්වලා දීලා තිබෙන්නේ. දැන් අද මේ පොහොට්ටුව පක්ෂය ජයග්‍රහණය කළත්, ඔවුන් බලාපොරොත්තු වුණේ, ඔවුන් විපක්ෂයට යනවා කියන මතය තමයි ඔවුන්ගේ හිතේ තිබුණේ. නමුත් අපි මේ ඡන්ද ක්‍රමයේදී දැක්කේ විපක්ෂයට තමයි වැඩි නියෝජනයක්, වැඩි අවස්ථාවක් ලබලා දීලා තිබුණේ. ඒකේ වටිනාකම තිබෙන්නේ, අවුරුදු 20 ක් එදා ආණ්ඩු කරපු තැනදී අපි දැක්කා පෞද්ගලික ඉඩම්වල පවා රජයේ මුදල් භාවිතා කරලා යම් යම් දේවල් ගොඩ නහලා තිබෙනවා. ඒවා වැරැදි විධියට පාවිච්චි කරලා තිබෙනවා. අද විගණකාධිපති වාර්තා කිහිපයක් අතට ලැබුණා. ඒවා බලද්දීත් අපි දන්නවා මූල්‍ය අවභාවිතාවන් රාශියක් තිබෙනවා. මේ සියල්ල සිද්ධ කළේ, වැඩි බලතලයක් ඒ සභාවට තිබුණු නිසා. අද තිබෙන ක්‍රමය අනුව විපක්ෂය වුණත් යහපත් යෝජනාවක් ගෙනාවොත් ඒක හොඳ නම් ඒක ක්‍රියාත්මක කරන්න බැරිකමක් නැහැ. දැන් මේ උත්සාහ ගන්නේ, ඒ බලයේ ඉන්නේ පක්ෂයට උවමනා දේ කරගන්න නිසා ඒ බලය අවශ්‍යයි කියන මතයක් තමයි ගොඩනහා ගන්න හදන්නේ. මෙහි කාන්තා නියෝජනය සම්බන්ධයෙන් යම්කිසි අඩුපාඩුවක් තිබුණා. එහි සඳහන් කරලා තිබුණේ නැහැ. ඒ නියෝජනය කොයි කොයි මන්ත්‍රීවරුන් පත් වන අයගෙන් කොයි කොයි ආකාරයට යනවාද කියන එක. මේ ඒකාබද්ධ විපක්ෂය පාර්ලිමේන්තුවේත් නිතරම කෑගහනවා. ඉතින් මේ පනත් සම්මත කිරීමේදී පාර්ලිමේන්තුවට යන්නේ නැතුව ගෙදර හිටපු අයට තිබුණා සාධනීය ලක්ෂණ මේකට එකතු කරන්න. එවැනි දෙයක් සිද්ධ වුණේ නැහැ. අපි දැක්කා පසුගිය කාලයේ අවුරුදු 10 ක් 20 ක් එක පක්ෂයක් බලයේ ඉන්නවා. අද ඒ ක්‍රමය වෙනස් කරලා විනිවිදභාවයෙන් යුතුව ජනතාවට අද වුණත් මේ පවතින ආණ්ඩුව වෙනස් කරන්න, පවතින පළාත් සභාව වෙනස් කරන්න, පවතින ප්‍රාදේශීය සභාව වෙනස් කරන්න අවශ්‍ය තැනදී බලය දෙන්න තමයි මේ ක්‍රමය හඳුන්වලා දීලා තිබෙන්නේ. අද සාමකාමී ඡන්දයක් පවත්වලා මේ රටට ගුණ යහපත් වැඩ කටයුත්තක් හඳුන්වලා දුන්නාම, ඒ අය තමන්ගේ වාසිය ගැන සමහර වෙලාවට කථා කරනවා මිසක් මෙහි හොඳ ගැන කථා කරන්නේ නැහැ.

අපි දැක්කා පසුගිය කාලවලදී වයඹ පළාතේ ඡන්දයක් තියෙන කොට කාන්තාවන්ගේ ඇඳුම් ඉරලා, ඇදගෙන ගිහිල්ලා බොහොම ම්ලේච්ඡ විධියට තමයි ඡන්දය පැවැත්වූයේ. මේ සියලු වෙනස්කම් සිද්ධ කළේ, අභිනවයෙන් පත් වුණු ආණ්ඩුව. හැබැයි මෙවැනි වැදගත් ඡන්දයක් පවත්වලා අද රටට දුන්නු ආදර්ශය තමයි, හොරකම් වැඩියෙන්ම කරපු කෙනාට තමයි ඡන්ද ලබා ගන්න පුළුවන් කියන මතයක් අද තිබෙනවා. ඒ නිසා මන්ත්‍රීවරු අපි (බාධා කිරීම්) දැන් අපි රනිල් මහත්තයාටත් කියනවා හොකරම් සීයක් විතර - මහින්ද මහත්තයා සීයක් කරනකොට මේගොල්ලෝ දාහක් විතර කළා නම්, ඒ අයටත් දිනන්න තිබුණා. ඒ නිසා එකක් කරලා හරි යන්නේ නැහැ. දාහක් විතර කරන්න තිබුණා. ඉතින් එවැනි ජන විඥානයක් තමයි මේ ඡන්ද ක්‍රමයේ අපි දැක්කේ. මෙපමණ සාධනීය මැතිවරණ ක්‍රමයක්, මෙපමණ සාධනීය වෙනසක් කළාට ඒක අගය කරන්නේ නැහැ. ඉතින් අපි අද තේරුම් ගන්න ඕනෑ දේ තමයි සමස්ත ජනතාව මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීම. මහජනතාවගේ නියෝජිතයෝ හැටියට මේ හැම කෙනෙකුගේම වගකීම. ඒක තමන්ගේ වාසියට, තමන්ගේ ලෙහෙසිට, තමන්ගේ එල ප්‍රයෝජනය වැඩි විධියට අර්ථ නිරූපණය කරලා හරි යන්නේ. මේක සැබවින්ම මහජනතාවට සාධනීය වන ආකාරයට ජනගත කිරීම තමයි මේ මන්ත්‍රීවරු හරහා සිද්ධ වන්නට ඕනෑ. ඉතින් මෙහිදී අපි දකිනවා, පුංචි පුංචි අඩුපාඩු තිබෙනවා. නමුත් මේ කොට්ඨාශ ක්‍රමය සාර්ථකයි.

[ගරු රෝස් ප්‍රනාන්දු ]

මෙකේ වියදම, ඒ වාගේම පනතේ තිබෙන අඩුපාඩු පාර්ලිමේන්තුවේ සාකච්ඡා කළා. සාකච්ඡා නොකළා නොවෙයි. සමහර මන්ත්‍රීවරු සහභාගී වුණෙත් නැහැ. අද වුණත් මේ සාකච්ඡාව ගන්න කොට සමහර අය සහභාගී වෙන්නේ නැහැ. කථා කරන්නේ ඉතාම සුළු දෙනයි. ඒ මන්ත්‍රීවරුන්ට ඒ පිළිබඳව උවමනාවක් නැහැ. අපි පක්ෂ, විපක්ෂ සහ මේක කාටවත් සුදු හුණු ගාන දෙයක් නොවෙයි. ඇත්ත වශයෙන්ම අපි මන්ත්‍රීවරු හැටියට පාර්ලිමේන්තුවයි, පළාත් සභාවයි, තම තමන්ගේ කාර්ය භාරය හරියට ඉෂ්ට කරනවා නම් මෙවැනි සිදුවීම් සිද්ධ වෙන්නේ නැහැ. ඒ කියන්නේ, තමන් අවබෝධයෙන් වැඩ කටයුතු කරනවා නම්. මේ පළාත් සභාව පවා සමහර දේවල් කථා කරන කොට හැන්සාඩ් එකට වැරැදි දෙයක් යනවා. මෙතැනි කථා කරනවා. අවසානයේ සමහර පළාත්වල ඡන්ද විමසීම්වල අඩුපාඩු සිද්ධ වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම තොරතුරු තාක්ෂණ පනතේදී එදා මෙතැන විරෝධතාවයක් ප්‍රකාශ වුණා. ඒක හරියට සභාවේ නීත්‍යානුකූල මට්ටමක සිදු වෙලා තිබුණේ නැහැ. එවැනි දේට වග කියන්න ඕනෑ, මේ වගකීමක් දරන මහජන මන්ත්‍රීවරු. ඒ සක්‍රීය දායකත්වය හැම කෙනාම දුන්නා නම් මේ අඩුපාඩු මහ හරවා ගන්න තිබුණා. ඒ නිසා මම විශේෂයෙන්ම සඳහන් කරනවා මේ රටේ තමන්ට හැමදාම බලයේ ඉන්න කියලා නීති හදා ගන්නවාට වැඩිය විපක්ෂයේ ඉන්න අයට යම්කිසි බලයක් දීම වැරැදි නැහැ. ඒකේ සිද්ධ වෙන්නේ කෙටි කාලසීමාවක් තුළ ඒ පාලන තන්ත්‍රය වෙනස් කරන්න ඕනෑ නම්, ජනතාවට ඒකට අවස්ථාවක් ලැබෙනවා. ඒ අවස්ථාවෙන් තමයි අද මේ පොහොට්ටුව ප්‍රයෝජනයක් ගත්තේ. ඉතින් ඒ අවස්ථාව හදලා දුන්නේ මේ ආණ්ඩුව. ඒ නිසා මේ ආණ්ඩුව තමයි ඒකෙනුත් ප්‍රයෝජනයක් ගත්තේ. එතකොට එදා තිබුණු ක්‍රමයට කළා නම්, ගහලා හරි, මරලා හරි, සල්ලි දීලා හරි, මොන ජාතියෙන් හරි දිනන ක්‍රමයක් ඉස්සර තිබුණේ. ඒ ක්‍රමය තිබුණා නම් අද ඔය රතු ඇඳගෙන ඇවිල්ලා මෙතැන කෑ ගහන්න පොහොට්ටුවේ කාටවත් හම්බ වෙන්නේ නැහැ. ඒ නිසා තමුන්නාන්සේලා ස්තුතිවන්ත වෙන්න ඕනෑ. අද මේ සියලු දෙනාම ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මේ පවතින ආණ්ඩුව නිසා තමයි තමුන්නාන්සේලාට අද ඔය විධියට කථා කරන්න හම්බ වුණේ. ඒ නිසා ජනමතයට අපි ගරු කරනවා. විශේෂයෙන්ම අපි ජනමතයට ගරු කෙරුවත් හැබැයි, ජනතාව ජාතිවාදීව එහෙම නැත්නම් මේ රණවිරුවෙකුට අපහාස කළාය කියලා රණවිරුවෝ සම්බන්ධයෙන් කරට අරගෙන, ජාතිවාදය අවුස්සාගෙන, මේ රටේ ජනතාව නොමග ඇරීම ගැන නම් අපේ ප්‍රසාදයක් නැහැ. කෙසේ වෙතත් ඒ ජනතාව නිසි තැනට ගෙනියන්න ඒ ඡන්ද ක්‍රමය අපි ඇති කර ගන්න ඕනෑ. සමස්ත ජනතාව ඉස්සරහාට ගෙනියන්න. මහ බැංකු හොරු ඉන්නවා නම්, ඒ හොරුන්ටත් නීතියෙන් දඬුවම් කරන්න ඕනෑ. ඒ හොරුන්ටත් දඬුවම් කරන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඔය ඇති.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

විශේෂයෙන්ම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තමන්ට වාසි වෙන ටික කියලා, අවාසි වෙන ටික කියන කොට කෑ ගහන්න ඕනෑ නැහැ. ඒ නිසා අපි මෙතැනදී කථා කරන්නේ, අපි පොහොට්ටුවට වාසි වෙන්නවත්, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට වාසි වෙන්නවත්, රනිල් වික්‍රමසිංහ මැතිතුමාට වාසි වෙන්නවත් නොවෙයි. මේ සමස්ත ජනතාවට යම්කිසි ප්‍රතිලාභයක් ලැබෙන ක්‍රමයකට අපි වෙනස් වෙන්න ඕනෑ කියන මතයේ ඉඳන් අපි කථා කරන්නේ.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද වන කොට අපි දකිනවා. ජනතාව ජන මතය දුන්න අය තමයි රට පාලනය කරන්න ඕනෑ. එවැනි අඩුපාඩුකම් අද තිබෙනවා. දැන් ජනමතයක් දුන්න එක්සත් ජාතික පක්ෂය නොවෙයි පසුගිය කාලයේ රට පාලනය කළේ. හවුල් - ජාතිය ගොඩ නගන්න, එහෙම නැත්නම් ජාතිය නගා සිටුවන්න, ඒ සියලු දෙනාගේම සහයෝගය අරගෙන ජාතික ආණ්ඩුවක්. උදාහරණයක් හැටියට, අපි ඒ ආසන දිනන කොට ඒවා පාලනය කිරීමේ බලය ඒ අයට නොවෙයි ලැබුණේ. වෙනත් කොටසකට ලැබුණේ. ඒ නිසා තමයි ඒ විකෘතිභාවය අද රට පුරාම පවතින්නේ. ඒ නිසා මේ විකෘතිභාවය වෙනස් කරන්න නම්, මේ දේශපාලන නායකයින්ගේ ඔලුවේ තිබෙන විකෘතිභාවය ඉස්සෙල්ලාම අයින් කරන්න ඕනෑ.

ඒ නිසා දැන් මහින්ද රාජපක්ෂ මැතිතුමා, ඇත්ත වශයෙන්ම මේ සාධාරණ ඡන්දය අපි තියන කොට අර ගමේ හිටපු ඇසිලින් අක්කා, මැගිලින් අක්කාගේ දුව එහෙම නැත්නම් ජේම්ස් අයියාගේ පුතා ඡන්දය ඉල්ලන කොට මෙහා පැත්තේ අපේක්ෂකයා වුණේ මහින්ද රාජපක්ෂ. මහින්ද රාජපක්ෂ තමයි සමහර ඒ පුංචි මන්ත්‍රීවරු පරාද කරලා - අද මම කියනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉතාම දක්ෂ පක්ෂ, ඉතාම හැකියාව තිබෙන, රටට සේවය කරපු, වැදගත් සමාජ සේවයක් කරපු ඒ වැදගත් මන්ත්‍රීවරුන්ට පැරදිලා ගෙදර යන්න සිද්ධ වුණේ, මේ බලලෝභය නිසා. තමන්ගේ ප්‍රතිරූපය අරගෙන, ජාතිවාදය අරගෙන ජනතාව නොමග ඇරීම නිසයි අද මේ ප්‍රතිඵලය ලැබුණේ. ඒ නිසා එවැනි කූට උපක්‍රම මගින් බලය ලබා ගන්න නිසා, තමන්ගේ ගොඩ වැඩි කර ගන්න නිසා මෙවැනි දේ කිරීමෙන් ජනතාව නොමග යැවීමෙන් අපි නවතින්න ඕනෑ. මහරගමට වෙලා තිබෙන්නේ ඒක. දිවුලපිටිය පදිංචිකාරයෝ තමයි මහරගමින් දිනන්නේ. මේ දේශපාලනය විකෘති කරනවා. මේ දේශපාලනය විකෘති කරන එක තේරුම් ගන්න ඕනෑ. (බාධා කිරීම්) ජනමතය වෙනස් වෙන්නට ඕනෑ. ඒ නිසා මේ සියල්ල වෙනස් කරන්නට බුද්ධිමත්ව කටයුතු කරන්න අවශ්‍යයි. අද අපි සන්තෝෂ වෙනවා. මුහුණු එක දහයක් දොළහක් හරි මෙතැන තිබෙන එක ගැන. මේ පනත ගේන අවස්ථාවේ සමහර මන්ත්‍රීතුමන්ලා මේ පනත කියවලාවත් ආවේ නැහැ. එදා අපට න්‍යාය පත්‍රය තේරුම් කරන්න ගියාම, අපට ඒ න්‍යාය පත්‍රය අරගෙන වැඩ කටයුතු කරද්දී සමහරු දැන ගෙන හිටියේ නැහැ න්‍යාය පත්‍රයේ පනත එනවා කියලා. ඉතින් එවැනි තත්ත්වයක් තියාගෙන තමයි අද මේ පනත ගැන කියන්නේ. විවිධ සංශෝධන වෙන්න ඕනෑ කියලා.

ඒ නිසා මම ගරු ඔබතුමා මගින් කියනවා. ඒ ජනමතය විකෘති කර ගෙන කරන දේට වැඩිය අද වැදගත් දේශාපාලනයක් - බලයේ ඉන්න පක්ෂය බලය රැක ගන්න උත්සාහ කරන්නේ නැතිව, ඒ විපක්ෂයේ ඉන්න අයට බලය දීලා තිබෙද්දී පොහොට්ටුවට අද රතු ඇඳුම ඇඳගෙන ඩාන්ස් එකක් දාන්න හම්බ වෙලා තිබෙන්නේ, එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ ඒ වැදගත් ආණ්ඩුවට පින් සිද්ධ වෙන්න. අද මම තමුන්නාන්සේලාට කියනවා, තමුන්නාන්සේලා මේ බැඳුම්කරය අරගෙන රට වටේ ගියාට මේ ඇමතිවරයා මේ වැරදි චෝදනා එන කොට ඇමතිවරයා අයින් කරපු, පරීක්ෂණය කරපු එකම ආණ්ඩුව මේ. අද විගණකාධිපති වාර්තා එනවා. මේවාවල තිබෙන මූල්‍ය වංචා ටික අරගෙන බැලුවොත් අවුරුදු ගණනකට නඩු කියලා ඉවර කරන්න බැහැ. ඒ නිසා තමුන්නාන්සේලාගේ වැඩිය හොලවන්න යන්න එපා. (බාධා කිරීම්) ඒ වැදගත් වෙනස කරපු ඒ ආණ්ඩුවට ඒ ගරුත්වය දීලා, තමුන්නාන්සේලා ජනමතයට ගරු කරලා තමුන්නාන්සේලාගේ කටයුත්ත කරන්න. මෙහිදී ඒ වැදගත් සංශෝධන කරන්න ඒ සියලු දෙනාම ඒකරාශීව කටයුතු කරන්න ඕනෑ. ඒ සඳහා ඒ අඩුපාඩු සකස් කර ගැනීම, සංශෝධනය කර ගැනීම, ඒ ජනමතයට අනුව සිදු කළ යුතුයි කියලා ප්‍රකාශ කරමින්, මේ ගරු මන්ත්‍රීතුමන්ලා මේක ගෙනාවේ රටට ආදරයට නොවෙයි. ජනතාවට ආදරයටත් නොවෙයි. තමුන්ට බලය අරගෙන පරණ සෙල්ලම දාන්න කියන එකත් කියමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේදී ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Lalith Ellawala M.P.C took the Chair*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මීළඟට උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව යම් කොටසක් ප්‍රතික්ෂේප කරන්න උත්සාහ කළත්, අපි විශ්වාස කරන්නේ, රටක නීති සම්පාදනය කරන්නේ පාර්ලිමේන්තුවෙන් වුණත්, අපිත් මහජන නියෝජිතයෝ වශයෙන් අපට තිබෙන මතයක් ඉදිරිපත් කරන්න තිබෙන උත්තරීතර සභාවක් තමයි මේ පළාත් සභාව. ඒ සභාවේ අපි කරන මතය

[ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ ]

පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරයෙක් හරි, අහන කෙනෙකු හරි, මාධ්‍යයක හරි ගිහිල්ලා රටේ ජන මතයක් බවට පත් කිරීමේ වුවමනාවක් අපට තිබෙනවා. ඒ නිසා මේ පැවති පළාත් පාලන මැතිවරණය. මම අද දැක්ක සුවිශේෂතාවය. මම මේ පළාත් සභාව නිතරම නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් වශයෙන් අද ජනතා විමුක්ති පෙරමුණ වෙනස් ආකාරයෙන් තමයි හැසිරුණේ. වෙනදාට වඩා වෙනස්. වෙනදාට වඩා බාධා කළා. වෙනදාට වඩා රැඳී ඉන්නවා. මොකක් හරි ඒගොල්ලන්ගේ තිබෙනවා රහසක්, මේ මැතිවරණ ක්‍රමය සම්බන්ධව. අපි ඒකට බාධා කරන්නේ නැහැ. මේක සම්පාදනය කිරීම සම්බන්ධයෙන් ජනමතයක් ඒගොල්ලන්ට තිබෙන්න ඇති. හැබැයි, ප්‍රාදේශීය සභාවක්, පළාත් පාලන ආයතනයක් බිහි වෙන කොට එතැන අභිමත බලයක්, එතැන පත් වන කණ්ඩායමට බලයක් ගොඩ නැගෙන්නට ඕනෑ. ඒ බලය ගොඩ නැගුනේ නැති තැන මේ ප්‍රදේශයේ ජනතාවට කරන්න පුළුවන් සේවාවන් අඩපණ වෙනවා. ඒ නිසා අපි විශ්වාස කරන්නේ, මේ ක්‍රමය වෙනස් වෙන්නට ඕනෑ. ඊළඟට මේ බස්නාහිර පළාත් සභාවට ගේන ක්‍රමයත් වෙනස් වෙන්නට ඕනෑ. ඒ නිසා මේක අපට නීතියක් වශයෙන් ක්‍රියාත්මක කරන්න බැරි වෙන්න පුළුවන්. හැබැයි, අපේ මතයක් බවට පත් කරලා, ඒක මතයක් බවට අපි රට තුළට ඉදිරිපත් කරන්නට ඕනෑ.

ඒ නිසා අද අපි අත්තනගල්ල ආසනය ගත්තත්, එහෙම නැත්නම් ආසනවල විශාල ජයග්‍රහණයන් ලබලා තිබෙනවා. අද මැතිවරණ කොමසාරිස්තුමාට බැරි වෙලා තිබෙනවා තවම හරියට සභික සංඛ්‍යාව කියන්න. අත්තනගල්ල ප්‍රාදේශීය සභාවට ඉන්න සභිකයින් ගණන තවම එතුමාට හරියට කියන්න බැරි වෙලා තිබෙනවා. හරියට කාන්තාවන් ගණන කියන්න බැරි වෙලා තිබෙනවා. ජා -ඇළ ප්‍රාදේශීය සභාවට දැන් සභිකයෙක් ඊයේ දිනයේ වැඩි වුණා. අත්තනගල්ලට ඊයේ දිනයේ එක්කෙනෙක් අඩු වුණා. මොකක්ද මේ ඡන්ද ක්‍රමය. ඒ නිසා මේක කවුරුවත් දන්නේ නැති ඡන්ද ක්‍රමයක්. කාටත් අවබෝධයක් නැති, කාන්තා නියෝජනය ලබා දෙන්න බැරි, ඒ වුණාට මහා වර්ණනාවෙන් කරපු මේ ක්‍රමය අද හැම කෙනාටම තේරෙන්නේ නැහැ, මේ මැතිවරණ ක්‍රමය. ඒ නිසා මේක ජනතාවට තේරුම් යන, ජනතාවට හොඳ නියෝජිතයෝ පත් කර ගන්න පුළුවන් මැතිවරණයක් කරන්නට ඕනෑ. නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා කිව්වා, පුද්ගලයින්ට නොවෙයි. පක්ෂයට තමයි ඡන්දය දුන්නේ කියලා.

ඒ නිසා අද මම මේ සභාවෙන් අහන්නේ, අද රූපවාහිනිය පාළුයි නේද? අත්තනගල්ල ගැන ඔබතුමන්ලාට හිතාගන්න පුළුවන් නේ? අපි තමයි අත්තනගල්ලට දුන්නේ සටන. රූපවාහිනියත් පාළු වෙලා ගියේ මේ දේශපාලන පක්ෂ තමයි ඉදිරියට එන්න උත්සාහ කළේ. එහෙම එන්න බැරි වුණා. එහෙම ජන මතයක් සමාජගත කරන්න උත්සාහ කළාට, අපි නිවැරදිව ඒ ජන මතය සමාජයට ලබා දුන්නා. ඒ නිසා අද ඒ දේශපාලන මතය තිබෙනවා. ඒ නිසා මම දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. කල් වේලාව ගත වෙලා තිබෙන නිසා. මේ පළාත් පාලන ආයතන බිහි කළාට පස්සේ ආණ්ඩුව කියනවා, පළාත් පාලන ආයතනවලට පත් වෙන මන්ත්‍රීතුමන්ලා ගරු සේවයේ යෙදෙන්න ඕනෑ කියලා. ගරු සේවයේ යෙදෙන්න ඕනෑ නම් මේක ගැසට් කරන කොටම කියන්න තිබුණා, ගරු සේවයට කැමැති අය එන්න කියලා. මුදල් වියදම් කරලා, තමන් කාලය කැප කරලා, මන්ත්‍රීතුමන්ලා පත් වුණාට පස්සේ - පාර්ලිමේන්තුවට පත් වෙලා එතැනින් එළියට එන කොට වාහන බලපත්‍රය අරගෙන, තමන්ගේ වරප්‍රසාද ටික අරගෙන ඇවිල්ලා ඒවා භුක්ති විඳින පාර්ලිමේන්තුවේ ඇමතිවරු, මන්ත්‍රීවරු කියනවා, ගමේ පත් වෙන අහිංසක පළාත් පාලන මන්ත්‍රීතුමාට ගරු සේවය කරන්නය කියලා. එහෙම ගරු සේවයක් කරන්න ඕනෑ නම් කලින් කියන්න ඕනෑ. ගරු සේවයට කැමැති අය ඇවිල්ලා මේ පළාත් පාලන ආයතනයට තරඟ කරන්න කියලා. මම පෞද්ගලිකව මගේ විරෝධතාවය දක්වනවා. එහෙම පළාත් පාලන ආයතනවල ගරු සේවය කරන්න බැහැ. කවුරුහරි කෙනෙකු කැමැත්තෙන් කරනවා නම් අපට ගැටළුවක් නැහැ. නමුත් මේ රටේ මහජන නියෝජිතයන්ට ලැබෙන්න ඕනෑ වරප්රසාද පනතකින්, නීතියකින් හෝ සභාවෙන් ලැබෙන්න ඕනෑ හැම වරප්‍රසාදයක්ම, හැම මන්ත්‍රීතුමාටම ලැබෙන්න ඕනෑ. ඒක අපට ලැබෙනවා නම්, පාර්ලිමේන්තුවට ලැබෙනවා නම්, පළාත් පාලන ආයතන නියෝජිතයන්ටත් ලැබෙන්නට ඕනෑ. ඒ නිසා මම දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. නමුත් මේ පළාත් පාලන ක්රමය බෙදන කොට අත්තනගල්ල ආසනයේ මුස්ලිම් ඡන්ද 6000 ක් තිබෙන ගමකට සිංහල ඡන්ද 2000 ක් එකතු

කරලා කොට්ඨාශ බෙදනවා. සිංහල ඡන්ද 2000 ක් 1500 ක් තිබෙන තව තැනකට මුස්ලිම් ඡන්ද 4000 ක් එකතු කරනවා. සම්මුතිවාදී ආණ්ඩුවක් ගැන කථා කරන මිනිස්සු. සම්මුතිවාදය ඇති කරපු මිනිස්සු අතර ජාතිවාදය වැපිරෙව්වා මේ මැතිවරණයෙන්. මුස්ලිම් ජනතාව ඇවිල්ලා කිව්වා, අපේ එකා දිනවන්න කියලා. අපි ගිහිල්ලා කිව්වා, සිංහල මිනිහා දිනවන්න කියලා. මිනිස්සු අතර සංහිඳියාව ඇති කරන්න නම් කොට්ඨාශ කඩන කොට, නිර්ණය කරන කොට තිබුණා මුස්ලිම් ජන ප්‍රදේශයේ ඡන්ද 6000 ක් 7000 ක් තිබෙන අපේ ප්‍රදේශයේ ජනතාවට මුස්ලිම් නියෝජිතයෙකු පත් කරන්න, මුස්ලිම් කලාපයක් වෙනම කඩලා දෙන්න. ඒ ගම දෙකට තුනට කඩලා, සිංහල ගම් ටික එකතු කරලා, මිනිස්සු අතර අරගල ඇති කරලා, ඒ අය අතර ජන සමාජයේ විවිධ ගැටුම් ඇති කරන දේශපාලන ක්රමයක් තමයි මේ ක්‍රමය තුළ ඇති කරලා තිබෙන්නේ. ඒ නිසා ආණ්ඩුව වැදි බණ කිය කියා, සම්මුතිවාදය බිඳ දා ගෙන, ජනවර්ග අතර ගැටුම් ඇති වන විධියට මේ දේශපාලන කතිකාවත ඉදිරියට අරගෙන ගියා කියන එක තමයි මට කියන්න තිබෙන්නේ.

ඒ නිසා මම හිතනවා, මේ මැතිවරණ ක්‍රමය වෙනස් වෙන්නට ඕනෑ. පළාත් සභා වුණත් ඒ අභිමතයන් පරිදි පාලක පක්ෂයක් බිහි වෙන්නට ඕනෑ. ඒ 50 ට 50 ක්‍රමය වෙනස් වෙලා, මේ සභාව හෝ වෙනත් අපි ගන්නා වූ තීරණයන් අනුව වඩා නිවැරදි පාලන ඒකකයක් බිහි කරන්න ඕනෑ. ඒක පක්ෂය මොකක්ද නොවෙයි. පොහොට්ටුවද? අලියාද? සීනුවද? කියන එක නොවෙයි. පැහැදිලි පක්ෂයක් එන්නට ඕනෑ. අනික් එක තමයි සභිකයෙකු පත් කරන කොට ඔහුට තිබෙන්නට ඕනෑ, යම් සියයට ගණනක්. මේ ඡන්ද ප්‍රමාණය ගත්ත කණ්ඩායමට විතරමයි මේ මැතිවරණයේ මන්ත්‍රීවරයෙකු වශයෙන් බිහි වෙන්නේ. ඡන්ද 1000 ගත්ත කෙනාටත්, 3000 ගත්ත කෙනාටත් මන්ත්‍රීවරු හම්බ වෙනවා. එතකොට ප්‍රධාන පක්ෂවල අය දැන් කියනවා, අපි මොකටද ප්‍රධාන පක්ෂයෙන් ඉල්ලන්නේ. අපි ස්වාධීන කණ්ඩායමෙන් ඉල්ලා ගෙන ගිහිල්ලා ඡන්ද 1500 ක් අරගෙන අපටත් මන්ත්‍රීකමක් ගන්න පුළුවන්. අපි ඡන්ද 50,000 ක්, 52,000 ක් අරගෙනත් අපි ගන්නා හා සමාන අනුපාතයට - සමහර වෙලාවට අනුපාතය වෙනවා 2500 ක් විතර. හැබැයි, ස්වාධීන කණ්ඩායමට ඡන්ද 1200 ටත් මන්ත්‍රීවරයෙක් බවට පත් වෙලා ඉන්නවා. ඒ නිසා ප්‍රධාන පක්ෂ හැල්ලුවට ලක් වෙන, මිනිස්සුන්ගේ දේශපාලන මතයන් විනාශ කරන, ඒ වාගේම ගම තුළ ගැටුම් ඇති වන මැතිවරණ ක්‍රමයක් මෙය. මේක මීට වඩා විවෘතව කථා කරලා, මේකට විසඳුම් සොයලා, මන්ත්‍රීවරයෙකු බිහි වන අවම ක්‍රමයක් එක්කෝ සියයට ගණනක්, එක්කෝ මැතිවරණයෙන් ලබන්නා වූ ප්‍රතිඵල අනුව ඡන්ද සංඛ්‍යාව අනුව කටයුතු කරලා මේ විකෘති වෙලා තිබෙන සභිකයන් පත් කරන ක්‍රමයත්, කාන්තා නියෝජනයත් සම්බන්ධයෙනුත් මේ සභාවේ අවධානය යොමු කරලා, ඒවා නීතියක් බවට පත් කරන්න බැරි නම්, ජන සමාජය තුළ සම්මතයක් බවට පත් කරන්න හරි කටයුතු කරන්න අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව අගය කරමින්, ඊට සහාය දක්වමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ඉතාම කාලෝචිත වැදගත් යෝජනාවක් හැටියට අපි දකිනවා. මොකද, 50% ක් කොට්ඨාශ ක්‍රමයටත්, 50% ක් ලැයිස්තු ක්‍රමයටත් පළාත් සභා මැතිවරණය පැවැත්වුවොත් මම හිතන්නේ, පළාත් සභා එකක්වත් ස්ථාවරව පිහිටුවන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. දැන් ඒකේ හොඳම උදාහරණය තමයි පළාත් පාලන මැතිවරණය. 60% යි 40% යි ඇවිල්ලත් අද පළාත් පාලන ආයතන කර ගෙන යන්න බැරි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. එදා පළාත් පාලන පනත හැදුවේ, ඒ විධායක ජනාධිපතිවරයාට තිබෙන බලයට සමාන බලයක් සභාපතිවරයාට ආරූඪ කළේ ඒ පළාත් පාලන ආයතන කර ගෙන යන්න ඕනෑ නිසා. අද ඒ තත්ත්වය වෙනස් වෙලා මේ තත්ත්වයට පත් වුණාම, ඒ පළාත් පාලන ආයතනවලින්, එහෙම නැත්නම් පළාත් සභාවෙන් වරප්‍රසාද භුක්ති විඳින ජනතාවට තමයි අසාධාරණය සිද්ධ වෙන්නේ. ඒ නිසා අපි පැහැදිලිවම කියනවා. මේක එක්කෝ පරණ ක්‍රමයට තියන්න. එහෙම නැත්නම් මේ 50 යි 50 කියන එක වෙනස් කරලා 70 යි 30 ට තියන්න කියන ඉල්ලීම කරනවා. අපි දන්නවා. දැන් සමහර දිස්ත්‍රික්ක - අනුරාධපුර දිස්ත්‍රික්කය ගත්තත් අපට දැන් කොට්ඨාශ ක්‍රමය අනුව බෙදපුවාම තිබෙන

[ගරු සහන් ප්‍රදීප් විතාන ]

කොට්ඨාශවලට වඩා දැන් පළාත් සභා මන්ත්‍රීවරු ඉන්නවා පක්ෂවල. එතකොට ඉන්න මන්ත්‍රීවරුන්ටවත් කොට්ඨාශ දෙන්න විධියක් නැහැ. මෙන්න මේ වාගේ තත්ත්වයක් තිබෙන්නේ. ඒ නිසා එදා පාර්ලිමේන්තුවේදී 2/3 ගන්න බැරිව ගියා පළාත් සභා මැතිවරණය කල් දාන්න. ඒ වෙලාවේ ජනතා විමුක්ති පෙරමුණේ සහයෝගය ගත්තා එදා 2/3 හදාගන්න. ඒ ගත්ත වෙලාවේ තමයි මේ 50% සුළු පක්ෂවලට දෙන්න තීන්දු කළේ. ඒ නිසා එක පක්ෂයක් වර්ධනය කිරීමට හෝ නැත්නම් එක කණ්ඩායමක වරප්‍රසාද ලබා දීමට නොවෙයි. මේ පළාත් සභාව කියන එක ස්ථාවරව කවුරු මහ ඇමති වුණත්, කවුරු ආණ්ඩු පක්ෂයට ආවත් ඉදිරියට ගෙනියන්න පුළුවන් විධියට වැඩ පිළිවෙළක් සකස් කළේ නැත්නම්, මේක කරන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව අපි මේ වෙලාවේ අනුමත කරනවා. ඒවා වෙනස් විය යුතුයි. එක්කෝ එහෙම කරන්න. 70 යි 30 ට. එහෙම නැත්නම් පරණ විධියට තියන්න. එතකොට සාධාරණ විධියට ජනතාව ඡන්දය පාවිච්චි කරයි. පළාත් සභා පිහිටුවන්න පුළුවන්කම ලැබෙයි.

ඒ වාගේම තමයි මේ මැතිවරණයේදී, විශේෂයෙන්ම ගම්පහ දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 19 න් එක්සත් ජාතික පක්ෂයට වඩා වැඩිම ඡන්ද ප්‍රමාණය අපට, මහර ආසනයට ගන්න පුළුවන්කම ලැබුණා. ඒ වාගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට වඩා වැඩිම ඡන්ද ප්‍රමාණය මහර ආසනයෙන් ගන්න පුළුවන්කම ලැබුණා. ඒ සඳහා සහයෝගය ලබා දුන්න මහර ආසනයේ දේශප්‍රේමී ජනතාවට මගේ ස්තුතිය, ගෞරවය මේ අවස්ථාවේදී පුද කරනවා. මම හිතන්නේ, රටක් හැටියට අපි සියලු දෙනාම එකතු වෙලා රටේ ජනතාව බලාපොරොත්තු වන ජයග්‍රහණ ලබා දෙන්න එකතු වෙලා හරි කටයුතු කරනවා නම්, ඒකයි වැදගත්කම තිබෙන්නේ. මේ වාගේ අස්ථාවර තත්ත්වයක් තුළ හැම කෙනෙකුම දැන් පුදුමයට පත් වෙලා තිබෙන්නේ. මොකක්ද අද දවසේ වෙන්නේ? හෙට දවසේ වෙන්නේ? මේ වාගේ තත්ත්වයක් තිබෙන්නේ. ඒ නිසා ජනතාව බලාපොරොත්තු වන ඒ සියලු යටිතල පහසුකම්, ඒ අය බලාපොරොත්තු වන අරමුණු කරා යන්න, ස්ථාවරව මේ පළාත් පාලන ආයතන කර ගෙන යන්න අවස්ථාව ලබා දෙන්නය කියන එක මැතිවරණ කොමසාරිස්ගෙන් ඉල්ලමින් අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවට සම්පූර්ණයෙන්ම පක්ෂපාතීව අපේ සහයෝගය ලබා දෙන බව මතක් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා 2017 සැප්තැම්බර් 22 අනුමත වුණු පනතක් සම්බන්ධයෙන් තමයි මේ මාස පහකට පස්සේ හදිසියේ නින්දෙන් අවදි වෙලා තිබෙන්නේ. අවදි වෙලා තමයි මෙවැනි යෝජනාවක් ගෙනැල්ලා තිබෙන්නේ. ඒ වාගේම එතුමා - වෙන කවුරු හරි මේ යෝජනාව ගේනවා නම් අපි පුදුම වෙන්නේ නැහැ. මොකද, කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයෙකු ලෙස දර්ශනය ගැන අල්ප මාත්‍රයක් හරි පොත පත කියවලා තිබෙනවා නම්, ඒ ගැන අදහසක් තිබෙනවා නම්, මේ ක්‍රමයේ අර්බුදයක්, මැතිවරණ ක්‍රමයේම අර්බුදයක් ලෙස දකින එක පිළිබඳවම අපට ගැටළුවක් තිබෙනවා. ඒ නිසා ඒ කාරණයත් අවධාරණය කරමින්, විශේෂයෙන්ම දැන් මේ මැතිවරණ ප්‍රතිඵලයත් එක්ක විවිධ සාකච්ඡා, සංවාද හැදෙමින් තිබෙනවා. මේ මැතිවරණ ප්‍රතිඵලය ජනමත විචාරණයක් කියලා කියන්න උත්සාහ කරමින් ඉන්නවා. දැන් මේක ජනමත විචාරණයක් කියන එකම තමයි මම හිතනවා, අදේශපාලනික වන්නේ. වෙන කිසිවක් නිසා නොවෙයි. ඒක ජනමත විචාරණයක් නම් මේ ජනමත විචාරණයෙන් ආණ්ඩුව දිනලා තිබෙන්නේ. මේ ජනමත විචාරණයෙන් ආණ්ඩුව දිනලා. UNP එකට ඡන්ද ලක්ෂ 36 ක් තිබෙනවා. මෛත්‍රීපාල සිරිසේන මහත්තයාට ඡන්ද ලක්ෂ 15 ක් තිබෙනවා. මේ දෙකේ එකතුව ලක්ෂ 51 යි. මේ ආණ්ඩුව නියෝජනය කරන්නේ ඒ දෙගොල්ලෝ. එතකොට ආණ්ඩු විරෝධීයි කියලා කියන්නේ, මේ දෙගොල්ලන්ට විරෝධය. ඒ නිසා මේ ජනමත විචාරණයක් නම් ඒකම තමයි වැරැද්ද? ඒක ලෙස අර්ථ දක්වන එක මේ ආණ්ඩුවට වාසියි. ඒ විධියට අර්ථ දක්වන එක ආණ්ඩුවට වාසියි. ආණ්ඩුව තමයි ඒකේ වැඩි ප්‍රයෝජනය ගන්නේ. මොකද, ආණ්ඩුවේ ක්‍රියාවලිය. මෛත්‍රීපාල සිරිසේනගේත්, රනිල් වික්‍රමසිංහගේත් හවුල් ආණ්ඩුව බහුතර ජනතාව අනුමත කරලා තිබෙනවා. සභා වැඩි ප්‍රමාණයක් පොහොට්ටුවෙන් දිනුවා වුණාට, ඡන්ද සංඛ්‍යාව ගත්තොත් ඒකේ එහෙම එකක් තිබෙන්නේ.

ඒ නිසා ඒ අර්ථ විග්‍රහයම වැරදියි. දැන් අපේ සමහරුන්ට ගණන් ඉලක්කම් පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ගණන් බැරිකම හරි නොදැනුවත්කම හරි ගැන අපි කනගාටු වෙනවා මිසක වෙන කියන්න කිසිවක් නැහැ. මොකද, දැන් අන්තිමට කථා කරපු, අපේ සහන් ප්‍රදීප් මන්ත්‍රීතුමා කිව්වා, ජනතා විමුක්ති පෙරමුණ 2/3 දුන්නා කියලා. කොහේද 2/3 දුන්නේ? ඉලක්කම් දන්නේ නැත්නම් අපට ඒකට කරන්න දෙයක් නැහැ. පාර්ලිමේන්තුවේ 2/3 කියලා කියන්නේ, 150. 153 ක් හැදෙනවා ඔය තිබෙන පක්ෂ ඔක්කොම එකතු වුණාම. අපි අපේ හය දෙනත් එක්ක ඡන්ද 159 යි. අපේ හය දෙනා ඉවත් කළත් මේ ආණ්ඩුවට 153 ක් තිබුණා. 2/3 ක් අපි දුන්නේ නැහැ. මේ වැරදි මතයක්. වැරදි මත කියන්න එපා. වැරදි අදහස් කියන්න එපා. මොකද, මේ ඡන්ද ක්‍රමය ගෙනෙද්දී මේ ඡන්ද ක්‍රමයට අපි පක්ෂ වුණා. ඒක ඇත්ත. මේ ඡන්ද ක්‍රමයට අපි පක්ෂ වුණා. මොකද, එකක් තමයි 60 යි 40 සමානුපාතික ක්‍රමයට තමයි මන්ත්‍රීවරු තේරුවේ.

ඒ වාගේම තමයි කාන්තා නියෝජනයක් තිබුණා. අපි ඒවාට විරුද්ධ වුණේ නැහැ. මොකද, මේ කාන්තා නියෝජනය - මේ සභාවේම ගත්තොත් කොහොම කාන්තා නියෝජනයක්ද තියෙන්නේ? කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය ඉන්නවා. අයියා නාමල් ගුණවර්ධන. එතුමා නැති වුණාට පස්සේ නංගී ආවා දේශපාලනයට. මෙහේ ඉන්නවා මල්ෂා කුමාරතුංග මහත්මිය. තාත්තා ජීවන් කුමාරතුංග. දුව එනවා පළාත් සභාවට. කටානේ ජෙයරාජ් ප්‍රනාන්දු පුල්ලේ මහත්තයා හිටියා. එතුමා මැරුණාම සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ ආවා පාර්ලිමේන්තුවට. ඉතින් එවැනි වටපිටාවක් තුළ මේ කාන්තා නියෝජනය ඇතුළේ අද මේ කාන්තා නියෝජනයක් ලෙස අපේ පළාත් සභා ඇතුළට එන්නේ කවුද? අපේ ගම්වල සාමාන්‍ය කාන්තාවෝ. ඒකෙත් ඕගොල්ලෝ වෙන වෙන ගේම් ගහන්න හැදුවා. අපි දැක්කා එක නිලියක් ඇවිල්ලා, රූපවාහිනියේ අපි දැක්කා ලිංගික අල්ලස් ඉල්ලුවා කියලා ලොකු ප්‍රශ්නයක් මතු වුණා, නාම යෝජනා දෙන්න. දැන් මන්ත්‍රීකම දෙන්න පොහොට්ටුවෙන් මොන මොනවා ඉල්ලයිද කියලා අපි දන්නේ නැහැ. දැනටමත් අරගෙනද කියලා අපි දන්නේ නැහැ. ඒක වෙනම කාරණයක්. ඒ නිසා වැරදි අදහස් කියන එක - දැන් මේ මහේෂ් අල්මේදා මැතිතුමාගේ යම් හීනමානයක් තිබෙනවා. මේ යෝජනාවට අදාළව තර්කානුකූලව මතු කරපු ප්‍රශ්නය මොකක්ද? මොකුත් නැහැ. කිසි තර්කයක් නැහැ. තර්කයක් මොකුත් නැතිව නිකම් ජනතා විමුක්ති පෙරමුණටයි, මේක හදපු මහාචාර්යවරුන්ටයි එහෙම දේවල් ටිකක් කියනවා විතරයි අපි නම් දැක්කේ. අනික් එක දැන් කියනවා, මේකත් අර මේගොල්ලෝ එළියේ කියන කථාව වාගේම තමයි. මම දැක්කා ඊයේ ගාමිණී ලොකුගේ කියනවා. පාර්ලිමේන්තුව විසුරුවන්න. මහින්ද රාජපක්ෂ, 12 වැනිදා කියනවා, 11 ද මහින්ද රාජපක්ෂ තමන්ගේ ගෝලයෙකු අතේ පණිවුඩය මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ළඟට යවනවා. ගිහිල්ලා කියනවා, අගමැතිකම දෙන්නය කියලා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

බොරු කියන්න එපා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

බොරු නොවෙයි. ඇත්ත. වගකීමෙන් කියන්නේ. ඡන්ද පෙන්වලා මාව හය කරන්න එපා කියලා (බාධා කිරීම්) හරි. බොරු නම් - මේක සම්පූර්ණ ඇත්ත. වගකීමෙන් කියන්නේ. සම්පූර්ණ ඇත්ත. ඡන්ද පෙන්වලා මාව හය කරන්න එපා කියලා -

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ඔයා මහින්ද රාජපක්ෂගේ ගෙදර බුදියාගෙනද හිටියේ. නිකම් බොරු කියන්න එපා. ඕගොල්ලෝ තමයි ගිහිල්ලා විපක්ෂයේ සංවිධායකකම් පාර්ලිමේන්තුවේ අරගෙන ඉන්නේ. හයක් තියාගෙන. ඔබතුමන්ලා තමයි ආණ්ඩුවට කඩේ යන්නේ. නිකම් බොරු කියන්න එපා. අගමැතිකම් කරන්න. හැබැයි, හරි නම් දෙන්න ඕනෑ තමයි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කරුණාකර බාධා කිරීම් කරන්න එපා. මම පසුව අවස්ථාව දෙන්නම්.

[සභාවේ ඝෝෂා]

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තප්පුලන එක ඉවර වෙන කල් මම හිටගෙන ඉන්නම්. ඒ නිසා ඔබතුමා නතර කරලා දෙන්න. එතකල් මම ඉන්නවා. ඔයගොල්ලෝ මේ කිව්වේ අපි නොකරපු දේවල්. අපි නොකරපු දේවල් ඕගොල්ලෝ කිව්වේ. සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමා කිව්වේ. අපි අහගෙන හිටියා නේ?

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ඉතින් ඇත්ත නේ?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මොකක්ද ඇත්ත. මේවාත් ඇත්ත තමයි එහෙම නම්. මේවාත් ඇත්ත.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ඇත්ත කිව්වේ. රටම දන්න ඇත්ත කිව්වේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, මූලාසනයට කථා කරන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ළඟට ගියා මහින්ද රාජපක්ෂගේ ගෝලයෙක්. මොකක්ද කිව්වේ. (බාධා කිරීම්)

[සභාවේ ඝෝෂා]

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ඔයා මහින්ද රාජපක්ෂගේ ගෙදර බුදියාගෙනද හිටියේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

එලවා ගත්තා.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

මිනිස්සු පිළිගත්තේ නැහැ නේ? ඔහොම බොරු කියන්න එපා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කියන්න දෙයක් නැතිව බොරු කියන්න එපා. කොට්ඨාශයක් දිනා ගන්න බැරි වුණා.

[සභාවේ ඝෝෂා]

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

පොඩ්ඩක් ඉන්න. පාර්ලිමේන්තුව නියෝජනය කරන -

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ලංකාවේ එක කොට්ඨාශයක් දින්නාද? කයිය ගහන්නේ?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මන්ත්‍රීවරුන්ට අපහාස කරන්න එපා. ඔබතුමා, ඔබතුමාගේ කථාව කරන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමා පොහොට්ටුවේ වුණාට කමක් නැහැ. දැන් අපක්ෂපාතී වෙන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමා කථා කරන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒ නිසා 12 උදේ මාධ්‍ය සාකච්ඡාවක් තියලා කියනවා - පළමුවැනි පිම්ම වැරදුණාට පස්සේ. මොකක්ද?

පාර්ලිමේන්තුව විසිරුවන්න. ඔලුගෙඩි එහෙ මෙහෙ කරලා අපි අගමැතිකම් ගන්න කැමැති නැහැ. මොකක්ද මේ කියන්නේ? පාර්ලිමේන්තුව විසුරුවන්නේ කොහොමද කියලා මෙතැන ඉන්න නෝනලා මහත්වරුන්ට තේරෙන්නේ නැත්නම්, රාජපක්ෂ උන්නැහැට තේරෙන්නේ නැත්නම්, ගාමිණී ලොකුගේට තේරෙන්නේ නැත්නම්. පාර්ලිමේන්තුව විසුරුවන්නේ කොහොමද? පාර්ලිමේන්තුවේ යෝජනාව ගෙනැල්ලා 2/3 ක ඡන්දය ගන්න ඕනෑ. එහෙම නැතිව මේ මාධ්‍ය සාකච්ඡා තියලා එළියේ කිව්වාට, මාධ්‍ය සාකච්ඡාවල කිව්වාට මේක විසුරුවන්න බැහැ. හෙට ගේන්නකෝ යෝජනාවක්. අපි හය දෙනා දෙන්නම් කෝ? හෙට ගේන්නකෝ යෝජනාවක්. අපිත් දෙන්නම් කෝ?

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

රනිල් අගමැති කර ගන්න -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

රනිල් අගමැති කරන්න අපට උවමනාවක් නැහැ. අපට FCID එකේ බේරා ගන්න ප්‍රශ්න නැහැ. රනිල් කියනවා, මහින්ද කෝල් එක දීලා කිව්වා කියලා අගමැතිකමේ දිගටම ඉන්න කියලා. රනිල් කිව්වා. රනිල් කිව්වේ? ඇයි රනිල් මාධ්‍ය සාකච්ඡාවක් තියලා ප්‍රසිද්ධියේ කිව්වේ. ඒකට නැහැයි කිව්වේ නැහැ නේ? ඒක නැහැ කිව්වේ නැහැ නේ? ඒක නැහැයි කිව්වේ නැහැ නේ කොහේවත්. රනිල් පැහැදිලිව කිව්වා නේ? මාධ්‍ය ඉදිරියේ. ඔයා දිගටම ඉන්න කියලා කිව්වා නේ? ඇත්තත නේ? ඕගොල්ලෝ පව්.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

රනිල් වික්‍රමසිංහ මහත්තයා එන්න කිව්වාම ඕගොල්ලොන්ගේ නායකයෝ කුක්කෝ වාගේ යන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු සහන් මන්ත්‍රීතුමා, වාඩිවෙන්න.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

නිකම් බොරු කියන්න එපා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඕගොල්ලෝ පව්. අන්න ඇත්ත ඩීල් එක. අන්න ඇත්ත ඩීල් එනවා. රනිල් - (බාධා කිරීම්)

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

රනිල් මහත්තයාගෙන් යැපී යැපී රනිල් මහත්තයාට බනින්න එපා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

අන්න ඇත්ත ඩීල් එනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බාධා කිරීම් කරන්න එපා.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

අර වතුර සේනාරත්න කිව්වේ. ටොයිලට් එකේදී ලක්ෂ 25 ක් ගත්තා කියලා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කරුණාකර බාධා කිරීම් කරන්න එපා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

කථා කරන්න ඉඩ දෙන්න කෝ. දැන් ඉවර නේ තප්පුලලා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මූලාසනයට කථා කරන්න. එතකොට හරි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හරි ඉතින්. මූලාසනයට කථා කරන්නත් සද්ද නැතිව ඉන්න එපැයි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මූලාසනයට කථා කරන්න පුළුවන්. ඔබතුමා ඕක ගලවලා සුදු පාට එකක් ඇඳගෙන එන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

එහෙම නීතියක් නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මොකද නැත්තේ?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

එහෙම නීතියක් නැහැ සුදු පාට එකක් ඇඳගෙන එන්න කියලා. ඔබතුමා එහෙම උපදෙස් දෙන්න කවුද? එහෙම නීතියක් නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

එහෙම නීතියක් තිබෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මට නීතිය පෙන්වන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

අපි ඔය ඇඳුමත් එක්ක හැප්පෙන්නේ නැහැ. හැප්පුනොත් ඕක ගලවන්න වෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මේක ගලවන්න වෙන්නේ නැහැ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඒක ගලවන්න ඔබතුමන්ලාට ලේසි නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මම ගරු මන්ත්‍රීතුමාට කියනවා, -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පාටක් නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මට ඒ නීතිය පෙන්වන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

අපිටත් ඕනෑ ඒවා පෙන්වන්න තමයි. කලින් කලට ඕවා වෙනස් වෙනවා. ඒ නිසා අපිත් ඇඳගෙන එනවා තනි රතු පාටට.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒකේ ප්‍රශ්නයක් නැහැ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඇඳගෙන එන්න කෝ ඉතින්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මෙතැන කොළ පාටට ඇඳගෙන එන්න පුළුවන්. මේක සභාවක් නොවෙයි. ඕගොල්ලෝ කාලා තිබෙන්නේ.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ඒක ප්‍රශ්නයක් නැහැ. ඇඳගෙන එන්න. ඇඳගෙන එන්න පුංචි අම්මාගේ සාරියෙන් කොටසක්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

තමුන්නාන්සේගේ වෙලාවට මම මූලාසනයේ ඉන්න හින්දා මට මොකුත් කියන්න බැහැ. තමුන්නාන්සේ වාඩි වෙන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

කවුරුවත් කථා කරන්නේ නැහැ නේ? අපි ඔය ඇඳුමත් එක්ක හැප්පෙන්නේ නැහැ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

හැප්පෙන්න බැහැ ඇඳුමත් එක්ක.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඕගොල්ලෝ ගම ඉල්ලුවේ ගම කන්න. ගම හම්බ වුණාද?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

හැප්පෙන්න ලංකාවේ එකක්වත් නැහැ නේ? පරාදයි නේ?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කරුණාකර බාධා කරන්න එපා. ගරු මන්ත්‍රීතුමා, කථා කරන්න.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

එකක්වත් දිනුම්ද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔව්. එකක් දිනුම්. දන්නේ නැත්නම් අහ ගන්න. එකක් දිනුම්. ඒකටත් උත්තරයක් දෙන්නම්. මොකද, දන්නේ නැහැ නේ කට්ටිය. රටේ දේශපාලන නොවෙයි නේ කරන්නේ. ඒ නිසා ඒක කියන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව දන්නේ නැති නිසා, සභාවේ කට්ටිය පත්තර බලන්නේ නැති නිසා අපි කියන්න ඕනෑ. පානදුර නගර සභාවේ වෑකඩ කියන කොට්ඨාශයේ පියසේන ප්‍රනාන්දු කියන සහෝදරයා අපේ කොට්ඨාශයක් ජයග්‍රහණය කරලා තිබෙනවා. නොදන්නා අයට පොඩ්ඩක් අහගන්න කිව්වේ. ඊළඟට, දැන් සමහරු උත්සාහ කරනවා. මේ ආණ්ඩුව ඇතුළේ UNP. මේක ඇතුළට ආවාම -

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

පානදුර නගර සභාවේ පොහොට්ටුව නැති නිසා ඒ අය එදා පියසේනට උදව් කළා. ඒ නිසා තමයි ඒ කොට්ඨාශය දිනුවේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හරි. කොහොම හරි දිනුවා නේ? දැන් මටත් කථා කරන්න දෙන්න කෝ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහරු උත්සාහ කරනවා, මේකේ විපක්ෂ නායකකම වෙනස් කරන්න. මේක පාර්ලිමේන්තු ඡන්දයක් නොවෙයි. මේක ප්‍රාදේශීය සභා ඡන්දය. හැබැයි, පාර්ලිමේන්තුවේ UNP එකත් එක්ක ඉන්නේ. මේකට ඇවිල්ලා ඉන්නවා. මේකේ මොකක් එක්ක ඉන්නවාද කියලා කියන්න තවම අපි දන්නෙත් නැහැ. එහෙම ඉන්න අය සමහරු දැන් වෙන වෙන තර්ක මතු කරනවා, මේ ඡන්ද ප්‍රතිඵලය මතු කර ගෙන. වෙන වෙන තර්ක මතු කරනවා. අපි දැක්කා, ඒගොල්ලන්ගේ සමහර නායකයොත් කියනවා, දැන් මේ ධුර වෙනස් කරන්න ඕනෑ. අර ධුර වෙනස් කරන්න ඕනෑ. එහෙම නම් මේක පාර්ලිමේන්තු මැතිවරණය - එහෙම නම් ඡන්ද ගොඩක් ඕනෑ නැහැ නේ? ප්‍රාදේශීය සභාවේ ඡන්දය තියලා ජනාධිපතියි, අගමැතියි, පාර්ලිමේන්තුවයි ඔක්කොම තෝරා ගන්න පුළුවන්. මේක ප්‍රාදේශීය සභා මැතිවරණය. ඒ නිසා මේ මැතිවරණය එක ජනවරමක්. මේ ජනවරම තව ජනවරමකින් යට කරන්න බැහැ. ඒක වැරදියි. මම දන්නේ නැහැ. මේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමන්ලා මොකක්ද මේ කියන්නේ කියලා. නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමන්ලා මොකක්ද කියන්නේ කියලා අපට තේරෙන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි. දැන් මේ මැතිවරණය හරිම පැහැදිලියි. දීලා තිබෙන තීන්දුව මොකක්ද? 2015 ජනවාරි 08 වැනිදා මේ රටේ ජනතාව ජනවරමක් දුන්නා. ලක්ෂ 62 ක ජනවරමක් දුන්නා. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටයි,

[ගරු මහින්ද ජයසිංහ ]

අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමාටයි. මොකක්ද කිව්වේ? තිබුණු ප්‍රජාතන්ත්‍ර විරෝධී පාලනය, තිබුණු දූෂිත පාලනය, තිබුණු පවුල් පාලනය පරද්දන්න. හොරුන්ට දඬුවම් කරන්න. වංචනිකයින්ට දඬුවම් කරන්න. මිනීමරුවන්ට දඬුවම් කරන්න. මේ එකක්වත් කළේ නැහැ. ඒ නොකරපු එකේ ප්‍රතිඵලය තමයි අද මේ ඇවිල්ලා තිබෙන්නේ. ඒ ජනවරමට ගරු කළේ නැහැ.

ඒ වාගේම මහේෂ් අල්මෙදා ගරු මන්ත්‍රීතුමා කිව්වා, ගුරු ගෙදර ගැන. දන්නේ නැත්නම් අහගන්න. නැත්නම් මගෙන් පෞද්ගලිකව ඇවිල්ලා අහන්න. ගුරුගෙදර ඉන්න -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මම -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමා කියපු නිසා. මොනවාද කියන්නේ?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

දැනගෙන කියන්නේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හෙට මම මන්ත්‍රීකමෙන් අයින් වෙනවා. ඉස්සෙල්ලාම අගහන්න. ගරු මන්ත්‍රීතුමා, අහගෙන ඊට පස්සේ කථා කරන්න. 2008 මාර්තු 29 ගුරුගෙදර ඡන්දය තිබ්බා. නියෝජිතයෝ 297 දෙනෙකු තෝරා පත් කර ගත්තා. අපේ ලංකා ගුරු සේවා සංගමය, ජනතා විමුක්ති පෙරමුණේ ගුරු සංගමයේ 197 දෙනෙකු නියෝජිතයෝ ලෙස තේරුණා. තුනෙන් දෙකක්. 2008 මාර්තු 29. මාස නවයක් -

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා මාතෘකාවට අදාළද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමා සභාවේද හිටියේ?

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]*
*[Expunged on the order of the chair]*

සභාවේද හිටියේ? මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කියපු නිසා අපි කියන්නේ. චෝදනාවක් කළාම අපි ඒකට උත්තර දෙන්න ඕනෑ. (බාධා කිරීම්)

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]*
*[Expunged on the order of the chair]*

දන්නෙත් නැහැ -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]*
*[Expunged on the order of the chair]*

සභාවේද හිටියේ. (බාධා කිරීම්)

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කරුණාකර බාධා කරන්න එපා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

සක්කිලි වාගේ කථා කරන්නේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

සක්කිලි කවුද කියලා පේනවා. සක්කිලි කවුද කියලා රටටම පේනවා. නිකම් මෝඩ වුන් ගන්න එපා. ඕක බනින්න වැඩි කල් යන්නේ නැහැ. භය නැතිව ඉන්න. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, (බාධා කිරීම්) –

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කරුණාකරලා මේ වචන පාවිච්චි කරන කොට සභාවේ ගෞරවයට හානි වන විධියට කථා කරන්න එපා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒ විධියට කථා කරන කොට, ඒ විධියට තමයි කථා කරන්නේ. බල්ලන්නට බල්ලෝ කියනවා මිසක් අපි ලැහැස්ති නැහැ බල්ලන්ට-

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හරක්ට හරක් කියනවා මිසක් අපි ලැහැස්ති නැහැ හරක්ට -

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මේ දෙපාර්ශවයේම ගෞරවය ආරක්ෂා කරන්න. ඔබතුමා මැදිහත් වෙලා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

නරින්ට නරි කියනවා මිසක්. නරියට නරිය කියන්නත්, බල්ලාට බල්ල කියන්නත්, හරකට හරකා කියන්නත් අපි භය නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

වාඩි වෙන්න. වාඩි වෙන්න.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඔය එන්නේ 88, 89 කාලය වාගේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඒ අනවශ්‍ය වචන සියල්ලම හැන්සාඩ් වාර්තාවෙන් අයින් කරනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමන්ලාට, අපට චෝදනා කරන්න හොඳ නම් ඒවාට උත්තර දෙන කොට විතරක් කොහොමද විරුද්ධ වෙන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගුරු ගෙදර ගැන චෝදනාවක් කළා. මට උත්තර දෙන්න අයිතියක් තිබෙනවා. මේගොල්ලෝ හිටියේ නැත්නම් සභාවේ ඒකට මට කරන්න දෙයක් නැහැ.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

කථා කරන විධියක් තිබෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

කථා කරන විධියට තමයි මම කථා කළේ. මොනවද? ඒ විධියට තමයි මම කථා කළේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා, එතුමා ඒ ප්‍රශ්නයකට උත්තර දුන්නා. එතුමාගෙන් අහපු දෙයකට. එතුමාට කථා කරන්න ඉඩ දෙන්න.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

තමුසේ තමුසේ කියලා කථා කළේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඒක තමයි මම කිව්වේ, ඒවා හැන්සාඩ් වලින් අයින් කරන්න කියලා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමන්ලා මුලින්ම කිව්වේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

නැහැ. ඒක දෙපැත්තෙන්ම කියැවුණා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා තමයි තමුසේ කියලා මුලින් කථා කළේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

නැහැ. නැහැ. ඔහෙන් කිව්වේ. ඔහෙන් කියපු නිසා මම කිව්වේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

රෙකෝඩින් එක බලමු.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පළමුවෙන්ම කිව්වේ -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

බලන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඒක දෙපැත්තෙන්ම කියැවුණා. දැන් ඒක හැන්සාඩ් එකෙන් අයින් කරනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හරි. ඒක අයින් කරන්න. මම මගේ පැත්තෙන් අයින් කර ගන්නවා. මොකද එතුමා කියපු නිසා තමයි මම කිව්වේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමා කිව්වේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

රයිට්. එහෙමනම් මම සමාව ඉල්ලනවා. ඉවරයි නේ. ඒ නිසා දැන් ගුරු ගෙදර ගැන ප්‍රශ්නයක් මතු වුණා. මට විනාඩියෙන් උත්තරයක් දෙන්න ඕනෑ. ඒ දීලා මම ඉවර කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බාධා කරන්න එපා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගුරු ගෙදර - අහගන්න දන්නේ නැත්නම්.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

එතුමා හොරෙක් නොවෙයි. ඒකත් කියන්න එපැයි. අවංක මන්ත්‍රී කෙනෙක්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගුරු ගෙදර -

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

අවංකව කියන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඒක කවුරුත් දන්නවා නේ. සහන් ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න කෝ.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

හොඳක් කිව්වේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

අනවශ්‍ය බාධා කරන්න එපා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

පොඩ්ඩක් ඉන්න කෝ ඉතින්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි 2008 මාර්තු මස ජයග්‍රහණය කළා තුනෙන් දෙකකින්. 2009 ජනවාරි 03 වැනිදා (බාධා කිරීම්) තමුසේ කියන්න බැහැ. මචං කියලාවත් කියන්න. එහෙමවත් කිව්වොත් ඉඩ දෙයිද කියලා බලන්න. පොඩ්ඩක් අහ ගන්න කෝ ඉතින්. ඊට පස්සේ 2009 ජනවාරි 03 අපි අධ්‍යක්ෂ මණ්ඩලය පිහිටෙව්වා. අපට 2012 ජනවාරි දක්වා ඉඩ තිබුණා. නමුත් 2011 අප්‍රේල් 28 බොරු නඩුවක් දාලා කරුණු 08 කින් ඒ කාලයේ ශ්‍රී ලංකා නිදහස් ගුරු සංගමයේ වසන්තා හඳපාන්ගොඩ සභාපති. ඒ ගොල්ලෝ බොරු නඩුවක් දාලා මේක අපෙන් උදුරා ගත්තා. උදුරාගෙන ජොන්ස්ටන් ප්‍රනාන්දුගේ ලේකම්වරයෙකුයි, මහින්ද රාජපක්ෂගේ සභාපතිවරයෙකුයි මේකට අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කළා. නීති විරෝධී අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කළා. 2011 මැයි මාසයේ 12 වැනිදා. එතැන් සිට අවුරුදු 05 ක් මේක පාලනය කළේ නීති විරෝධී අතුරු පාලක මණ්ඩලයක්. පස්සේ නැවත අපි නඩු කියලා 2016 මැයි 14 ඡන්දයක් ගත්තා. 2016 මැයි 14 මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා. අහගන්න. ඒ ඡන්දයෙන් රට පුරාම උතුරත් නැගෙනහිරත් ඇතුළුව නියෝජිතයෝ 317 කින් අපි 291 දෙනෙක් ජයග්‍රහණය කළා. සමස්ත ප්‍රතිඵලය 92% ක්. අපට විරුද්ධව තරග කළේ ශ්‍රී ලංකා ගුරු සංගමයයි, යූ.ඇන්.පී. ගුරු සංගමයයි එකට.

ඊළඟට අර ජෝෂප් ස්ටාලින් කියලා ඕගොල්ලෝ දන්නවා. ලංකා ගුරු සංගමයේ තුන් ගොල්ලොම එකට. අශුද්ධ සන්ධානයකින් තරග කළේ. මුළු රටේම නියෝජිතයෝ නව දෙනයි ලැබුණේ. අපට 291 ක් ලැබෙන කොට, ඒ තුන්ගොල්ලන්ටම ලැබුණේ 09 යි. ඊට පස්සේ තව 17 ක් ස්වාධීනව තේරුණා. ඊට පස්සේ දැන් ගුරු ගෙදර පාලනය කරගෙන යන්නේ අපි. අපිට අර 2011 අප්‍රේල් 29 දාපු චෝදනාව මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා, 2015 ඔක්තෝබර් 09 ඉල්ලා අස්කර ගත්තා. චෝදනා 08 ක් දැම්මා. ඔප්පු කරගන්න බැහැ. නඩුව අයින් කර ගත්තා. එහෙමයි ඒ කාලයේ නීතිය ක්‍රියාත්මක වුණේ. මේ ගුරු ගෙදර අධ්‍යක්ෂ මණ්ඩලයේ 15 දෙනාම අපි. උතුරත්, නැගෙනහිරත් ඇතුළුව 15 දෙනාම අපේ. 292 කගේ මහ සභාවක් අපි පාලනය කරනවා. ඉතින් මොකක්ද ඔබතුමා කියන්නේ? මොනවද අපි හොරකම් කරලා තිබෙන්නේ. අපි හොරකම් කළා නම් අපට ඔතැන ඉන්න බැහැ. ඒ කාලයේ අපි හොරකම් කළා නම්, මහින්ද මහත්තයා අපට මේ විධියට මෙතැන ඉන්න දෙන්නෙත් නැහැ. හරි. ඒ නිසා අපි හොරු නොවෙයි. අපට සත පහක වංචා චෝදනා නැහැ. ඒ නිසා බොරු චෝදනා කරන්න එන්න එපා.

ඒ වාගේම මම අවධාරණය කරන්න ඕනෑ. දැන් මේ මැතිවරණ ප්‍රතිඵලයෙන් කියලා තිබෙන්නේ වෙන මොකක්වත් නොවෙයි. අලුත් හොරුන්ට වඩා පරණ හොරු හොඳයි කියලා. වෙන මොකක්වත් නොවෙයි. අලුත් හොරුන්ට වඩා පරණ හොරු හොඳයි. ඒ ඇර වෙන මොකක්වත් නැහැ. ඒ නිසා මම කියනවා. මේ ඡන්ද ක්‍රමයේදී දැන් අත්තනගල්ල අපේ උපුල් මහේන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා මම දන්නේ නැහැ ඒ වෙලාවේ හිටියාද කියලා මට මතක නැහැ. පත්තලගෙදර අපේ ඡන්ද ප්‍රතිඵල නිකුත් කරන වෙලාවේ. අත්තනගල්ලට මේ ක්‍රමයට අනුව ආවේ මන්ත්‍රී ධුර 22 යි. මේ සිස්ටම් එකට අනුව සමානුපාතික ක්‍රමයට අනුව මන්ත්‍රී ධුර 22 යි ආවේ. නමුත් ඔවුන් 27 ක් වෙනවා. ඔවුන්ට මන්ත්‍රී ධුර පහක් වැඩියෙන් ඇවිල්ලා තිබෙනවා. මොකද කොට්ඨාශ 22 ක් දිනපු නිසා. මහරට ආවේ - සහන් ගරු මන්ත්‍රීතුමා සිටියා. මහරට ආවේ මන්ත්‍රී ධුර 29 යි. ඒක 31 ක් වුණා. හරිද? ඇත්තටම ගත්තොත් එහෙම 200 ක් වැඩිපුර ඇවිල්ලා තිබෙන එකේ මම හිතන්නේ වැඩි ප්‍රමාණයක් ඇවිල්ලා තිබෙන්නේ, ශ්‍රී ලංකා පොදුජන පක්ෂයට. වැඩිපුර ඇවිල්ලා තිබෙන්නේ. පොහොට්ටුවට. පක්ෂය කියනවාට වඩා ලෙහෙසියි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පටලවා ගන්න එපා. හරියට කියන්න. පොහොට්ටුව.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

පොහොට්ට්ටුවට ඇවිල්ලා තිබෙන්නේ. හරිද? ඒ කියන්නේ ඕවර් හැන් කියලා අර අතිරේක ආපු මන්ත්‍රී ධුර සංඛ්‍යාවෙන් වැඩි ප්‍රමාණයක්. ඒක නිසා මේක ගත්තොත් එහෙම -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඕවර් හැන් කියන්නේ පොහොට්ටුවට.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

අපට නොවෙයි, විශේෂ වාසියක් වෙලා තිබෙන්නේ ඔබතුමන්ලාට. හරිද? ඔබතුමන්ලාගේ තමයි මන්ත්‍රී ධූර වැඩි වෙලා තිබෙන්නේ. අනික් එක තමයි මේ ක්‍රමය ගත්තොත් එහෙම, අර එතුමා කිව්වා ඡන්ද 1000, 1500 ක් ගත්තු අයට. හොඳයි නේ? ඡන්ද 1000 ක් කියන්නේ යම් ප්‍රාදේශීය සභාවක, නගර සභාවක යම් ජන මතයක් නියෝජනය කරන්නේ. ඉතින් ඒ අයට මන්ත්‍රී ධූරයක් ගියාම මොකද වෙන්නේ? ඒක නරක නැහැ. ඒක හොඳයි. දැන් අපිව දේශපාලනෙන් අයින් කරන්නද ඔබතුමන්ලාට ඕනෑ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඔව්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඇත්තද? එහෙමනම් හීනයක් විතරයි. ඒක එහෙමනම් හීනයක් විතරයි. ඒ හීනෙට අපි ඉඩ තියන්නේ නැහැ. ඒක හීනයක් විතරයි. ඒ හීනෙට අපි ඉඩ තියන්නේ නැහැ. අපි -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

76 ට 422 ක් ඉන්නවා. හොඳටම ඇති නේ?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මොකක්ද?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ලංකාවේ 76 යි හිටියේ. දැන් 422 ක් ඉන්නවා. හොඳටම ඇති නේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔව්. හරි. අපේ ඡන්ද හත් ලක්ෂ දාසය දාහයි.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

මේ ක්‍රමයට පිං සිද්ධ වෙන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

අපේ ඡන්ද හත් ලක්ෂ දාසය දාහයි. ඒකට සමානව නියෝජනයක් අපට ලැබිලා තිබෙනවා. හරිද? එතකොට තුන් ලක්ෂ තිස් නව දාහයි දෙමළ ජාතික TNA ඒ එකට. ඒ අයට හරියන මන්ත්‍රී සංඛ්‍යාවක් ලැබිලා තිබෙනවා. සමහරවිට ඊට වැඩි වෙන්න පුළුවන්. ඒ නියෝජනයට අදාළව. ඒ නිසා මේ මැතිවරණ ක්‍රමය කියලා කියන්නේ, එහෙම එකක්. මේකේ අඩුපාඩු නැහැයි කියලා, සර්ව සම්පූර්ණයි කියලා අපි කියන්නේ නැහැ. හැබැයි, මේකේ මන්ත්‍රී ධූර සංඛ්‍යාව බෙදන්නේ සමානුපාතික ක්‍රමයට. මේකේ මේ නොදන්නාකම් නිසා සමහරු බෝහෝ දේවල් කියනවා. නොදන්නාකම් විසින්. සමහර මැතිවරණ නිලධාරීන්ට අපි පත්තලගෙදර සිටිද්දී සමහර වෙලාවට ඔවුන්ගෙන් වුණු අඩුපාඩු අපි පෙන්නුවා. හදලා පෙන්නුවා. මේක මහ ලොකු සංකීර්ණ එහෙම එකක් නොවෙයි. මේක ඔය කියන තරම් සංකීර්ණ එකක් නොවෙයි. ගම්පහ දිස්ත්‍රික්කයේ නම් සහකාර මැතිවරණ කොමසාරිස්වරයා - අපි යෝජනාවකුත් කළා. ගණන වැඩියි නම්, මුදල වැඩියි නම් අපි අවුරුද්දක් සියලු මන්ත්‍රීවරු වැටුප් නොගෙන වැඩ කරමු.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඇයි අවුරුද්දක්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

අපි ගන්නේ නැහැ. අපි හතරම ගන්නේ නැහැ. අපි නොගෙන වැඩ කරන්නේ. අපි කිව්වා සියලු දෙනාට මේ ගාණ වැඩියි නම් නොගෙන වැඩ කරමුයි කියලා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඇයි මේ අයට සල්ලි හම්බ වෙන කොම්පැණියක් නේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

තවත් කාලය ගන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ජේ.වී.පී කොම්පැණියක්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේ යෝජනාව අපි පක්ෂයක් ලෙස භාර ගන්නේ නැහැ. මේ මැතිවරණ ක්‍රමයේ අඩුපාඩු තිබෙනවා නම් ඒවා සකස් කළ යුතුයි. එහෙම නැතිව මේ යෝජනාවට අපි විරුද්ධයි කියන එක ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම වැදගත් යෝජනාවක් සාකච්ඡා වන වේලාවේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කාලීනව වැදගත් යෝජනාවක් මේ සභාවට ඉදිරිපත් කළේ. විශ්ෂයෙන් මේ ගරු සභාවේ දක්වපු බොහෝ අදහස්වලින් විශේෂයෙන් මම කනගාටු වෙනවා ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමන්ලා මේ යෝජනාව සභාවට ඉදිරිපත් වුණු අවස්ථාවේ සිට, මේ යෝජනාව අද දවසේ සාකච්ඡා නොවීමට විවිධ වූ රීති ප්‍රශ්න ගෙන එමින් කරුණු ගෙන හැර දක්වන්න ගත්තා. විශේෂයෙන් ඔවුන් කියන්න උත්සාහ කළා, කිසිදු තර්කයක් නැති, වැදගම්මකට නැති යෝජනාවක් මේ සභාවේ සාකච්ඡා වෙන්නේ කියන කාරණාව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැදගම්මක් නැති, තර්කයක් නැති යෝජනාවක් නොවෙයි. අද වර්තමානයේ මේ අලුත් මැතිවරණ ක්‍රමය ඉවර වුණු ප්‍රාදේශීය සභා මැතිවරණ ක්‍රමය උඩ මේ මොහොත වන විට ප්‍රාදේශීය සභා කිහිපයක බලය පිහිටුවා ගැනීම පිළිබඳව විශාල අර්බුදයකට ලක් වෙලා තිබෙන අවස්ථාවක්. මේ මැතිවරණ ක්‍රමයේ තිබෙන දුර්වලතාවය නිසා මේ මොහොත වන විට එවැනි අර්බුදකාරී තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා පමණක් නොවෙයි. කාන්තා නියෝජනය සම්බන්ධයෙන්, කාන්තා නියෝජනය ප්‍රාදේශීය සභාව තුළ ස්ථාපිත කරන්නේ කොහොමද කියන කාරණාව පිළිබඳවත් බරපතළ ගැටලු ගණනාවක් ඉදිරිපත් වෙලා තිබෙන අවස්ථාවක තමයි අපි පසු වෙන්නේ. ඒ නිසාම මේ මැතිවරණ ක්‍රමයේ තිබෙන අඩුපාඩු මොනතරම්ද කියන කාරණාව බලවත් ලෙස මතු වෙලා තිබෙන අවස්ථාවක්.

ඒ වාගේම මේ සභාවේ පැහැදිලිව සඳහන් කරන්න ඕනෑ. මහේෂ් අල්ලමේදා ගරු මන්ත්‍රීතුමා යෝජනා කරන්නේ, මේ පළාත් සභා මැතිවරණ ක්‍රමය පිළිබඳව පනත සංශෝධනය කරන්න කියන ඉල්ලීමක්. ඒක මේ සභාවක් හැටියට අපට කරන්න පුළුවන් හැකියාව තිබෙනවා. එහෙම නොහැකියාවක් නැහැ. අපට රජයට යෝජනා කරන්න පුළුවන් මේ පළාත් සභා මැතිවරණ ක්‍රමය පිළිබඳ පනත සංශෝධනය කරන්න කියලා. ඒකට හේතු කාරණා සාධාරණව තිබෙන නිසා අපට රජයෙන් ඉල්ලීමක් කරන්න පුළුවන්, මේ පළාත් සභා මැතිවරණ ක්‍රමය පිළිබඳ පනත සංශෝධනය කරන්න කියලා. ඒ යෝජනාව තමයි මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන්නේ. ඒ එක්කම මම සඳහන් කරන්න ඕනෑ. මේ සභාව තුළ අපේ බස්නාහිර පළාත් සභාව තුළ කිසිදු අවස්ථාවක සියයට 50, 50 යේ ක්‍රමය පිළිබඳව සාකච්ඡාවක් වුණේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ක්‍රමය පිළිබඳව සාකච්ඡාවක් වුණේ නැහැ. පාර්ලිමේන්තුවට අණපනත් සම්මත කරන්න පුළුවන් බව හැබෑව. හැබැයි අපේ අදහස පාර්ලිමේන්තුවට යවන්න ඉඩකඩක් තිබෙන්න ඕනෑ. නමුත් මේ සියයට පනහ, පනහ ක්‍රමය පිළිබඳව කිසි අවස්ථාවක - මේ පළාත් සභාවේ අදහස් විමසීමක් අවශ්‍ය නැති වෙන්න පුළුවන්. හැබැයි එහෙම අදහස් විමසන්න, අපට ඒ පිළිබඳව අදහස් දක්වන්න අවස්ථාවක් අපට ඇති වෙලා තිබුණේ නැහැ. ඒ නිසා තමයි මේ ක්‍රමය පිළිබඳව, මේ පළාත් සභා මැතිවරණ ක්‍රමය පිළිබඳව අද දවසේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව සාකච්ඡා කරලා අපේ අදහස පාර්ලිමේන්තුවට යවන්න මොනතරම් වැදගත් අවස්ථාවක් ද කියන කාරණාව පැහැදිලිව සඳහන් කරන්න ඕනෑ. අලුත් මැතිවරණ ක්‍රමය තුළ (බාධා කිරීමක්)

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මේකට ආවා.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

පනහට පනහ ක්‍රමය මේ සභාවට ආවේ නැහැ. මේ සභාවට ආවේ නැහැ, පනහට පනහ ක්‍රමය.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ආවා. ආවා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මේ ක්‍රමය ආවේ නැහැ. පාර්ලිමේන්තුවට දාපු පනතවත් නොවෙයි. අන්තිමට ආපු සංශෝධනවලින් මේක ආවේ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

පාර්ලිමේන්තුවේ මේ සභාවේ සාකච්ඡා කරලා එවපු පනත නොවෙයි. මේක තමුන්නාන්සේලා එකතු වෙලා හොරෙන් -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

පාර්ලිමේන්තුවේ අන්තිමට තමුන්නාන්සේලාට වාසිදායක විධියට හදාගත්තු එක මේක.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ප්‍රාදේශීය සභාවට වුණෙත් ඒක. ප්‍රාදේශීය සභා ක්‍රමයත්. ඒ නිසා මේ පනහට පනහ ක්‍රමය පැහැදිලිව මේ සභාවේ අදහස් විමසීමට ලක් වුණේ නැහැ. ඒක තමයි ඇත්ත. මෙතුමන්ලා ඒක සනාථ කරන්න හදනවා එහෙම කියලා. වෙන කෙහෙල්මල් පනතක් අපට සාකච්ඡා කරන්න දීලා පාර්ලිමේන්තුවේ හොරෙන්, කඩිමුඩියේ, හදිසියේ තමුන්නාන්සේලාගේත් සහාය දීලා ප්‍රජාතන්ත්‍ර විරෝධී විධියට සම්මත කරපු පණතක් ඔය. ඒකට තමයි අපේ විරෝධය. ඒක තමයි ඇත්ත. ලංකා ඉතිහාසයේ පනතකට ඒ මොහොතේ වැඩිම අලුත් යෝජනා ප්‍රමාණයක් ගත්තු එකම පනත තමයි මේ පනත. එහෙම හදිසියේ හොරෙන් කඩිමුඩියේ සම්මත කරපු පනතකට තමුන්නාන්සේලා සහාය දීලා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඒක සම්පූර්ණ වෙනස් එකක්.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඒක නිසයි තමුන්නාන්සේලා අද දවසේ විරෝධය ආවේ. ඒ නිසා -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

රෑ අටට මේක අනුමත කළේ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

මේ මැතිවරණ ක්‍රමය තුළ ඇති වෙලා තිබෙන අයහපත් තත්ත්වය අද ඉතාම බරපතළ තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම මම අහන්න කැමැතියි, ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමන්ලාගෙන්. මේ පනත් පාර්ලිමේන්තුවේ සම්මත කරන කොට තමුන්නාන්සේලාගේ විපක්ෂයේ සංවිධායකතුමන්ලා ඒ දිනවල මහ ලොකුවට තමුන්නාන්සේලාටත් කිව්වා, මේ පළාත් සභා ඕනෑත් නැහැ. මේ පුංචි රටකට පාර්ලිමේන්තුව විතරක් තිබුණොත් ඇතියි කියලා. හැබැයි තමුන්නාන්සේලා සහාය දීලා, තමුන්නන්සේලාගේ එකඟත්වයෙන් සම්මත කරපු මේ පනත් හරහා ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී සංඛ්‍යාව 4486 ඉඳන් 8356 දක්වා වැඩි කළා. ඒකට විරුද්ධ වුණාද?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඉතින් ඔබතුමන්ලාගේ 51 දෙනා මොනවද කළේ? ඔබතුමන්ලාගේ 51 දෙනා පක්ෂව ඡන්දය දුන්නා නේ?

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

අපි හදපු මැතිවරණ ක්‍රමයේ මෙච්චර මන්ත්‍රී සංඛ්‍යාවක් වැඩි කරලා තිබුණේ නැහැ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

තමුන්නාන්සේලාගේ 51 දෙනා -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඕක බැසිල්ගේ. 5092 කොට්ඨාශ බැසිල්ගේ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

පාර්ලිමේන්තුවේ යටිකුට්ටු -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඕක බැසිල්ගේ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

පනත හරහා තමයි මෙච්චර මන්ත්‍රී ගණනක් වැඩි කළේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඕක බැසිල්ගේ. ඔබතුමන්ලා දන්නේ නැහැ. දන්නේ නැත්නම් අහගන්න. ඕක බැසිල්ගේ.

[සභාවේ ඝෝෂා]

බැසිල්ගේ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඕක බැසිල්ගේ. ඔයාලා දන්නේ නැහැ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

බිලියන 2.16 ක අමතර වියදමක් මේ මන්ත්‍රීවරුන්ට වැටුප් සහ දීමනා සඳහා ගෙවන්නට වෙනවා. ඒ නිසා අද රජය විශාල ආර්ථික අපහසුතාවයක ඉන්න වෙලාවක අමතර වියදමක් රුපියල් බිලියන 2.16 ක මුදලක් අමතරව වැටුප් සහ දීමනා සඳහා මේ වැඩි වුණු මන්ත්‍රීවරු සඳහා රජයට වැය කරන්න සිද්ධ වෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අර පසුගිය කාලයේ හොරා කාපු ටික ආපසු දෙන්න.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

පළාත් පාලන ආයතනවල -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

පසුගිය කාලයේ හොරා කාපු ටික ආපසු දුන්නා නම් හරි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon.  Presiding Member

මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා, ඔය මයික් එක ඕෆ් කරන්න.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

සියලුම පළාත් පාලන ආයතනවල අලුතෙන් සභා ශාලා හදන්න සිද්ධ වෙලා තිබෙනවා. විශාල අපහසුතාවයක්.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඉතින් බැසිල් රාජපක්ෂ මහත්මයා නේ ඒ වැඩේ කළේ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

මේ රටේ ජනතාව කාලෙක සිට කිව්වේ මේ පුංචි රටට -

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

බැසිල් මහත්තයාගේ කාලයේ නේ සීමා නිර්ණය ආවේ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

බැසිල් මහත්තයා හැදුවේ නැහැ, මෙච්චර ලොකු ගණනක්.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

බැසිල් මහත්තයාගේ සීමා නිර්ණය නේ මේ ආවේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මල්වානේ ගෙදර. මල්වානේ ගෙදර ගන්න.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

බැසිල් රාජපක්ෂලාව පරද්දලා ගෙදර යැව්වේ. තමුන්නාන්සේලා එහෙමනම් හරි දේ කරන්න. මේ ආණ්ඩුවත් එක්ක කඩේ ගිහිල්ලා තමුන්නාන්සේලාට අවශ්‍ය විධියට මේ පනත් සම්මත කරගෙන අද මේ අලකලංචිය රටට සිද්ධ වෙලා තිබෙනවා. ප්‍රාදේශීය සභා මැතිවරණයට ඉදිරිපත් වෙන්න තිබුණු සියයට ප්‍රතිශතයක් තමුන්නාන්සේලා ඉවත් කළා. මහ ලොකුවට තරුණයන් ගැන කථා කළේ. ඒවා ගැන දැන් කථා නැහැ. ඒක තමයි ඇත්ත. තමුන්නාන්සේලා නේ මහ ලොකුවට හැමදාම අපේ රටේ තරුණයන් ගැන කථා කළේ. තරුණයන්ට තිබුණු අවස්ථාව මේ පනත හරහා ඉවත් කළේ තමුන්නාන්සේලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පොහොට්ටු කට්ටිය ඒ වෙලාවේ කොහෙද සිටියේ?

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

පොහොට්ටු කට්ටිය සිටියා. ඇයි තමුන්නාන්සේලාගේ බලය. තමුන්නාන්සේලා ආණ්ඩුවට පන්දම් අල්ලන්නේ. අල්ලලා කරන්න එපැයි.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඒ කාලයේ කටේ පිට්ටුද?

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ගම හදන්න හම්බ වුණාද? ගම නොවෙයි. රටත් කනවා. රට කාලා ගම දෙයිද තමුන්නාන්සේලාට. ඒක තමයි ඔය ප්‍රතිඵලය අත්පත් කර දුන්නේ. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ මේ ඉදිරිපත් වුණු යෝජනාව ඉතාම කාලෝචිත වැදගත් යෝජනාවක්. සියයට පනහේ පනහ ප්‍රතිශතයන්ට මේ මැතිවරණ ක්‍රමය ගියොත් විශාල අර්බුදයකට මේ පළාත් සභාව ලක් වෙනවා. කිසිදු පළාත් සභාවක කිසිදු ස්ථිරසාර පාලනයක් පිහිටුවන්න බැරි බරපතළ අවදානමකට ලක් වෙනවා. ඒ නිසා අපි රජයට යෝජනා කරනවා. මේ ක්‍රමය නැවත, මේ ප්‍රාදේශීය සභා මැතිවරණ ක්‍රමය හරහා ඇති වුණු මේ බරපතළ තත්ත්වය පිළිබඳව සලකලා පළාත් සභා මැතිවරණ ක්‍රමය වඩා යාවත්කාලීන වන විධියට ගරු මන්ත්‍රීතුමා යෝජනා කරපු 70%, 30% ක්‍රමය හෝ එසේ නැතිනම් පෙර තිබුණු මැතිවරණ ක්‍රමයට හෝ මේ පළාත් සභා මැතිවරණ ක්‍රමය සංශෝධනය කරන්න කටයුතු කරන්නය කියන කාරණාව මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තුතියි. ඊළඟට මෙම යෝජනාවේ පිළිතුරු කථාව කිරීම සඳහා මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මම ස්තුතිවන්ත වෙනවා. මම ගොඩක් වෙලා කථා කරන්නේ නැහැ. මම ස්තුතිවන්ත වෙනවා මේ යෝජනාව ගෙනාපු වෙලාවේ අදහස් ප්‍රකාශ කරපු සියලු මන්ත්‍රීවරුන්ට. මේ යෝජනාවට විරුද්ධවත්, පක්ෂවත් අදහස් ගණනාවක් ප්‍රකාශ වුණා. ඒ සියලු දෙනාට මම ස්තුතිවන්ත වෙනවා. මම විශ්වාස කරනවා අපේ මහාචාර්ය සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාත්, මහාචාර්ය ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාත් කිව්වා, මේක මේ පළාත් සභාව ඇතුළේ ආපු වැදගත්කමක් නැතිම යෝජනාව කියලා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඕකට තමයි හීනමානය කියලා කියන්නේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

තව යෝජනා දෙකක් තිබෙනවා. ඉතින් ඒ යෝජනා දෙකටත් වැඩිය මේ යෝජනාව -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

හිතන් ඉන්නවා, මහාචාර්යවරයෙක් කියලා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මගේ මෝඩකම (බාධා කිරීමක්) මහචාර්යවරු ඉදිරියේ පිළිගන්නවා මේක. සමහරු කියනවා, සමහරු නීතිඥයෝ කියලා. අඩුම තරමේ ලංකාවේ පොලිස්පතිට තිබෙන නීති දැනුමවත් නැහැ. පොලිස්පති කිව්වා, නීතිය නමන්න පුළුවන් කියලා. අපි දැන ගන්න ඕනෑ. ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයටයි, ලංකාවේ විධායකටයි, ලංකාවේ ව්‍යවස්ථාදායකයටයි තුනටම බලය දීලා තිබෙන්නේ ලංකාවේ පරමාධිපත්‍ය මිනිස්සු.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒ කාලයේ රාජපක්ෂලත් නීතිය නැමුවේ. පාර්ලිමේන්තුවේත් නීතිය නැමුවේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඒ නිසා මිනිසුන්ගේ බලය තමයි මේ හැම ආයතනයකම පාවිච්චි කරන්නේ. ඒ නිසා ශ්‍රේෂ්ඨාධිකරණයේ තිබෙන්නේ, මහජන පරමාධිපත්‍යය. ඒකට අමුතු බලයක් දීලා නැහැ. මේ රටේ ඕනෑ නීතියක් වෙනස් කරන්න මේ රටේ මහජනතාවට පුළුවන්. ව්‍යවස්ථා වශයෙන්ම අයිතිය තිබෙනවා. ඒ නිසා අපි මේ යෝජනාව ගේන්නේ, මේ රටේ මහජනයා පත් වෙලා තිබෙන අපහසුතාවයක් නිසා. විශේෂයෙන් මේක කාලෝචිත වෙන්නේ මේ මැතිවරණ ප්‍රතිඵලය ඇවිල්ලා අද වන කොට ප්‍රශ්නකාරීව මේ බල ව්‍යුහයන් පිහිටුවන්න බැරිව තිබෙන අවස්ථාව නිසා අපි සියලු දෙනා දන්නවා, ඡන්දය තියලා හෙට වෙන කොට දවස් 10 ක් ගත වෙනවා. තවමත් මන්ත්‍රීවරු නම් කරගන්න බැහැ. ගැසට් එක තවම නැහැ. ඒ වාගේම තමයි පළාත් පාලන ආයතන ගණනාවක බලය ස්ථාපිත කරන්න පුළුවන්කමක් නැහැ. මේකේ අවසාන පාඩුව සිද්ධ වෙන්නේ මේ රටේ මහජනතාවට. ඒ නිසා අපි මෝඩ වුන් ගන්නේ නැහැ. මන්ත්‍රීවරු හාරසිය ගණනක් ආවාම සියල්ල හරි කියලා අපි විශ්වාස කරන්නේ නැහැ. අපටයි බලය ඇවිල්ලා තිබෙන්නේ. අපටයි පළාත් පාලන ආයතන 236 ක බලය තිබෙන්නේ. අපි ළඟ මන්ත්‍රීකම් හාරදහස් ගණනකට වැඩිය තිබෙනවා. නමුත් අපි විශ්වාස කරනවා, කොයිතරම් අපට මන්ත්‍රීවරු සිටියත්, කොයිතරම් පළාත් පාලන ආයතනවල බලය තිබුණත් මේවායෙන් නිසි ප්‍රයෝජනය මහජනතාවට දෙන්න බැරි නම්, ඒ නීතිය වෙනස් කරලා මහජනතාවට අවශ්‍ය කාරණාව කරන්න පුළුවන් බලය නිර්මාණය වෙන්න ඕනෑය කියලා. ඒ නිසයි මේ යෝජනාව ගෙනාවේ. මේක පළාත් සභාවල පනහයි පනහ වුණොත් කවදාවක්වත් පළාත් සභාවක බලය පිහිටුවලා වැඩ කරන්න පුළුවන්කම ලැබෙන්නේ නැහැ. ඒ නිසා අමාරුවේ වැටෙන්නේ, අසාධාරණය වෙන්නේ මේ රටේ ජනතාවට. ඒ ජනතාවගේ පැත්තෙන් කල්පනා කරලා තමයි මේ යෝජනාව ගෙනාවේ. ඒ නිසා අපි නැවතත් කියනවා. හැත්තෑවයි තිහටවත් අඩුම තරමෙන් ගෙනැල්ලා මේ සභාවල් පිහිටුවන්න පුළුවන්, බලය පිහිටුවන්න පුළුවන් තැනට මැතිවරණ ක්‍රමය සංශෝධනය කරන්නය කියලා. ඒකට කථිකාවතක් හදන්න පුළුවන්. ඒකට මේ යෝජනාව ඉස්සරහාට ගෙනියන්න පුළුවන්. ඒක සාකච්ඡාවට ගන්න පුළුවන්. ඊයේ කථානායකතුමා කිව්වා, මේ පළාත් පාලන ආයතන පිහිටුවීමේ තිබෙන ප්‍රශ්න ගැටලු පිළිබඳ සංශෝධන සියල්ල ඉදිරිපත් කරන්නය කියලා. ඒ නිසා එහෙම සංශෝධන ඉදිරිපත් කරන්න පුළුවන්. මේක තේරෙන මිනිස්සුන්ට තේරෙනවා. අද මේ සභාවට ඉතාම බොරු කියනවා. අපි පඩි ගන්නේ නැතිව වැඩ කරනවා කියලා. අපි අහනවා, පඩිය ගන්නේ නැත්නම් අපිට කියන්න භාණ්ඩාගාරයට ආපසු හරෝලා යැව්වාද කියලා. නැහැ. සියලු සල්ලි පක්ෂයට ගන්නවා. සියලු සල්ලි පක්ෂයට ගන්නවා. අපේ අතට ගන්නේ නැහැයි කියලා පක්ෂයට සල්ලි ගන්නවා. මෙතුමන්ලාට පක්ෂයෙන් ගෙවන්නේ නැද්ද කියලා අහන්න. මේ අයට ගෙවනවා.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

අගේට ගෙවනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

එහෙම ගෙවන්නේ නැති අය නොවෙයි මේ ඉන්නේ. ඒ නිසා අපි දන්නවා. මේ ගුරු ගෙදර කරපුවත් අපි දන්නවා.

[ගරු මහේෂ් අල්මේදා ]

පක්ෂය කරන ඒවාත් අපි දන්නවා. හැබැයි අපි කියනවා. මහජනතාවට මේ මෝඩ වුන් අරගෙන හානි කරන්න එපා. මහජනතාවට බලය භුක්ති විඳින්න, බලයෙන් ගන්න පුළුවන් ප්‍රයෝජනය පොළවට ගන්න යම් සංශෝධන තිබෙනවා නම්, ප්‍රායෝගිකව අත් දැක්කා නම්, ඒ අත්දැකපු වෙලාවේ ඒක වෙනස් කරන්න සහයෝගය දෙන්නය කියලා ඉල්ලීම කරමින්, මේ යෝජනාව ආණ්ඩුවට යවලා, මේක යථාර්ථයක් කරලා මේ පළාත් සභා දියාරු වෙන්නේ නැතිව බලය ස්ථාපිත කරන්න අවශ්‍යා පරිසරය නිර්මාණය කරන්න යෝජනාව සම්මත කරන්නය කියන කාරණාව කියමින් ඔබතුමාට ස්තූතිවන්ත වෙමින්, කථා කරපු සියලු දෙනාට ස්තූතිවන්ත වෙමින් නිහඬ වෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

එම යෝජනාවට සභාවේ එකඟත්වය.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මේ යෝජනාවේ තිබෙන වැරැදි භාවය නිසා අපේ විරෝධතාවය ප්‍රකාශ කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

එහෙමනම් සීනුව නාද කරන්න.

සීනුව නැවත වරක් නාද කරන්න.

සභාව විනාඩි පහකට කල් තියනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මේ පනතත් සම්මත කළේ ඔහොමයි. ඊ අට වෙනකන් තියා ගත්තා කරූ ජයසූරිය මහත්තයා. ඔයාලගේ කට්ටිය එනකන්. ආණ්ඩුවේ මන්ත්‍රීවරු එනකන්. එහෙම්ම කරන්නේ. එහෙමම කරන්නේ. පේන්න.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඔබතුමාගේ කීර්ති නාමයට හොඳ නැහැ, මේ කරපු වැඩේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

සභාවේ ගණපූරණය නැති නිසා සභාව විනාඩි පහකට කල් තියන්න වෙනවා. ඡන්දයකට යන්න බැරි නිසා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

මේ කරපු වැඩේ ඔබතුමාගේ කීර්ති නාමයට කැළලක් මේ කර ගත්තේ. ඔබතුමා අපක්ෂපාතී වෙන්න ඕනෑ, පුටුවේ ඉන්න කොට. පුටුවේ ඉඳන් තමුන්නාන්සේගේ ගෲප් එකේ කට්ටිය අඩුයි කියලා ඡන්දය ඔය විධියට කරන්න බැහැ. ඡන්දය විමසන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඡන්දය ගන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගන්න ගන්න. ඔන්න ඔහේ. ගමු. ගමු.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

පැහැදිලිවම 12 රීතියේ පෙන්නලා දෙනවා, සභාවේ ගණපූරණය නැතිව වලංගු සභාවක් බවට පත් නොවන බව. ඒ අනුව ඡන්දයකට ගියොත් ඒ යෝජනාව සභාවේ සම්මත වුණා සේ සැලකෙන්නේ නැහැ. පැහැදිලිව පෙන්නලා දීලා තිබෙනවා. ඒ නිසා මේ රීති අත්හිටුවලා නැති නිසා ගණපූරණය සම්පූර්ණ වුණාට පස්සේ තමයි සභාවේ ඡන්දය විමසන්න ඕනෑ.

# 12 (1) රීතිය යටතේ කල් තැබීම
ADJOURNMENT UNDER RULE NO. 12(1)

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

*"දැන් මම මෙම සභාව 12 (1) රීතිය යටතේ කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 01.51 ට, 2018 මාර්තු මස 06 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***
*Sitting, accordingly adjourned at 01.51 p.m till 9.30 a.m. on 06.03.2018*